# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# இலங்கை வயம்ப பல்கலைக்கழகம்

# WAYAMBA UNIVERSITY OF SRI LANKA

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

## ஆண்டறிக்கையும் கணக்கும்

## ANNUAL REPORT & ACCOUNTS

**2023**

# දැක්ම

මානව වර්ගයාට සේවය කිරීමේ  පරම

 චේතනාව සාක්ෂාත් කර ගැනීමේ අරමුණ

පෙරදැරි කරගනිමින් අප ආයතනය  මගින්

පිරිනමනු ලබන සුවිශේෂී අධ්‍යයන පාඨමාලා,

නවොත්පාදන පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ ව්‍යාප්තිය සඳහා

ශ්‍රී ලංකාවේ පිළිගත්  ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් වීම

# මෙහෙවර

සමාජයේ දියුණුව සහ රටේ

තිරසාර සංවර්ධනය උදෙසා

දායකත්වය ලබා දෙන

විශිෂ්ට සුදුසුකම් ලත්,

වගකීමෙන් යුතු

පුරවැසියන් බිහි කිරීම

# උප කුලපතිවරයාගේ සමාලෝචනය

## කෙටි සමාලෝචනය

2023 වසර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයට (WUSL) සැලකිය යුතු වසරක් ලෙස සැලකිය හැකි බව පෙන්වා දෙන්නේ එහි ආයතනික/උපායමාර්ගික සැලැස්ම යටතේ සැලසුම් කරන ලද සංවර්ධන කටයුතුවලින් අතිමහත් බහුතරයක් රට මුහුණ දෙමින් පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මතුවන දැඩි මූල්‍ය සහ වෙනත් අර්බුධකාරී තත්වයන් යටතේ වුවද සාර්ථක කර ගත හැකි වූ බැවිනි. සෑම පීඨයකටම සහ ඒ ආශ්‍රිත සෑම ඒකකයටම අදාළ ක්‍රියාකාරී සැලසුම් යටතේ සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් සියලුම පාර්ශ්වකරුවන්ගේ, එනම් අධ්‍යයන හා පරිපාලන මෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය ඇතිව සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සිය 18 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2023 අගෝස්තු 09 සහ 10 යන දිනවල දී කුලියාපිටිය පරිශ්‍රයේ පිහිටි පණ්ඩිත් අමරදේව ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. එහිදී පීඨ 05ක් නියෝජනය කරමින් උපාධි අපේක්ෂකයින් 1,327 දෙනෙකුට සහ පශ්චාත් උපාධිලාභීන් 122 දෙනෙකුට උපාධි පිරිනමන ලදී.
- තාක්ෂණ පීඨයේ (FoT) දෙවන කණ්ඩායම සඳහා මෙම වර්ෂය තුල උපාධි පිරිනමන ලදී.
- වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය (WUTDP) යටතේ කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍ර දෙකෙහි පූර්වයෙන් සැලසුම් කරන ලද සියලු කටයුතු මෙම වසර තුළ සාක්ෂාත් කර ගැනීමට හැකි විය.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික සභාවේ වැඩසටහන් සමාලෝචනයේදී ව්‍යවහාරික විද්‍යා පීඨයට “A” ශ්‍රේණිය හිමි විය.
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සහ රුසියාවේ කර්ස්ක් ප්‍රාන්ත ගොවිජන විශ්ව විද්‍යාලය අතර උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහ පර්යේෂණ ක්ෂේත්‍රයේ අධ්‍යයන හා විද්‍යාත්මක සහයෝගීතාව, දැනුම සහ ප්‍රවීණතා හුවමාරුව ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය 2023 ජූනි 22 වැනි දින රුසියාවේ කර්ස්ක් ප්‍රාන්ත ගොවිජන විශ්වවිද්‍යාලයේ ෆෙඩරල් රාජ්‍ය අරමුදල් සහිත උසස් අධ්‍යාපන ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය.
- කාර්මික කළමනාකරණ අධ්‍යයනාංශයේ ආචාර්ය අසංකා පල්ලේගෙදර සහ මහාචාර්ය රංගා ප්‍රබෝධිනී 2020 වර්ෂය සඳහා විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන දිනාගෙන ඇත. මෙම සම්මාන ප්‍රදානෝත්සවය 2023 නොවැම්බර් 21 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්විණි.
- 14 වන ව්‍යවහාරික විද්‍යා, ව්‍යාපාර සහ කාර්මික පර්යේෂණ සම්මන්ත්‍රණය 2023 මාර්තු 24 වන දින පැවැත්විණි.
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකාර්මික හා වැවිලි කළමනාකරණ පීඨයේ ජෛව පද්ධති ඉංජිනේරු සිසුන් (BSE) ඔවුන්ගේ නව නිපැයුම් සහ ඔවුන් විසින් සාදන ලද නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම සඳහා “B-TEx 223” තාක්‍ෂණික ප්‍රදර්ශනයක් 2023 පෙබරවාරි 17 වන දින මක්඾ුර, ගෝනවිල පීඨ පරිශ්‍රයේදී සංවිධානය කර තිබුණි.
- 08 වැනි “වයඹ විශ්වවිද්‍යාල පර්යේෂණ සම්මේලනය” 2023 ඔක්තෝබර් 20 වැනි දින ““Navigating in the Future: Unveiling Tomorrow's Trends and Insights Through Innovative Research”” යන තේමාව යටතේ පැවැත්විණි.

**ඉදිරි සැලසුම්**

(1) විශ්වවිද්‍යාලය විසින් උපාධි අධ්‍යයන පීඨයක් පිහිටුවීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරමින් සිටී.

(2) අනෙකුත් ආයතන සම්බන්ධ කර ගනිමින් අලුතින් සංවර්ධනය කරන ලද WUTDP පහසුකම් සම්පූර්ණයෙන්ම උපයෝගී කර ගැනීමට වයඹ විශ්ව විද්‍යාලය විසින් (WUSL) සැලසුම් කර ඇත.

(3) සහතිකපත්‍ර පාඨමාලාවල සිට උපාධි පාඨමාලා දක්වා දිවෙන විවිධ පාඨමාලා හරහා අනාගත සිසුන්ට අධ්‍යයන අවස්ථා සඳහා වැඩි වැඩියෙන් විවෘත කිරීම සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය (WUSL) සැලසුම් කරයි.

(4) ඉදිරියේ දී විශ්වවිද්‍යාලය පුළුල් කිරීමේ අරමුණින් ගනිමින් විශ්වවිද්‍යාලය ආසන්නයේ තිබෙන ඉඩම් අත්පත් කර ගැනීම කඩිනමින් සිදු කිරීම සඳහා සැලසුම් කර ඇත.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ

උප කුලපති

# පටුන


දැක්ම........................................................................................................ i

මෙහෙවර ..................................................................................................... i

උපකුලපතිවරයාගේ සමාලෝචනය..................................................................... ii

**1.** හැඳින්වීම - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය.................................................... 1

**2.** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ඉලක්ක ........................................................ 2

**3.** විශ්වවිද්‍යාලයේ හර පද්ධතිය ..................................................................... 3

**4.** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය ............................................. 4

**5.** පාලක සභා සමාජිකයන් - 2023 ................................................................. 5

**6.** විශ්වවිද්‍යාලයේ නිලධාරීන් - 2023 .............................................................. 6

**7.** පීඨ සහ අධ්‍යයන අංශ ............................................................................ 7

**8.** පීඨ මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා .................................................. 8

**9.** විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා ............................. 8

**10.** විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන බාහිර උපාධි පාඨමාලා .............................. 9

**11.** දේශීය සිසුන් පිළිබඳ තොරතුරු - 2023 ....................................................... 10

**12.** මානව සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු - 2023....................................... 11

**13.** බාහිර ප්‍රථම උපාධි අපේක්ෂකයින් පිළිබඳ තොරතුරු - 2023 ................................ 12

**14.** පශ්චාත් උපාධි හදාරන සිසුන් පිළිබඳ තොරතුරු - 2023 ...................................... 13

**15.** 2015 - 2022 අතර කාල සීමාව තුල බිහි කරන ලද උපාධිධාරීන් පිළිබඳ තොරතුරු ............. 14

**16.** 2013-2022 දක්වා අතර කාල සීමාව තුල බිහි කරන ලද පශ්චාත් උපාධිධාරීන් පිළිබඳ තොරතුරු ........... 15

**17.** විදේශ සිසුන් පිළිබඳ තොරතුරු - 2023 ....................................................... 16

**18.** අළුතින් ආරම්භ කරන ලද පාඨමාලා පිළිබඳ තොරතුරු - 2023 ................................ 16

**19.** ශිෂ්‍ය කටයුතු

**19.1** උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම්-2023 ................................ 18

**19.2** ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2023 ........................................ 20

**20.** මානව සම්පත්

**20.1** 2023.12.31 දිනට විශ්වවිද්‍යාලයේ සේවක තොරතුරු ........................................ 22

**20.2** 2023.12.31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු ................. 26

**20.3** 2023.12.31 දිනට අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල තොරතුරු ............................. 28

**20.4** 2023.12.31 දිනට අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු ...................................... 28

**21.** විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම

**21.1** ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගතකිරීම් ................................................................ 33

**22.** පර්යේෂණ සහ සංවර්ධන

**22.1** පර්යේෂණ නිමැවුම් පිළිබඳ තොරතුරු-2023 ...................................................... 35

**22.2** ලබා ගත් පේටන්ට් බලපත්‍ර පිළිබඳ තොරතුරු ...................................................... 35

**22.3** විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුම්-2023 ...................................................... 36

**22.4** සාමාන්‍ය ජනතාවට දැනුම ලබා දීම පිළිබඳ තොරතුරු-2023 ................................ 37

**23.** වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන

**23.1** පුස්තකාලය ...................................................................................................... 40

**23.2** ශාරීරික අධ්‍යාපන ඒකකය .................................................................................. 46

**23.3** වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය ........................................................................ 54

**23.4** තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය ................... 64

**23.5** තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය ......................... 67

**23.6** කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය ............................................................... 69

**23.7** වෛද්‍ය මධ්‍යස්ථානය ........................................................................................ 70

**24.**

**24.1** පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු ............................................................... 72

**24.2** ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු ..................................................................... 72

**24.3** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්) ............................................................ 72

**24.4** මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (ඉපැයූ ආදායම) .................................................. 72

**24.5** මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2023 ............................................................... 73

**24.6** පීඨය මගින් එක් සිසුවකු සඳහා වැය කරන පිරිවැය - 2019-2023 .......................... 73

**24.7** 2023.12.31 දිනට දැනට සිදු කරමින් තිබෙන ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ තොරතුරු .. 74

**24.8** 2023.12.31 දිනට පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා වැය වූ වියදම ............................ 74

# 1. හැඳින්වීම – ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය



ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය 1991 වර්ෂයේ දී වයඹ පළාතේ අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතනය ලෙස ගෘහ විද්‍යාව සහ පෝෂණය සහ කෘෂි විද්‍යාව යන අධ්‍යයන ක්ෂේත්‍ර දෙක සමගින් ආරම්භ කරන ලදි. මෙම අංශ පිළිවෙලින් කැලණිය විශ්වවිද්‍යාලයට සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව පැවතුණි. අනතුරුව, 1996 වර්ෂයේ දී කෘෂිකාර්මික විද්‍යා පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය යනුවෙන් පීඨ දෙකක් ආරම්භ කරමින් එය ශ්‍රී ලංකා රටජට විශ්ව විද්‍යාලයේ වයඹ මණ්ඩපය බවට පත් කෙරුණි.

ඉන් අනතුරුව ව්‍යවහාරික විද්‍යා, ව්‍යාපාර අධ්‍යයනය සහ මූල්‍ය, කෘෂිකාර්මික සහ වැවිලි කළමනාකරණය සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ ආදී අධ්‍යයන අංශ යටතේ සිසුන්ට උසස් අධ්‍යාපනය ලබා දීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම අරමුණුකොට ගෙන 1999 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ස්ථාපිත කරන ලදී. ඒ අනුව, 1999 අගෝස්තු මස 17 වැනි අඟහරුවාදා නිකුත් කරන ලද අංක 1093/8 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනය මගින් පීඨ හතරක් සහ අධ්‍යයන අංශ 16ක් වයඹ විශ්වවිද්‍යාලය යටතට පවරන ලදි.

ජෛව පද්ධති තාක්ෂණ උපාධිය (BBST) නමින් නව උපාධි වැඩසටහනක් පිරිනැමීම සඳහා කෘෂිකාර්මික හා වැවිලි කළමනාකරණ පීඨයේ ජෛව පද්ධති ඉංජිනේරු අංශය නමින් නව අංශයක් 2016 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර 2016 වර්ෂයේදී ව්‍යාහාරික විද්‍යා පීඨයෙහි ඉංජිනේරු තාක්ෂණය සහ නැනෝ විද්‍යා තාක්ෂණය නමින් නව අංශ දෙකක් ස්ථාපිත කර ඇත. ඉන් අනතුරුව 2016 පෙබරවාරි 19 දින නිකුත් කරන ලද අංක 1954/43 සහ 2017 සැප්තැම්බර් 21 දින නිකුත් කරන ලද අංක 2037/17 දරන රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර දෙකකින් අංශ 15 කින් යුත් වෛද්‍ය පීඨය සහ අංශ 04 කින් යුත් තාක්ෂණ පීඨය යන පීඨ දෙක ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයෙහි ස්ථාපිත කර ඇත. මේ වන විට ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය අධ්‍යයන පීඨ 06 කින් සහ අධ්‍යයන අංශ 37 කින් සමන්විතය.

## 2. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ඉලක්ක

**1.** උපාධි හා පශ්චාත් උපාධි මට්ටමින් මෙන්ම වෘත්තීය මට්ටමින් ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ගුණාත්මකව වැඩි දියුණු කළ සහ පිළිගත් අධ්‍යාපනයක් ලබා දීම.

**2.** ශිෂ්‍ය ප්‍රවේශය වැඩි කිරීම තුළින් උසස් අධ්‍යාපනය සඳහා වැඩිවන ඉල්ලුම සපුරාලීම.

**3.** පාර්ශවකරුවන්ගේ නීත්‍යානුකූල අපේක්ෂාවන් සපුරාලීම සඳහා උසස් සේවා නියුක්ති ශක්‍යතාවයෙන් යුතු ව්‍යවසායකත්ව උපාධිධාරීන් බිහිකිරීම.

**4.** පර්යේෂණ**,** නවෝත්පාදන**,** ශිෂ්‍යත්ව සහ ව්‍යාප්ත කිරීම/ වාණිජකරණය සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීම.

**5.** මානව වර්ගයාට සේවය කරන කැපවීමෙන් කටයුතු කරන විශ්වවිද්‍යාල ප්‍රජාවක් බිහි කිරීම.

## 3. විශ්වවිද්‍යාලයේ හර පද්ධතිය

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුරා හුවමාරු වන මූලික/හර වටිනාකම් ආරක්ෂා කර ගැනීම සඳහා අපි ඇප කැප වී කටයුතු කරන්නෙමු. විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ප්‍රජාව අපගේ වටිනාකම්වලින් සංලක්ෂිත වේ. ඔවුන් විශ්වවිද්‍යාලය ප්‍රජාව තුලින් විද්‍යාමාන විය යුතු වැදගත්ම ගුණාංගවලින් සමන්විත ආදර්ශමත් පිරිසක් වන අතර අපගේ ඉගැන්වීම් සහ ඉගෙනුම් පරිසරය පෝෂණය කිරීම සඳහා අප අනුගමනය කරනු ලබන සෑම ක්‍රියාමාර්ගයක් සඳහාම දායකත්වය ලබා දේ. අවබෝධය සහ ඇගයීම සඳහා පමණක් නොව එම වටිනාකම්වලට අනුකූලව එදිනෙදා ජීවත් වීම සඳහා ද අපි විශ්වවිද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයින් දිරිමත් කරන්නෙමු.

**මූලික අරමුණ**

යහපත් අනාගතයක් උදෙසා සමාජය පරිවර්තනය කිරීම.

**අධ්‍යයන විශිෂ්ටත්වය සහ තිරසාරබව**

ඉගැන්වීමේ සහ ඉගෙනීමේ කටයුතු, පර්යේෂණ කටයුතු සහ ඒවා අදාළ කර ගැනීමේ දී සහ අපගේ ප්‍රජාව සමඟ කටයුතු කිරීමේදී අපගේ ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය උසස්ම ප්‍රමිතීන්, ආචාර ධර්ම සහ වෘත්තීයභාවය, ශාස්ත්‍රීය බව, විශිෂ්ටත්වය සහ අදාළත්වය ආරක්ෂා කරගනිමින් බුද්ධිමය ගවේෂණය ප්‍රවර්ධනය කර තිරසාරව පවත්වා ගැනීම සඳහා කටයුතු කරයි.

**නවෝත්පාදනය සහ ව්‍යවසාය**

අපගේ දේශීය, ජාතික සහ ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් - සිසුන්, ආදි සිසුන්, කාර්ය මණ්ඩලය, හවුල්කරුවන්, වෘත්තීන්, රජය, කර්මාන්තායතන, අධ්‍යයන කටයුතුවල නිරතවන සම වයස්කරුවන් සහ ප්‍රජා කණ්ඩායම් පර්යේෂණ මගින් ගැටළු සඳහා දැනුම සහ සාක්ෂි පදනම් කරගත් විසඳුම් සෙවීම සඳහා ඇප කැපවී කටයුතු කරන අතර මෙරට තුළ සහ ඉන් ඔබ්බට ධනාත්මක වෙනසක් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය උත්ප්‍රේරකයක් ලෙස නිර්මාණශීලීව සහ ක්‍රියාශීලීව කටයුතු කරයි.

**සදාචාරාත්මක ප්‍රමිතීන්**

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සිය සියලු ක්‍රියාකාරකම්වලදී උසස් සදාචාරාත්මක ප්‍රමිතීන් තිරසාරව පවත්වා ගනිමින් කටයුතු කරන අතර සෑම ක්ෂේත්‍රයක් තුලම විවෘතභාවය, අවංකභාවය, ඉවසීම, සාධාරණත්වය සහ වගකීම යන වටිනාකම් ප්‍රවර්ධනය කරනු ඇත.

**සමාජ වගකීම හා වගවීම**

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය එහි ඉගැන්වීම් හා පර්යේෂණ කටයුතු ඵලදායි ලෙස පවත්වාගෙන යාම සඳහා එහි සිසුන්ට, කාර්ය මණ්ඩලයට සහ සාමාන්‍ය ජනතාවට වගකියනු ලැබේ. එමෙන්ම තමන් සතු සම්පත් කාර්යක්ෂමව හා නිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් විනිවිදභාවය ආරක්ෂා කරනු ලබන අතර පරිසරය ආරක්ෂා කිරීමේ වගකීමෙන් ද බැඳී සිටී.

## 4. ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයේ සංවිධානාත්මක ව්‍යූහය



# 5. පාලක සභා සාමාජිකයන් – 2023 (2023.12.31 දිනට)

**උප කුලපතිවරයා**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.එම්.යූ.කේ. ජයසිංහ

**පීඨාධිපතිවරුන්**

| | |
|---|---|
| මහාචාර්ය ජේ.සී. එදිරිසිංහ | පීඨාධිපති, කෘෂිකාර්මික හා වැවිලි කළමනාකරණ පීඨය |
| මහාචාර්ය එල්.ඩී.ආර්.ඩී. පෙරේරා | පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය |
| මහාචාර්ය එස්.කේ. ගමගේ | පීඨාධිපති, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය |
| මහාචාර්ය සී.වී.එල්. ජයසිංහ මිය | පීඨාධිපති, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය |
| ආචාර්ය පී.ජී.සී.එස්. බෝවත්ත | පීඨාධිපති, වෛද්‍ය පීඨය |
| ආචාර්ය ඒ.එම්.එන්. අලගියවන්න | පීඨාධිපති, තාක්ෂණ පීඨය |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත් කරන ලද සාමාජිකයන්**

උපේන්ද්‍ර විජේසිංහ මහතා

ආචාර්ය ආර්. ප්‍රමිතා ශාන්තිලතා

පී.ඒ.එස්.එම්. මාරසිංහ මිය

චන්දන ප්‍රසාද් යාපා මහතා

ටී. කරුණාසේන මහතා

පී.බී.එම්. සිරිසේන මහතා

ඊ. විජේපාල මහතා

ජේ.එම්. ගුණතිලක මහතා

සුපුන් අදිකාරි මහතා

රාජන් ආසිරිවාදන් මහතා

**සෙනෙට් නාම යෝජනා**

මහාචාර්ය එච්.එම්.එල්.කේ. හේරත්

ආචාර්ය කේ.එම්. චන්දිමාල්

**ලේඛකාධිකාරී (ලේකම්)**

ඩබ්.ඒ. දොන් චිත්‍රානන්ද මහතා

## 6. විශ්වවිද්‍යාලයීය නිලධාරීන්– 2023

| | |
|---|---|
| **කුලපතිවරයා** | මහාචාර්ය ටියුලි ද සිල්වා (2023.08.08 දක්වා) |
| | ආචාර්ය පී.ඒ. කිරිවන්දෙණිය, 2023.08.09 සිට |
| **උප කුලපතිවරයා** | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.එම්.යූ.කේ. ජයසිංහ |

**පීඨාධිපතිවරුන්**

| | |
|---|---|
| පීඨාධිපති, කෘෂිකාර්මික හා වැවිලි කළමනාකරණ පීඨය | මහාචාර්ය ජේ.සී. එදිරිසිංහ |
| පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය | මහාචාර්ය එල්.ඩී.ආර්.ඩී. පෙරේරා |
| පීඨාධිපති, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | මහාචාර්ය එස්.කේ. ගමගේ |
| පීඨාධිපති, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | මහාචාර්ය සී.වී.එල්. ජයසිංහ මිය |
| පීඨාධිපති, වෛද්‍ය පීඨය | පී.ජී.සී.එස්. බෝවත්ත |
| පීඨාධිපති, තාක්ෂණ පීඨය | ආචාර්ය ඒ.එම්.එන්. අලගියවන්න |

| | |
|---|---|
| ලේඛකාධිකාරී | ඩබ්.ඒ. දොන් චිත්‍රානන්ද මහතා |
| වැඩබලන පුස්තකාලයාධිපති | ඩබ්.එම්. තුසිතා කුමාරි මිය |
| මූල්‍යාධිකාරී | ඩී.ඒ.යූ. ධර්මදාස |

## 7. පීඨ සහ අධ්‍යයනාංශ

### 7.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

- කෘෂිව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
- ජීව තාක්ෂණ අධ්‍යයනාංශය
- ජෛව පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය
- උද්‍යානවිද්‍යා හා දර්ශනීය භූමි අලංකරණ අධ්‍යයනාංශය
- වැවිලි කළමනාකරණ අධ්‍යයනාංශය

### 7.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

- පරිගණක හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය
- ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයනාංශය
- කර්මාන්ත කළමනාකරණ අධ්‍යයනාංශය
- ගණිතමයවිද්‍යා අධ්‍යයනාංශය

### 7.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

- ගණකාධිකරණ අධ්‍යයනාංශය
- බැංකු හා මූල්‍ය අධ්‍යයනාංශය
- ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය
- රක්ෂණ හා තක්සේරුකරණ අධ්‍යයනාංශය
- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය

### 7.4 පශු සම්පත් , ධීවර හා පෝෂණ පීඨය

- ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශය
- ජල ජීවී වගා හා මත්ස්‍ය අධ්‍යයනාංශය
- ආහාරවිද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය
- පශුසම්පත් හා පක්ෂිවිද්‍යා අධ්‍යයනාංශය

### 7.5 තාක්ෂණ පීඨය

- යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනාංශය
- විද්‍යුත් තාක්ෂණ අධ්‍යයනාංශය
- ඉදිකිරීම තාක්ෂණ අධ්‍යයනාංශය
- නැනෝ තාක්ෂණ අධ්‍යයනාංශය

### 7.6 වෛද්‍ය පීඨය

- කාය ව්‍යවච්ඡේද අධ්‍යයනාංශය
- භෞතවේද අධ්‍යයනාංශය
- ජෛව රසායනවිද්‍යා අධ්‍යයනාංශය
- ශල්‍යවෛද්‍යවේදී අධ්‍යයනාංශය
- නාරි හා ප්‍රසව අධ්‍යයනාංශය
- ළමා රෝග අධ්‍යයනාංශය
- මනෝ වෛද්‍යවිද්‍යා අධ්‍යයනාංශය
- ප්‍රජා හා පවුල් වෛද්‍යවිද්‍යා අධ්‍යයනාංශය
- වෛද්‍යවිද්‍යා අධ්‍යයනාංශය
- ව්‍යාධවේදී අධ්‍යයනාංශය
- භිෂග්වේදවිද්‍යා අධ්‍යයනාංශය
- ක්ෂුද්‍රජීවවිද්‍යා අධ්‍යයනාංශය
- අධිකරණ වෛද්‍යවිද්‍යා අධ්‍යයනාංශය
- පරපෝෂිතවේදී අධ්‍යයනාංශය
- වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය

## 8. පීඨය මගින් පිරිනමනු ලබන උපාධි පාඨමාලා

| පීඨය | උපාධි පාඨමාලා |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය |
| | ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ උපාධිය |
| ව්‍යවහාරික විද්‍යාව | සාමාන්‍ය විද්‍යාවේදී උපාධිය |
| | විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන) |
| | කාර්මික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය |
| | ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යා විද්‍යාවේදී (විශේෂ) උපාධිය |
| | ගණිතය හා සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය |
| | පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය |
| තාක්ෂණය | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය |
| | විද්‍යුත් තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය |
| | යාන්ත්‍රික විද්‍යාව සහ නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය |
| | නැනෝ විද්‍යා තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය |
| | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය |
| | ගිණුම්කරණය සහ මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය |
| | රක්ෂණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය |
| පශු සම්පත්, ධීවර හා පෝෂණය | ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳව විද්‍යාවේදී උපාධිය |
| | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේ දී උපාධිය |
| වෛද්‍ය විද්‍යාව | වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිය (එම්.බී.බී.එස්) |

## 9. විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා

| පීඨය | පශ්චාත් උපාධිය |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | කෘෂි ව්‍යවසාය සහ තාක්ෂණ කළමනාකරණය පිළිබඳ පශ්චාත්උපාධිය |
| ව්‍යාපාර අධ්‍යයනය හා මූල්‍ය | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව |
| | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය |
| පශු සම්පත්, ධීවර සහ පෝෂණ | ආහාර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය |
| | ආහාර විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය |
| | ගෝලීය මහජන සෞඛ්‍ය පෝෂණය පිළිබඳ පශ්චාත් උපාධිය |
| | ගෝලීය මහජන සෞඛ්‍ය පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය |
| | මානව පෝෂණය පිළිබඳ පශ්චාත් උපාධිය |
| | මානව පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය |

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල අධීක්ෂණය යටතේ පශ්චාත් උපාධි පර්යේෂණ අවසන් කිරීම පිළිබඳ සෙනෙට් පර්යේෂණ සහ උසස් උපාධි කමිටුවේ නිර්දේශය මත ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය විසින් දර්ශනපති (M.Phil.) සහ ආචාර්ය උපාධි පිරිනමනු ලැබේ.

## 10. විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන බාහිර පාඨමාලා

| පීඨය/ඒකකය/මධ්‍යස්ථානය | පාඨමාලාව |
|---|---|
| කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරන පීඨය | වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය |
| | ශාක පටක රෝපණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව |
| | ආහාර ව්‍යාපාර හා අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව |
| | කෘෂිකර්මාන්තය සහ වැවිලි කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව |
| | නූතන කෘෂි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව |
| | මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව |
| ව්‍යාපාර අධ්‍යයන සහ මූල්‍ය පීඨය | ගිණුම්කරණ තොරතුරු පද්ධති පිළිබඳ උසස් ඩිප්ලෝමාව |
| | අවදානම් කළමනාකරණය සහ රක්ෂණය පිළිබබඳ උසස් ඩිප්ලෝමාව |
| | ගිණුම්කරණය තොරතුරු පද්ධති පිළිබඳ ඩිප්ලෝමාව |
| | බැංකුකරණය සහ මූල්‍ය අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමාව |
| | අවදානම් කළමනාකරණය සහ රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව |
| | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව |
| | පෞද්ගලික මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව |
| | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව |
| පශු සම්පත්, ධීවර හා පෝෂණය පිළිබඳ පීඨය | ආහාරවල ගුණාත්මකබව කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය |
| | සත්ත්ව පාලනය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව |
| තාක්ෂණය | ඉදිකිරීම් කම්කරු ඵලදායීතාව සහ කාර්ය සාධනය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය | තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය | තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව |
| | පරිගණක යෙදුම් හා කුසලතා පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව |
| කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව |
| | ඉගැන්වීමේ ක්‍රමවේදය සහ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව |
| | කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව |

## 11. දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු– 2023

| පීඨය | අධ්‍යයන පාඨමාලාව | අධ්‍යයන වර්ෂය | බඳවා ගත් වර්ෂය | ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | | | | පුරුෂ | ස්ත්‍රී | මුලු ගණන |
| ව්‍යවහාරික විද්‍යාව | සාමාන්‍ය/බද්ධ ප්‍රධාන/විශේෂ) විද්‍යාවේදී උපාධි පාඨමාලා | 1 වැනි වසර | 2021/2022 | 65 | 106 | 171 |
| | | 2 වැනි වසර | 2020/2021 | 75 | 87 | 162 |
| | | 3 වැනි වසර | 2019/2020 | 57 | 102 | 159 |
| | | 4 වැනි වසර | 2018/2019 | 23 | 76 | 99 |
| | මුලු ගණන | | | **220** | **371** | **591** |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණය | (කෘෂිවිද්‍යා) විද්‍යාවේදී උපාධිය | 1 වැනි වසර | 2021/2022 | 29 | 162 | 191 |
| | | 2 වැනි වසර | 2020/2021 | 42 | 150 | 192 |
| | | 3 වැනි වසර | 2019/2020 | 34 | 128 | 162 |
| | | 4 වැනි වසර | 2018/2019 | 26 | 116 | 142 |
| | ජෛව පද්ධති හා තාක්ෂණය පිළිබඳ උපාධිය | 1 වැනි වසර | 2021/2022 | 21 | 102 | 123 |
| | | 2 වැනි වසර | 2020/2021 | 16 | 101 | 117 |
| | | 3 වැනි වසර | 2019/2020 | 27 | 101 | 128 |
| | | 4 වැනි වසර | 2018/2019 | 19 | 67 | 86 |
| | පාර්ශ්වීය ප්‍රවේශය | 1 වැනි වසර | 2021/2022 | - | - | - |
| | | 2 වැනි වසර | 2020/2021 | 1 | 1 | 2 |
| | | 3 වැනි වසර | 2019/2020 | - | 1 | 1 |
| | | 4 වැනි වසර | 2018/2019 | 1 | - | 1 |
| | **මුලු ගණන** | | | **216** | **929** | **1145** |
| පශු සම්පත්, ධීවර හා පෝෂණය | ආහාර විද්‍යාව සහ පෝෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | 1 වැනි වසර | 2021/2022 | 23 | 76 | 95 |
| | | 2 වැනි වසර | 2020/2021 | 18 | 77 | 108 |
| | | 3 වැනි වසර | 2019/2020 | 31 | 69 | 84 |
| | | 4 වැනි වසර | 2018/2019 | 15 | 53 | 82 |
| | ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විද්‍යා වේදී ගෞරව උපාධිය | 1 වැනි වසර | 2021/2022 | 15 | 70 | 88 |
| | | 2 වැනි වසර | 2020/2021 | 15 | 70 | 97 |
| | | 3 වැනි වසර | 2019/2020 | 27 | 54 | 73 |
| | | 4 වැනි වසර | 2018/2019 | 19 | 40 | 63 |
| | මුලු ගණන | | | **163** | **598** | **761** |
| ව්‍යාපාර අධ්‍යයන සහ මූල්‍ය | බැංකු සහ මූල්‍ය / ව්‍යාපාර කළමනාකරණය / ගිණුම්කරණය සහ ව්‍යාපාර මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) / රක්ෂණ සහ මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | 1 වැනි වසර | 2021/2022 | 196 | 400 | 596 |
| | | 2 වැනි වසර | 2020/2021 | 179 | 408 | 587 |
| | | 3 වැනි වසර | 2019/2020 | 195 | 395 | 590 |
| | | 4 වැනි වසර | 2018/2019 | 166 | 351 | 517 |
| | මුලු ගණන | | | **736** | **1554** | **2290** |
| තාක්ෂණය | ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය | 1 වැනි වසර | 2021/2022 | 193 | 38 | 231 |
| | | 2 වැනි වසර | 2020/2021 | 186 | 39 | 225 |
| | | 3 වැනි වසර | 2019/2020 | 166 | 36 | 202 |
| | | 4 වැනි වසර | 2018/2019 | 99 | 21 | 120 |
| | මුලු ගණන | | | **644** | **134** | **778** |
| වෛද්‍ය විද්‍යා උපාධිය | වෛද්‍ය විද්‍යා උපාධිය | 1 වැනි වසර | 2021/2022 | 43 | 109 | 152 |
| | | 2 වැනි වසර | 2020/2021 | 46 | 101 | 147 |
| | | 3 වැනි වසර | 2019/2020 | 39 | 96 | 135 |
| | | 4 වැනි වසර | 2018/2019 | 28 | 46 | 74 |
| | | 5 වැනි වසර | 2017/2018 | 22 | 49 | 71 |
| | **මුලු ගණන** | | | **178** | **401** | **579** |
| | මුලු ගණන | | | **2157** | **3987** | **6144** |

## 12. මානව සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු – 2023

| පීඨය | උපාධි පාඨමාලාව/පාඨමාලා | මුලු ශිෂ්‍ය සංඛ්‍යාව | මුලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුලු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික සහ වැවිලි කළමනාකරණය | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 1145 | 46 | 45 |
| | ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | |
| ව්‍යවහාරික විද්‍යාව | විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය | 591 | 46 | 24 |
| | විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන) | | | |
| | කාර්මික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | | | |
| | ගණිතය හා සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | | | |
| | ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | | | |
| | පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | | | |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | බැංකුකරණය හා මූල්‍යකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | 2290 | 58 | 21 |
| | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | | | |
| | රක්ෂණය සහ මූල්‍යකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය | | | |
| | ගිණුම්කරණය හා ව්‍යාපාර මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | | | |
| පශු සම්පත්. ධීවර හා පෝෂණය | ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 761 | 45 | 38 |
| | ආහාර නිෂ්පාදනය සහ තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | |
| තාක්ෂණය | ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණය උපාධිය | 778 | 28 | 23 |
| | විද්‍යුත් තාක්‍ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණය උපාධිය | | | |
| | යාන්ත්‍රික සහ නිෂ්පාදන පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ උපාධිය | | | |
| | නැනෝ විද්‍යා තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ උපාධිය | | | |
| වෛද්‍ය විද්‍යාව | වෛද්‍ය විද්‍යාවේදී උපාධිය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී උපාධිය (එම්.බී.බී.එස්) | 579 | 26 | 26 |
| **මුලු එකතුව** | | **6,144** | **249** | **177** |




## 13.බාහිර උපාධි උපාධි අපේක්ෂකයින්ගේ විස්තර – 2023

| පීඨය | අධ්‍යයන වැඩසටහන | අධ්‍යයන වර්ෂය | ලියාපදිංචි මුලු ශිෂ්‍ය සංඛ්‍යාව (2023 දෙසැම්බර් 31 දිනට) | | |
|---|---|---|---|---|---|
| | | | පුරුෂ | ස්ත්‍රී | මුලුඑකතුව |
| කෘෂිකර්මය සහ වැවිලි කළමනාකරණය | වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බාහිර) | 1 වැනි වර්ෂය | 71 | 133 | 204 |
| | | 2 වැනි වර්ෂය | 100 | 117 | 217 |
| | | 3 වැනි වර්ෂය | 66 | 56 | 122 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණය | ආහාරවල ගුණාත්මක කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය - පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 1 වැනි වර්ෂය | 65 | 75 | 140 |
| | | 2 වැනි වර්ෂය | 30 | 38 | 68 |
| | | 3 වැනි වර්ෂය | 14 | 24 | 38 |

## 14. පශ්චාත් උපාධි පාඨමාලා හදාරන සිසුන් පිළිබඳ විස්තර - 2023

| අධ්‍යයන වැඩසටහන | පූර්ණ කාලීන/අර්ධ කාලීන | 2023.12.31 දිනට ලියාපදංචි මුලු ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | පුරුෂ | කාන්තා | මුලු එකතුව |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා** | | | | |
| ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | අර්ධ කාලීන | 50 | 21 | 71 |
| **ශාස්ත්‍රපති/විද්‍යාපති උපාධි** | | | | |
| ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය | අර්ධ කාලීන | 139 | 76 | 215 |
| කෘෂි ව්‍යවසායකත්වය සහ තාක්ෂණ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය | අර්ධ කාලීන | 56 | 35 | 91 |
| ආහාර විද්‍යාව පිළිබඳ පශ්චාත් (Master) උපාධිය | අර්ධ කාලීන | - | 1 | 1 |
| ආහාර විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | අර්ධ කාලීන | - | 4 | 4 |
| ගෝලීය මහජන සෞඛ්‍ය පෝෂණය පිළිබඳ පශ්චාත් (Master) උපාධිය | අර්ධ කාලීන | - | 1 | 1 |
| ගෝලීය මහජන සෞඛ්‍ය පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | අර්ධ කාලීන | 3 | 2 | 5 |
| මානව පෝෂණය පිළිබඳ පශ්චාත් (Master) උපාධිය | අර්ධ කාලීන | 23 | 24 | 47 |
| මානව පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | අර්ධ කාලීන | 10 | 10 | 20 |
| **දර්ශනපති උපාධිය** | | | | |
| දර්ශනශපති | පූර්ණ කාලීන | 13 | 27 | 40 |
| දර්ශනපති | අර්ධ කාලීන | 11 | 9 | 20 |
| දර්ශන ශූරී | | | | |
| දර්ශන ශූරී | පූර්ණ කාලීන | 8 | 16 | 24 |
| දර්ශන ශූරී | අර්ධ කාලීන | 3 | 1 | 4 |
| මුලු එකතුව | | **316** | **227** | **543** |

# 15. බිහිකරන ලද උපාධිධාරීන් 2015 – 2022

| පීඨය | උපාධි පාඨමාලාව | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | උපාධිය පිරිනැමූ දිනය | 17.07.2015 | 10.08.2016 සහ 11.08.2016 | 30.08.2017 | 30.08.2018 | 09.01.2020 | 17.02.2022 සහ 18.02.2022 | 29.11.2022 සහ 30.11.2022 | 09.08.2023 සහ 10.08.2023 |
| කෘ.වැ.ක. | (කෘෂි විද්‍යාව) විද්‍යා වේදී උපාධිය | 100 | 100 | 114 | 132 | 161 | 137 | 133 | 148 |
| | ජෛව පද්ධති හා තාක්ෂණය පිළිබඳ (ගෞරව) උපාධිය | - | - | - | - | - | - | 81 | 82 |
| | වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යා වේදී උපාධිය (බාහිර) | 17 | 70 | 48 | 57 | 73 | 95 | 103 | 149 |
| | උප එකතුව | 117 | 170 | 162 | 189 | 234 | 232 | 317 | 379 |
| ව්‍ය.වි. | ඒකාබද්ධ ප්‍රධාන විද්‍යා වේදී උපාධිය | 39 | 113 | 53 | 43 | 75 | 53 | 66 | 55 |
| | සාමාන්‍ය විද්‍යා වේදී උපාධිය | 47 | 71 | 32 | 62 | 68 | 69 | 116 | 32 |
| | ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යා වේදී (විශේෂ) උපාධිය | - | - | 5 | 5 | 1 | - | 5 | 4 |
| | පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යා වේදී (විශේෂ) උපාධිය | - | - | - | - | 7 | 6 | 9 | 19 |
| | කර්මාන්ත කළමනාකරණය පිළිබඳ විද්‍යා වේදී (විශේෂ) උපාධිය | - | - | 6 | 5 | 3 | 2 | 6 | 8 |
| | ගණිතය හා සංඛ්‍යානය පිළිබඳ විද්‍යා වේදී (විශේෂ) උපාධිය | - | - | 5 | 5 | 5 | 4 | 7 | 6 |
| | උප එකතුව | 86 | 184 | 101 | 120 | 159 | 134 | 209 | 124 |
| ව්‍යා.අ.මූ | ගිණුම්කරණය හා ව්‍යාපාර මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | 81 | 164 | 165 | 164 | 141 | 231 | 259 | 209 |
| | බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | 18 | 99 | 42 | 37 | 32 | 34 | 21 | 29 |
| | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | 92 | 282 | 213 | 209 | 163 | 145 | 198 | 250 |
| | රක්ෂණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය | 10 | 40 | 10 | 21 | 9 | 1 | 2 | 2 |
| | රක්ෂණය සහ මූල්‍ය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | - | - | - | - | - | 28 | 23 | 28 |
| | උප එකතුව | 201 | 585 | 430 | 431 | 345 | 439 | 503 | 518 |
| ප.ධී.පෝ. | ආහාර විද්‍යාව සහ පෝෂණය පිළිබඳ විද්‍යා වේදි උපාධිය | 53 | 59 | 53 | 86 | 56 | 25 | - | 1 |
| | ආහාර විද්‍යාව සහ පෝෂණය පිළිබඳ විද්‍යා වේදි ගෞරව උපාධිය | - | - | - | - | - | 49 | 60 | 92 |
| | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ | 37 | 36 | 39 | 38 | 23 | 7 | 1 | 2 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | කළමනාකරණ පිළිබඳ විද්‍යා වේදී උපාධිය | | | | | | | | |
| | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය පිළිබඳ විද්‍යා වේදී (ගෞරව) උපාධිය | - | - | - | - | - | 11 | 24 | 64 |
| | උප එකතුව | 90 | 95 | 92 | 124 | 79 | 92 | 85 | 159 |
| තාක්ෂණ පීඨය | ඉදිකිරීම් පිළිබඳ ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ උපාධිය | - | - | - | - | - | - | 18 | 42 |
| | විද්‍යුත් තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු තාක්ෂණ ගෞරව උපාධිය | - | - | - | - | - | - | 13 | 15 |
| | යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු විද්‍යා තාක්ෂණ ගෞරව උපාධිය | - | - | - | - | - | - | 21 | 33 |
| | භෞතික හා නැනෝ විද්‍යා තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු විද්‍යා තාක්ෂණ ගෞරව උපාධිය | - | - | - | - | - | - | 48 | 57 |
| | උප එකතුව | - | - | - | - | - | - | 100 | 147 |
| | **මුලු උපාධිධාරීන් සංඛ්‍යාව** | **523** | **1034** | **785** | **864** | **817** | **897** | **1214** | **1327** |

## 16. 2013 – 2022 අතර කාලය තුල බිහිකරන ලද පශ්චාත් උපාධිධාරීන්

| **පශ්චාත් උපාධි පාඨමාලාව** | **2013/2014** | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** |
|---|---|---|---|---|---|---|---|---|---|
| උපාධිය පිරිනැමු දිනය | 17.07.2014 | 30.07. 2015 | 10.08.2016 සහ 11.08.2016 | 30.08.2017 | 30.08.2018 | 01.09.2019 | 17.02.2022 සහ 18.02.2022 | 29.11.2022 30.11.2022 සහ 01.12.2022 | 09.08.2023 සහ 10.08.2023 |
| දර්ශනශූරී | 2 | 1 | 3 | 1 | 4 | 2 | 3 | 2 | 1 |
| දර්ශනපති | 1 | - | 2 | | 6 | 5 | 4 | 3 | - |
| ව්‍යාපාර පරිපාලනපති | 37 | 56 | 76 | 50 | 77 | 46 | 63 | 87 | 32 |
| කෘෂි ව්‍යවසායකත්වය සහ තාක්ෂණ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය | - | - | - | - | - | - | 136 | 73 | 57 |
| ප.උ.ඩිප්ලෝමා | 13 | 14 | 7 | 24 | 16 | 15 | 10 | 33 | 32 |
| **මුලු එකතුව** | **53** | **71** | **108** | **75** | **103** | **68** | **216** | **198** | **122** |

## 17.විදේශ සිසුන් පිළිබඳ විස්තර - 2023

| පීඨය | අධ්‍යයන වැඩසටහන | අධ්‍යයන වර්ෂය | රට | බඳවා ගත් වර්ෂය | ශිෂ්‍ය ලියාපදිංචිය (ලියාපදිංචි මුලු ශිෂ්‍ය සංඛ්‍යාව) | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | පුරුෂ | කාන්තා | මුලු එකතුව |
| වෛද්‍ය විද්‍යාව | එම්.බී.බී.එස් | 2 වැනි වර්ෂය | කටාර් | 2020/21 | - | 1 | 1 |

## 18.ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර – 2023

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | සහතික පත්‍ර / ඩිප්ලෝමා |
|---|---|---|---|
| කෘෂිකාර්මික සහ වැවිලි කළමනාකරණය | ශාඛ පටක රෝපණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව | ඉංග්‍රීසි සහ සිංහල | √ |

# 19. ශිෂ්‍ය කටයුතු

*19.1* ***උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් – 2023***

*19.2* ***ශිෂ්‍යාධාර/මහපොල ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2023***

## 19.1 උපාධි අපේක්ෂකයින් සඳහා ශිෂ්‍ය නේවාසිකාගාර නවාතැන් පහසුකම් – 2023

| නම | නවාතැන් පහසුකම් ලබා දිය හැකි සංඛ්‍යාව | | නවාතැන් පහසුකම් ලබා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව (2023 දෙසැම්බර් 31 වන විට) | |
|---|---|---|---|---|
| | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා |
| කුලියාපිටිය පරිශ්‍රය | | | | |
| පණ්ඩුකාභය නේවාසිකාගාරය | 112 | - | 112 | - |
| චිත්‍රා දේවි ශාලාව | 392 | - | 380 | - |
| විජිත කුරුවිට නේවාසිකාගාරය | 388 | - | 238 | - |
| සීතා දේවි ශාලාව | - | 382 | - | 382 |
| අනුලාදේවි ශාලාව | - | 380 | - | 380 |
| විශාඛා ශාලාව | - | 388 | - | 388 |
| පඬුවස්දෙව් නේවාසිකාගාරය | - | 152 | - | 152 |
| ස්වර්ණපාලි ශාලාව | - | 112 | - | 112 |
| මුලු සංඛ්‍යාව | *892* | *1,414* | *730* | *1,414* |
| **මාකඳුර පරිශ්‍රය** | | | | |
| සපුමල් බණ්ඩාර නේවාසිකාගාරය | 120 | - | 120 | - |
| වීදිය බණ්ඩාර ශාලාව | 160 | - | 160 | - |
| බිසෝ බණ්ඩාර නේවාසිකාගාරය | - | 116 | - | 116 |
| සුගලාදේවි නේවාසිකාගාරය | - | 392 | - | 392 |
| විහාරමහාදේවි නේවාසිකාගාරය | - | 388 | - | 388 |
| මුලු සංඛ්‍යාව | *280* | *896* | *280* | *896* |
| **ලබුයාය පරිශ්‍රය** | | | | |
| **මයාදුන්නේ නේවාසිකාගාරය** | 91 | - | 84 | - |
| **මහමාංහා නේවාසිකාගාරය** | - | 185 | - | 184 |
| මුලු සංඛ්‍යාව | *91* | *185* | *84* | *184* |
| **පරිශ්‍ර තුනෙහිම මුලු සංඛ්‍යාව** | **1,263** | **2,495** | **1,094** | **2,494** |

2023 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූ පිරිමි සහ කාන්තා සිසුන්ගේ එකතුව පිළිවෙළින් 2,157 සහ 3,987 විය. ඔවුන් අතරින් 2023.12.31 දිනට ශිෂ්‍යයින් 1,094 ක් සහ ශිෂ්‍යාවන් 2,494 ක් සඳහා විශ්වවිද්‍යාල නේවාසිකාගාර ලබා දී ඇත.

විශ්වවිද්‍යාලයට කිලෝමීටර් 10කට වඩා දුරින් ස්ථිර පදිංචිය ඇති සියලුම පළමු වසර සිසුන් විශ්වවිද්‍යාල නේවාසිකාගාර පහසුකම් සඳහා සුදුසුකම් ලබයි. වෛද්‍ය පීඨ හැර අනෙකුත් සියලුම පීඨ 04 මට්ටමේ සිසුන්ට දෙවන ප්‍රමුඛතාවය සහ 03 මට්ටමේ සිසුන් සඳහා තෙවන ප්‍රමුඛතාවය ලබා දෙනු ලබන අතර පුරප්පාඩු පැවතීම මත පදනම්ව පහත නිර්ණායක භාවිතා කරමින් එම පහසුකම් සලසා දෙනු ලැබේ.

වෛද්‍ය පීඨය 02 මට්ටමේ සිසුන්ට දෙවන ප්‍රමුඛතාවය සහ 05 මට්ටමේ සිසුන් සඳහා තෙවන ප්‍රමුඛතාවය එකී නිර්ණායක භාවිතා කරමින් ලබා දෙයි.

දුර 70%

පෙර අධ්‍යයන වර්ෂයේ පැමිණීම 20%

GPA 10%

* ඉහත කරුණු නොසලකා, 10%ක පුරප්පාඩු පහත සඳහන් කාණ්ඩ තුනක් යටතේ සලකා බැලීමට නියමිත අභියාචනා සඳහා වෙන් කර ඇත .

ශාරීරික ආබාධ සහිත සිසුන්ගේ කාණ්ඩය

අඩු ආදායම්ලාභී කාණ්ඩය

විෂය බාහිර ජයග්‍රහණ කාණ්ඩය

***2015-2023* කාලය තුළ උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර නවාතැන් ලබාදීම**

| වර්ෂය | පිරිමි | කාන්තා | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|
| 2015 | 377 | 434 | 811 |
| 2016 | 620 | 1,350 | 1,970 |
| 2017 | 833 | 1,659 | 2,492 |
| 2018 | 988 | 1,792 | 2,780 |
| 2019 | 1,044 | 2,539 | 3,583 |
| 2020 | 1,294 | 2,664 | 3,958 |
| 2021 | 1,294 | 2,664 | 3,958 |
| 2022 | 1,270 | 2,256 | 3,526 |
| 2023 | 1,094 | 2,494 | 3,588 |

**2015-2023 අතර කාලය තුල නේවාසිකාගාර පහසුකම් ලැබූ මුලු ශිෂ්‍ය සංඛ්‍යාව**



## 19.2 ශිෂ්‍යාධාර/මහපොල ශිෂ්‍යත්වලාභී ශිෂ්‍ය සංඛ්‍යාව – 2023

| පීඨය | මහපොල | ශිෂ්‍යාධාර |
|---|---:|---:|
| කෘෂිකාර්මික සහ වැවිලි කළමනාකරණය | 346 | 351 |
| ව්‍යවහාරික විද්‍යාව | 73 | 282 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | 924 | 667 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | 252 | 179 |
| තාක්ෂණය | 386 | 170 |
| වෛද්‍ය විද්‍යාව | 170 | 51 |
| **මුලු සංඛ්‍යාව** | **2,151** | **1,700** |

2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූ මුළු සිසුන් (සිසුන් 6,144) අතරින් සිසුන් 2,151 ක් මහපොළ ශිෂ්‍යත්වලාභීන් වන අතර සිසුන් 1,700 ශිෂ්‍යාධාරලාභීන් විය . එනම් 2023 වසරේ මුළු සිසුන් අතරින් 35%ක් මහපොළ ශිෂ්‍යත්වලාභීන් වූ අතර 28%ක් ශිෂ්‍යාධාරලාභීන් විය.




**ශිෂ්‍යාධාර, මහපොල ශිෂ්‍යත්ව ලාභීන්– 2023**

***2018-2023* අතර කාලය තුල ශිෂ්‍යාධාර සහ මහපොල ශිෂ්‍යත්ව ලැබූ මුලු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සන්සන්දනයක්**

| පීඨය | ශිෂ්‍යාධාර | | | | | මහපොල | | | | |
|---|---:|---:|---:|---:|---:|---:|---:|---:|---:|---:|
| | **2019** | **2020** | **2021** | **2022** | **2023** | **2019** | **20220** | **2021** | **2022** | **2023** |
| කෘෂිකාර්මික සහ වැවිලි කළමනාකරණය | 222 | 292 | 388 | 384 | 346 | 295 | 297 | 217 | 288 | 351 |
| ව්‍යවහාරික විද්‍යාව | 29 | 294 | 247 | 317 | 73 | 291 | 38 | 24 | 38 | 282 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | 1,270 | 241 | 560 | 732 | 924 | 229 | 1,377 | 1,028 | 976 | 667 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | 204 | 83 | 175 | 116 | 252 | 78 | 267 | 194 | 238 | 179 |
| තාක්ෂණය | 283 | 55 | 179 | 161 | 386 | 43 | 399 | 296 | 361 | 170 |
| වෛද්‍ය විද්‍යාව | 32 | 2 | 54 | 57 | 170 | 1 | 62 | 60 | 120 | 51 |
| **මුලු සංඛ්‍යාව** | 2,040 | 967 | 1,063 | 1,767 | 2,151 | 937 | 2,440 | 1,819 | 2,021 | 1,700 |

# 20. මානව සම්පත්

*20.1* **2023.12.31 දිනට විශ්ව විද්‍යාලයේ සේවා නියුක්තිකයන් පිළිබඳ විස්තර**

*20.2* **2023.12.31 දිනට පීඨවල සහ ඒකකවල සේවයේ නියුතු අධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර**

*20.3* **2023.12.31 දිනට අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර**

*20.4* **2023.12.31 දිනට අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර**

## 20.1 2023.12.31 දිනට විශ්වවිද්‍යාලයේ සේවා නියුක්තියක් පිළිබඳ විස්තර

**ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවා නියුක්තිකයන්**

<table>
<tr><th>තනතුර</th><th>වැටුප් කේතය</th><th>අනුමත සේවක සංඛ්‍යාව</th><th>දැනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව</th><th>පුරප්පාඩු</th></tr>
<tr><td>උප කුලපතිවරයා</td><td>U-AC 5</td><td>1</td><td>1</td><td>0</td></tr>
<tr><td>නියෝජ්‍ය උප කුලපතිවරයා</td><td>U-AC 5</td><td>1</td><td>0</td><td>1</td></tr>
<tr><td>මහාචාර්ය (සභාපති)</td><td>U-AC 5</td><td>19</td><td>11</td><td>8</td></tr>
<tr><td>මහාචාර්ය</td><td>U-AC 5</td><td rowspan="3">296</td><td>29</td><td rowspan="3">57</td></tr>
<tr><td>සහායක මහාචාර්ය</td><td>U-AC 4</td><td>2</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/කථිකාචාර්ය/<br>කථිකාචාර්ය (පරිවාස)</td><td>U-AC 3</td><td>208</td></tr>
<tr><td>පුස්තකාලයාධිපති</td><td>U-AC 5</td><td>1</td><td>0</td><td>1</td></tr>
<tr><td>නියෝජ්‍ය පුස්තකාලයාධිපති</td><td>U-AC 4</td><td>1</td><td>0</td><td>1</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති</td><td>U-AC 3</td><td>2</td><td>3</td><td>0</td></tr>
<tr><td>සහකාර පුස්තකාලයාධිපති</td><td>U-AC 3</td><td>2</td><td>1</td><td>0</td></tr>
<tr><td>ලේඛකාධිකාරී</td><td>U-EX 3 (I)</td><td>1</td><td>1</td><td>0</td></tr>
<tr><td>මූල්‍යාධිකාරී</td><td>U-EX 3</td><td>1</td><td>1</td><td>0</td></tr>
<tr><td>නියෝජ්‍ය ලේඛකාධිකාරී</td><td>U-EX 2</td><td>1</td><td>1</td><td>0</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/<br>නියෝජ්‍ය ලේඛකාධිකාරී</td><td>U-EX 2</td><td>9</td><td>9</td><td>0</td></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී<br>/නියෝජ්‍ය මූල්‍යාධිකාරී</td><td>U-EX 2</td><td>4</td><td>4</td><td>0</td></tr>
<tr><td>ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ</td><td>U-EX 2</td><td>1</td><td>1</td><td>0</td></tr>
<tr><td>වැඩ ඉංජිනේරු</td><td>U-EX 2</td><td>1</td><td>1</td><td>0</td></tr>
<tr><td>සංඛ්‍යාලේඛන නිලධාරී</td><td>U-EX 2</td><td>1</td><td>1</td><td>0</td></tr>
<tr><td>භාරකරු (භූමි අලංකරණය)</td><td>U-EX 2</td><td>1</td><td>1</td><td>0</td></tr>
<tr><td>ගොවිපල කළමනාකරු</td><td>U-EX 2</td><td>2</td><td>2</td><td>0</td></tr>
<tr><td>ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී</td><td>U-EX 2</td><td>1</td><td>0</td><td>1</td></tr>
<tr><td>ප්‍රධාන තාක්ෂණ නිලධාරී</td><td>U-EX 2</td><td>1</td><td>0</td><td>1</td></tr>
<tr><td colspan="2">මුළු එකතුව</td><td>347</td><td>277</td><td>70</td></tr>
</table>

**තෘතීය මට්ටමේ සේවා නියුක්තිකයන්**

| තනතුර | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| සහකාර ලේඛකාධිකාරී | U-EX 1 | 8 | 7 | 1 |
| සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවය) | U-EX 1 | 1 | 1 | 0 |
| සහකාර ලේඛකාධිකාරී (නීති) | U-EX 1 | 1 | 1 | 0 |
| සහකාර මූල්‍යාධිකාරී | U-EX 1 | 4 | 4 | 0 |
| සහකාර අභ්‍යන්තර විගණක | U-EX 1 | 1 | 0 | 1 |
| නියෝජ්‍ය ප්‍රධාන මාර්ෂල් | U-EX 1 | 1 | 0 | 1 |
| ව්‍යාපෘති කළමනාකරු | U-EX 1 | 1 | 0 | 1 |
| පද්ධති ඉංජිනේරු | U - AS 2 | 2 | 2 | 0 |
| පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක | U - AS 2 | 6 | 3 | 3 |
| ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක | - | - | 1 | - |
| ශාරීරික අධ්‍යාපන උපදේශක | U - AS 1,<br>U -AS 2 | 5 | 3 | 1 |
| ශාරීරික අධ්‍යාපන ජ්‍යෙෂ්ඨ උපදේශක | U - AS 1,<br>U -AS 2 | - | 1 | - |
| වෘත්තීය මාර්ගෝපදේශ උපදේශක | U - AS 2 | 1 | 0 | 1 |
| ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක | U - AS 2 | 1 | 2 | - |
| උපදේශක (ICT) | U-AS 1 | 1 | 0 | 1 |
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී / වෛද්‍ය නිලධාරී | U-MO 1 | 2 | 0 | 2 |
| සහකාර ජාල කළමනාකරු | U - AS 2 | 2 | 1 | 1 |
| **මුළු එකතුව** | | **37** | **26** | **13** |

**ද්විතියික මට්ටමේ සේවා නියුක්තිකයින්**

| තනතුර | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘෂ්‍ය) | U-MT 1 | 3 | 1 | 2 |
| තාක්ෂණික නිලධාරී | U-MT 1 | 49 | 34 | 15 |
| තාක්ෂණික නිලධාරී (ICT) | U-MT 1 | 8 | 7 | 1 |
| ඖෂධවේදී | U-MT 1 | 2 | 2 | 0 |
| හෙද නිලධාරී | U-MT 1 | 2 | 2 | 0 |
| මහජන සෞඛ්‍ය පරික්ෂක | U-MT 1 | 2 | 1 | 1 |
| ක්ෂේත්‍ර අධීක්ෂක | U-MT 1 | 1 | 1 | 0 |
| ගොවිපල අධීක්ෂක | U-MT 1 | 1 | 0 | 1 |
| සැලසුම් ශිල්පී | U-MT 1 | 1 | 1 | 0 |
| අධීක්ෂක (විදුලි) | U-MT 1 | 1 | 1 | 0 |
| අධීක්ෂක (භූ දර්ශන) | U-MT 1 | 3 | 3 | 0 |
| අධීක්ෂක (සිවිල්) | U-MT 1 | 1 | 1 | 0 |
| අධීක්ෂක (නඩත්තු) | U-MT 1 | 2 | 2 | 0 |
| පූර්ණ කාලීන උප පාලක | U - MN 3 | 7 | 7 | 0 |
| මාෂල් (Marshal) | U - MN 3 | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | U - MN 3 | 1 | 0 | 1 |
| වැඩ අධිකාරී (සිවිල්) | U - MN 2 | 2 | 2 | 0 |
| වැඩ අධිකාරී (විදුලි) | U - MN 2 | 1 | 1 | 0 |
| විගණන සහකාර | U - MN 1 | 4 | 4 | 0 |
| කළමනාකරණ සහකාර | U - MN 1 | 126 | 117 | 9 |
| ආරක්ෂ කටයුතු පරීක්ෂක | U - MN 1 | 3 | 3 | 0 |
| කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) | U - MN 1 | 3 | 2 | 1 |
| කළමනාකරණ සහකාර (පොත් තැබීම) | U - MN 1 | 3 | 3 | 0 |
| කළමනාකරණ සහකාර (සරප්) | U - MN 1 | 4 | 4 | 0 |
| පුස්තකාල තොරතුරු සහායක | U - MN 1 | 13 | 12 | 1 |
| දුරකථන ක්‍රියාකර | U - MN 1 | 1 | 1 | 0 |
| **මුලු එකතුව** | | **245** | **213** | **32** |

**ප්‍රාථමික මට්ටමේ සේවා නියුක්තිකයන්**

| තනතුර | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| රියදුරු | U - PL 3 | 18 | 11 | 7 |
| වඩු කාර්මික | U - PL 3 | 4 | 4 | 0 |
| පෙදරේරු | U - PL 3 | 4 | 4 | 0 |
| ජල නල කාර්මික | U - PL 3 | 3 | 2 | 1 |
| වැද්දුම්කරු | U - PL 3 | 2 | 1 | 1 |
| විදුලි කාර්මික | U - PL 3 | 5 | 5 | 0 |
| පැස්සුම්කරු | U - PL 3 | 1 | 0 | 1 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | U - PL 3 | 4 | 3 | 1 |
| පොත් බැඳුම්කරු | U - PL 3 | 1 | 1 | 0 |
| කාර්මික | U - PL 3 | 1 | 0 | 1 |
| රැකබලාගන්නා | U - PL 2 | 3 | 2 | 1 |
| රෝද දෙකේ ට්‍රැක්ටර් ක්‍රියාකරු | U - PL 2 | 1 | 1 | 0 |
| උපස්ථායක (සෞඛ්‍ය සේවා) | U - PL 2 | 2 | 2 | 0 |
| එන්ජින් සහ පොම්ප ක්‍රියාකරු | U - PL 2 | 1 | 1 | 0 |
| රසායනාගාර සහායක | U - PL 2 | 57 | 34 | 23 |
| ක්‍රීඩාගාර සේවක | U - PL 2 | 1 | 0 | 1 |
| ආරක්ෂක නියාමක | U - PL 1 | 3 | 2 | 1 |
| සෞඛ්‍ය සේවා කම්කරු | U - PL 1 | 1 | 1 | 0 |
| උද්‍යාන පාලක | U - PL 1 | 6 | 0 | 6 |
| පුස්තකාල සේවක | U - PL 1 | 14 | 7 | 7 |
| කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු | U - PL 1 | 2 | 2 | 0 |
| ලොරි බස් සහායක | U - PL 1 | 1 | 1 | 0 |
| ක්‍රීඩාංගන භාරකරු | U - PL 1 | 2 | 1 | 1 |
| තණකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු | U - PL 1 | 2 | 0 | 2 |
| පශ්චාත් මරණ කම්කරු | U - PL 1 | 1 | 0 | 1 |
| වැඩ සහායක | U - PL 1 | 110 | 95 | 15 |
| **මුලු එකතුව** | | **250** | **180** | **70** |

## 20.2 2023.12.31 දිනට පීඨ හා ඒකකවල සේවයේ නියුතු අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු

| පීඨය | අධ්‍යයනාංශය | අනුමත කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / කථිකාචාර්ය | දැනට සිටින මුළු කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය** | පීඨාධිපති කාර්යාලය | 4 | - | - | - | - | - | - | 4 |
| | කෘෂිව්‍යාපාර කළමනාකරණ | 10 | 1 | 3 | - | 3 | 3 | 10 | - |
| | ජෛවතාක්ෂණ | 10 | 1 | 1 | - | 4 | 2 | 8 | 2 |
| | ජෛව පද්ධති ඉංජිනේරු | 7 | - | - | - | 1 | 4 | 5 | 2 |
| | උද්‍යාන විද්‍යාව සහ උද්‍යාන අලංකරණ | 12 | - | 2 | - | 6 | 4 | 12 | - |
| | වැවිලි කළමනාකරණ | 12 | - | 4 | - | 3 | 4 | 11 | 1 |
| | උප එකතුව | 55 | 2 | 10 | - | 17 | 17 | 46 | 9 |
| **ව්‍යවහාරික විද්‍යා පීඨය** | පරිගණක හා තොරතුරු පද්ධති | 11 | - | | 1 | 6 | 3 | 10 | 1 |
| | ඉලෙක්ට්‍රොනික | 11 | 1 | 3 | - | 3 | 3 | 10 | 1 |
| | කර්මාන්ත කළමනාකරණ | 16 | - | 3 | - | 7 | 3 | 13 | 3 |
| | ගණිත විද්‍යා | 17 | - | 2 | - | 9 | 2 | 13 | 4 |
| | උප එකතුව | 55 | 1 | 8 | 1 | 25 | 11 | 46 | 9 |
| **තාක්ෂණ පීඨය** | ඉදිකිරීම් තාක්ෂණ | 8 | - | - | - | 5 | 2 | 7 | 1 |
| | විද්‍යුත් තාක්ෂණ | 8 | - | - | - | 1 | 6 | 7 | 1 |
| | යාන්ත්‍රික හා නිෂ්පාදන තාක්ෂණ | 8 | - | - | - | 1 | 3 | 4 | 4 |
| | නැනෝ විද්‍යා තාක්ෂණ | 12 | 1 | - | - | 5 | 3 | 10 | 2 |
| | උප එකතුව | 36 | 1 | - | - | 13 | 14 | 28 | 8 |
| **ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය** | පීඨාධිපති කාර්යාලය | 1 | - | - | - | 1 | - | 1 | - |
| | ගිණුම්කරණ අධ්‍යයනාංශය | 17 | - | 3 | - | 9 | 4 | 16 | 1 |
| | බැංකුකරණ හා මූල්‍ය | 11 | - | 2 | 1 | 6 | 1 | 10 | 1 |
| | ව්‍යාපාර කළමනාකරණ | 16 | - | 1 | - | 10 | 4 | 15 | 1 |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ | 8 | - | - | - | 4 | 4 | 8 | - |
| | රක්ෂණ හා තක්සේරු | 9 | - | 1 | | 5 | 2 | 8 | 1 |
| | උප එකතුව | 62 | - | 7 | 1 | 35 | 15 | 58 | 4 |
| **පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය** | පීඨාධිපති කාර්යාලය | 3 | - | - | - | 3 | - | 3 | - |
| | ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශය | 13 | - | 3 | - | 6 | 2 | 11 | 2 |
| | ජලජ හා ධීවර අධ්‍යයනාංශය | 11 | - | 3 | - | 5 | 3 | 11 | - |
| | ආහාර විද්‍යාව හා පෝෂණ ය | 14 | 1 | 2 | - | 6 | 2 | 11 | 3 |
| | පශු සම්පත් හා කුරුළු විද්‍යා | 11 | - | 2 | - | 4 | 3 | 9 | 2 |
| | උප එකතුව | 52 | 1 | 10 | - | 24 | 10 | 45 | 7 |

| පීඨය | අධ්‍යයනාංශය | අනුමත කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / | දැනට සිටින මුළු කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **වෛද්‍ය පීඨය** | ව්‍යුහ විද්‍යා අධ්‍යයනාංශය | 5 | - | - | - | 1 | 3 | 4 | 1 |
| | ජෛව රසායන අධ්‍යයනාංශය | 4 | - | - | - | 3 | - | 3 | 1 |
| | ප්‍රජා වෛද්‍ය විද්‍යා සහ පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | 5 | - | - | - | - | 2 | 2 | 3 |
| | අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | 2 | - | - | - | - | - | - | 2 |
| | වෛද්‍ය විද්‍යා අධ්‍යාපන අධ්‍යයනාංශය | 2 | - | - | - | - | - | - | 2 |
| | වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය | 4 | - | - | - | 1 | - | 1 | 3 |
| | ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය | 3 | - | - | - | - | 1 | 1 | 2 |
| | ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය | 3 | - | - | - | - | - | - | 3 |
| | ව්‍යාධිවේද අධ්‍යයනාංශය | 4 | - | - | - | 1 | 1 | 2 | 2 |
| | පරපෝෂිතවේදී අධ්‍යයනාංශය | 3 | - | - | - | - | 2 | 2 | 1 |
| | ළමා රෝග අධ්‍යයනාංශය | 3 | - | 1 | - | 1 | 1 | 3 | - |
| | ඖෂධවේද අධ්‍යයනාංශය | 3 | - | - | - | - | 1 | 1 | 2 |
| | කායික විද්‍යා අධ්‍යයනාංශය | 6 | - | - | - | 1 | 4 | 5 | 1 |
| | මනෝ චිකිත්සක අධ්‍යයනාංශය | 3 | - | - | - | - | 1 | 1 | 2 |
| | ශල්‍ය අධ්‍යයනාංශය | 3 | - | - | - | 1 | - | 1 | 2 |
| | උප එකතුව | 53 | - | 1 | - | 9 | 16 | 26 | 27 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - මාකදුර | | 2 | - | - | - | 2 | - | 2 | - |
| | එකතුව | **315** | **5** | **36** | **2** | **125** | **83** | **251** | **64** |

ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, සහකාර මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ කථිකාචාර්යවරුන් අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සමානුපාතික ව්‍යාප්තිය පිළිවෙලින් **2%,14%, 1%, 50%, 33%** විය.




## 2023.12.31 දිනට සේවයේ නියුතු පුස්තකාල කාර්ය මණ්ඩල තොරතුරු

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| පුස්තකාලයාධිපති | 1 | - | 1 |
| නියෝජ්‍ය පුස්තකාලයාධිපති | 1 | - | 1 |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | 2 | 3 | 0 |
| සහකාර පුස්තකාලයාධිපති | 2 | 1 | |
| **මුළු එකතුව** | **6** | **4** | **2** |

## 20.3 2023.12.31 දිනට අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල තොරතුරු

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| සහකාර ජාල කළමනාකරු | 2 | 1 | 1 |
| වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන නිලධාරී | 1 | 1 | - |
| පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක | 6 | 2 | 4 |
| ජ්‍යෙෂ්ඨ ඉංග්‍රීසි උපදේශක | - | 1 | - |
| ශාරීරික අධ්‍යාපන උපදේශක | 5 | 4 | 1 |
| ක්‍රමලේඛක හා පද්ධති විශ්ලේෂක | 1 | 2 | - |
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී/වෛද්‍ය නිලධාරී | 2 | - | 2 |
| පද්ධති ඉංජිනේරුවරයා | 2 | 1 | 1 |
| **මුළු එකතුව** | **19** | **12** | **8** |

## 20.4 2023.12.31 දිනට අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු

**විධායක කාර්ය මණ්ඩලය**

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේඛකාධිකාරී | 1 | 1 | 0 |
| මූල්‍යාධිකාරී | 1 | 1 | 0 |
| නියෝජ්‍ය ලේඛකාධිකාරී | 1 | 1 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/නියෝජ්‍ය ලේඛකාධිකාරී | 9 | 9 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී /නියෝජ්‍ය මූල්‍යාධිකාරී | 4 | 4 | 0 |
| ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂ | 1 | 1 | 0 |
| වැඩ ඉංජිනේරු | 1 | 1 | 0 |
| සහකාර ලේඛකාධිකාරී | 8 | 7 | 1 |
| සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවය) | 1 | 1 | 0 |
| සහකාර ලේඛකාධිකාරී (නීති) | 1 | 1 | 0 |
| සහකාර මූල්‍යාධිකාරී | 4 | 4 | 0 |
| සහකාර අභ්‍යන්තර විගණක | 1 | 0 | 1 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 1 | 0 |
| ගොවිපල කළමනාකරු | 2 | 2 | 0 |
| භාරකරු (භූමි අංකරණ) | 1 | 1 | 0 |
| ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී | 1 | 0 | 1 |
| නියෝජ්‍ය ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී | 1 | 0 | 1 |
| ව්‍යාපෘති කළමනාකරු | 1 | 0 | 1 |
| **එකතුව** | **40** | **35** | **5** |

අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| කළමනාකරණ සහකාර (තාක්ෂණික) | | | |
| සැලසුම් ශිල්පී | 1 | 1 | 0 |
| ගොවිපල අධීක්ෂක | 1 | 0 | 1 |
| ක්ෂේත්‍ර අධීක්ෂක | 1 | 1 | 0 |
| හෙද නිලධාරී | 2 | 2 | 0 |
| ඖෂධවේදී | 2 | 2 | 0 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | 2 | 1 | 1 |
| අධීක්ෂක (සිවිල්) | 1 | 1 | 0 |
| අධීක්ෂක (විදුලි) | 1 | 1 | 0 |
| අධීක්ෂක (භූ දර්ශන) | 3 | 3 | 0 |
| තාක්ෂණික නිලධාරී | 49 | 34 | 15 |
| තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය/දෘශ්‍ය) | 3 | 1 | 2 |
| තාක්ෂණික නිලධාරී (ICT) | 8 | 7 | 1 |
| වැඩ අධිකාරී (සිවිල්) | 2 | 2 | 0 |
| වැඩ අධිකාරී (විදුලි) | 1 | 1 | 0 |
| ***උප එකතුව*** | ***77*** | ***57*** | ***20*** |
| *කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)* | | | |
| විගණන සහකාර | 4 | 4 | 0 |
| පූර්ණ කාලීන උප පාලක | 7 | 7 | 0 |
| පුස්තකාල තොරතුරු සහකාර | 13 | 12 | 1 |
| කළමනාකරණ සහකාර | 126 | 117 | 9 |
| කළමනාකරන සහකාර (පොත් තබන්නා) | 3 | 3 | 0 |
| කළමනාකරණ සහකාර (සරප්) | 4 | 4 | 0 |
| කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) | 3 | 2 | 1 |
| විනයාරක්ෂක | 1 | 1 | 0 |
| ආරක්ෂාව පිළිබඳ පරීක්ෂක | 3 | 3 | 0 |
| අධීක්ෂක (නඩත්තු) | 2 | 2 | 0 |
| දුරකථන ක්‍රියාකාරු | 1 | 1 | 0 |
| භාෂා පරිවර්තක | 1 | 0 | 1 |
| ***උප එකතුව*** | ***168*** | ***156*** | ***12*** |
| *ප්‍රාථමික මට්ටම්* | | | |
| උපස්ථායක (සෞඛ්‍ය සේවය) | 2 | 2 | 0 |
| පොත් බැඳුම්කරු | 1 | 1 | 0 |
| රැකබලාගන්නා | 3 | 2 | 1 |
| වඩු කාර්මික | 4 | 4 | 0 |
| රියදුරු | 18 | 11 | 7 |
| විදුලි කාර්මික | 5 | 5 | 0 |
| එන්ජින් සහ පොම්ප ක්‍රියාකරු | 1 | 1 | 0 |
| වැද්දුම්කරු | 2 | 1 | 1 |
| උද්‍යාන පාලක | 6 | 0 | 6 |
| ක්‍රීඩා පිටි භාරකරු | 2 | 1 | 1 |

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සේවයේ නියුතු සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ක්‍රීඩාගාර සේවක | 1 | 0 | 1 |
| සෞඛ්‍ය සේවා කම්කරු | 1 | 1 | 0 |
| රසායනාගාර සේවක | 57 | 34 | 23 |
| තණකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 0 | 2 |
| පුස්තකාල සේවක | 14 | 7 | 7 |
| ලොරි/බස් සහායක | 1 | 1 | 0 |
| පෙදරේරු | 4 | 4 | 0 |
| කාර්මික | 1 | 0 | 1 |
| කාර්යාල යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 2 | 0 |
| ජලනල කාර්මික | 3 | 2 | 1 |
| පශ්චාත් මරණ කම්කරු | 1 | 0 | 1 |
| ආරක්ෂක නියාමක | 3 | 2 | 1 |
| ට්‍රැක්ටර් ක්‍රියාකරු | 4 | 3 | 1 |
| රෝද දෙකේ ට්‍රැක්ටර් ක්‍රියාකරු | 1 | 1 | 0 |
| පැස්සුම්කරු | 1 | 0 | 1 |
| වැඩ සහායක | 110 | 95 | 15 |
| ***උප එකතුව*** | ***250*** | ***180*** | ***70*** |
| **එකතුව** | **495** | **393** | **102** |

කළමනාකරණ සහකාර (තාක්ෂණික), කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සහ ප්‍රාථමික කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ (විධායක කාර්ය මණ්ඩලය හැර, 2023 දී කාර්ය මණ්ඩල සාමාජිකයින් 393 ක් සිටියහ) සමානුපාතික ව්‍යාප්තිය පිළිවෙලින් 14%, 40% සහ 46% කි.




ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය සිය ඉලක්ක සපුරා ගැනීම සඳහා **35%** ක් වන අධ්‍යයන කාර්ය මණ්ඩලය, **2%** ක් වන අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, **5%** ක් වන විධායක කාර්ය මණ්ඩලය සහ **58%** ක් වන අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සමන්විත සමස්ත කාර්ය මණ්ඩල සාමාජිකයින් 692 දෙනෙකුගේ සහාය ඇතිව කටයුතු කරන ලදී.




***2017** සිට **2023*** **දක්වා කාලය තුළ විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩලය පිළිබඳ සංසන්දනයක්**

| කාර්ය මණ්ඩල වර්ගීකරණය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යයන | 160 | 178 | 203 | 216 | 252 | 250 | 248 |
| පුස්තකාල (අධ්‍යයන) | 5 | 5 | 5 | 5 | 4 | 4 | 4 |
| අධ්‍යයන සහායක | 13 | 13 | 14 | 13 | 13 | 13 | 12 |
| විධායක | 32 | 36 | 35 | 34 | 35 | 36 | 35 |
| අනධ්‍යයන | 341 | 389 | 421 | 414 | 421 | 418 | 393 |
| **එකතුව** | **551** | **621** | **678** | **682** | **725** | **721** | **692** |



# 21. විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම

## *21.1* ගෝලීය විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම

## 21.1 ගෝලීය ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම 2023

මූලාශ්‍රය: ලෝක විශ්වවිද්‍යාල වෙබ්මිතික ශ්‍රේණිගත කිරීම

වෙළුම: 2024 ජනවාරි

| ශ්‍රේණිගත කිරීම | ගෝලීය ශ්‍රේණිගත කිරීම | විශ්ව විද්‍යාලය | ඉම්පැක්ට් ශ්‍රේණිගත කිරීම | විවෘත ශ්‍රේණිගත කිරීම | විශිෂ්ටතා ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|---|---|
| 1 | 1425 | කොළඹ විශ්ව විද්‍යාලය | 1720 | 1176 | 2033 |
| 2 | 1920 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 2661 | 1574 | 2497 |
| 3 | 2018 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | 4543 | 1181 | 2115 |
| 4 | 2197 | මොරටුව විශ්ව විද්‍යාලය | 3644 | 1957 | 2543 |
| 5 | 2397 | රුහුණු විශ්ව විද්‍යාලය | 5973 | 2024 | 2204 |
| 6 | 3014 | රජරට විශ්ව විද්‍යාලය | 4885 | 2820 | 3482 |
| 7 | 3035 | කැලණිය විශ්ව විද්‍යාලය | 5773 | 1634 | 3550 |
| 8 | 3726 | යාපනය විශ්ව විද්‍යාලය | 8165 | 2320 | 3878 |
| 9 | 4016 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | 7827 | 3201 | 4270 |
| 10 | 4335 | ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය | 11017 | 2935 | 4226 |
| 11 | 4378 | ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය | 10667 | 3177 | 4344 |
| 12 | 5089 | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය | 11108 | 8368 | 3826 |
| 13 | 5767 | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය | 7216 | 3029 | 6591 |
| 14 | 6567 | ශ්‍රී ලංකා තාක්ෂණ විශ්ව විද්‍යාලය | 4124 | 6013 | 7222 |
| 15 | 7305 | ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය | 8824 | 3502 | 7222 |
| 16 | 7455 | ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාලය | 9480 | 3376 | 7222 |
| 17 | 7894 | ශ්‍රී ලංකා දකුණු නැගෙනහිර විශ්ව විද්‍යාලය | 10367 | 3620 | 7222 |
| 18 | 10614 | NSBM හරිත විශ්ව විද්‍යාලය | 12120 | 6779 | 7222 |
| 19 | 11911 | Informatics Institute of Technology Sri Lanka | 12700 | 7460 | 7222 |
| 20 | 11924 | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 13225 | 7229 | 7222 |
| 21 | 12842 | ශ්‍රී ලංකා මූලික අධ්‍යාපන ජාතික ආයතනය | 17976 | 4796 | 7222 |

# 22. පර්යේෂණ සහ සංවර්ධන 2023

*22.1 පර්යේෂණ නිමැවුම් පිළිබඳ තොරතුරු – 2023*

*22.2 පේටන්ට් බලපත්‍ර පිළිබඳ තොරතුරු – 2023*

*22.3 විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුම් 2023*

*22.4 සාමාන්‍ය ජනතාව වෙත දැනුම බෙදා හැරීම පිළිබඳ විස්තර - 2023*

## 22.1 පර්යේෂණ නිමැවුම් පිළිබඳ තොරතුරු – 2023

| | ප්‍රකාශන වර්ගීකරණය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | **දේශීය ප්‍රකාශන** | **විදේශීය ප්‍රකාශන** |
| 1 | ඊ ජර්නල් ද ඇතුළුව තීරක සුවිගත සඟරාවල පලකරන ලද ප්‍රකාශන සංඛ්‍යාව | | **3** | **19** |
| 2 | ඊ ජර්නල් ද ඇතුළුව තීරක සුවිගතනොවන සඟරාවල පලකරන ලද ප්‍රකාශන සංඛ්‍යාව | | **6** | **3** |
| 3 | සම්මන්ත්‍රණ කටයුතු | 3.1 සම්පූර්ණ පත්‍රිකා ලෙස ප්‍රකාශයට පත් කරන ලද පත්‍රිකා සංඛ්‍යාව | **32** | |
| | | 3.2 ප්‍රකාශයට පත් කරන ලද සාරාංශ ප්‍රකාශන සංඛ්‍යාව | **35** | **13** |
| 4 | ප්‍රකාශයට පත් කරන ලද කෘති පරිච්ඡේද සංඛ්‍යාව | | **5** | **3** |
| 5 | ප්‍රවීණතා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද කෘති/පෙළ පොත් ගණන | 5.1 ප්‍රකාශකයෙකු විසින් | **2** | **-** |
| | | 5.2 කතෘ විසින් | **-** | **-** |

## 22.2 පේටන්ට් බලපත්‍ර පිළිබඳ තොරතුරු - 2023

| **පේටන්ට් බලපත්‍රයේ නම** | **පාර්ශවකරු/ පාර්ශවකරුවන්ගේ නම/නම්** | **වර්තමාන තත්ත්වය** | | | |
|---|---|---|---|---|---|
| **1. ජාතික** | | **ගොනු කරන ලදී** | **වෙන් කරන ලදී** | **මාරු කරන ලදී** | **විකුණන ලදී/බලපත්‍ර ලබා දෙන ලදී** |
| මාළු සමෙහි ඇති කොලජන් නිස්සාරණය කිරීමේ අඩු වියදම් ක්‍රමවේදයක් | මහාචාර්ය එම්.ඩී.එස්.ටී ද ක්‍රෑස් | පිළිගෙන ඇත | | | |
| සුදුපාදඇති ඉස්සන්, නිල් කකුළුවන් සහ යෝධ මිරිදිය ඉස්සන් කටු අපද්‍රව්‍ය වලින් chitosan නිස්සාරණය කිරීමේ සරල ක්‍රමවේදයක් | ආචාර්ය එස්.ටී. ගෝනාපීනුවල | පිළිගෙන ඇත | | | |

## 22.3 විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුම් – 2023

| පීඨයේ නම | විද්‍යා තාක්ෂණ සංවර්ධන නිමැවුමේ නම | | තත්ත්වය | | |
|---|---|---|---|---|---|
| | | | සංවර්ධනය කරන ලදි | මාරු කරන ලදි | වාණිජකරණය / ප්‍රකාශනය කරන ලදී |
| නව නිෂ්පාදන/ක්‍රියාවලි සංවර්ධනය කිරීම | | | | | |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | තෙල් මත පදනම් වූ මිරිදිය ටින් මාළු (විශේෂ 2) | සී.සී.වල්පිට මිය ආචාර්ය ඩබ්ලිව්.එම්.එච්.කේ විජේනායක | √ | | |
| | ක්ෂාර මත පදනම් වූ මිරිදිය ටින් මාළු (විශේෂ 2) | | √ | | |
| | මිරිදිය ඉස්සන් ඇතුළත් චීස් | මහාචාර්ය එම්.ඩී.එස්.ටී ද ක්‍රෑස් ආචාර්ය එස්.ටී. ගෝනාපීනුවල | √ | | |
| | A pwtocal to recover fish oil farm collagen processing wastewater | | √ | | |
| | රූපලාවණ්‍ය යෙදුම් සඳහා කොලජන් හයිඩ්‍රයිසේට් | | √ | √ | සෙරන්ඩිබ් නැචුරල් (පුද.) සමාගම සමඟ අනාවරණය නොකළ ගිවිසුම. |
| | Sea cucumber gut waste වලින් සාදන ලද මාළු කෑම | ආචාර්ය ජී.නිශාන්තන් | √ | | |
| තාක්ෂණ | Waya One-dish ආහාර සැකසුම | | | | |
| 2. පවතින නිෂ්පාදනයේ/ක්‍රියාවලියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම | | | | | |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | කඩොලානශාඛ ගෙඩිවලින් මාෂ්මෙලෝස් නිෂ්පානය | එස් ඩබ්ලිව් වීරසූරිය මෙනවිය මහාචාර්ය ජේ.ඒ.ඩී.ඩී.එස් ජයකොඩි මහාචාර්ය ආර්.ජී.එස්. විජේසේකර | √ | | |
| 3. සැලසුම් මූලාකෘති සංවර්ධනය | | | | | |
| වෛද්‍ය විද්‍යා | රෙදිපිළි අපජල පිරිපහදු ඒකකය | ආචාර්ය ඊඑම්එස් ඒකනායක | √ | | |
| | උසස් තාක්ෂණය මත පදනම්වූ හරිතාගාර නිරීක්ෂණ පද්ධතිය | ආචාර්ය ජී නිශාන්තන් | √ | | |
| තාක්ෂණ | ජෛව ස්කන්ධ පයිරොලිසිස් පද්ධතියක් පරීක්ෂා කිරීම සහ ගොනු කිරීම සඳහා පේටන්ට් බලපත්‍රයක් සකස් කිරීම | | √ | | |

## 22.4 පොදු ජනතාවට දැනුම ලබා දීම පිළිබඳ තොරතුරු - 2023

| පීඨය | ප්‍රවර්ගය | වැඩසටහනේ නම | සහභාගී වූ සංඛ්‍යාව | ඉලක්කගත කණ්ඩායම |
|---|---|---|---|---|
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | (වැඩමුළු/පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන් / මාධ්‍ය වැඩසටහන්) | | | |
| | වැඩමුළු පැවැත්වීම | - | - | |
| | පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන් පැවැත්වීම | කඩොලාන සඳහා මාර්ගෝපදේශ සකස්කිරීම | 2 | |
| | ප්‍රදර්ශන/ප්‍රසිද්ධ පදිරිපත්කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම | තෙත්බිම් දිනය පිළිබඳ ප්‍රධාන දේශනය | 2 | |
| | ගුවන්විදුලි/ රූපවාහිණී/වෙනත් වැඩසටහන් සඳහා සහභාගී වීම | කඩොලාන දින රූපවාහිනී වැඩසටහන | 2 | |
| | වෙනත් (සඳහන් කරන්න) | විද්‍යා හා තාක්ෂණ විෂය ප්‍රවර්ධනය (රන්වැල්ල රාජකීය විද්‍යාලය) | 75 | අ.පො.ස.(සා/පෙ) සිසුන් |
| | | ජලජීවී වගාව විසිතුරු මත්ස්‍ය වගාව සහ ජලජ ශාක රෝපනය පිළිබඳ පුහුණුව | 70 | ජෛව පද්ධති විෂය ධාරාවේ ගුරුවරුන් සහ සිසුන් (කුලියාපිටිය අධ්‍යාපන කලාපය) |
| **පුස්තකාල** | වැඩමුළු පැවැත්වීම | සේවා ගුණාත්මකභාවය තුළින් පුස්තකාල කාර්ය මණ්ඩලයේ කාර්ය සාධනය වර්ධනය පිළිබඳ වැඩමුළුව: සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දෙන ආකාරය සහ ලිඛිත පරීක්ෂණයකට සූදානම් ආකාරය. | 10 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පීඨ පුස්තකාලවල පුස්තකාල තොරතුරු සහකාරවරුන් සහ පුස්තකාල සහායකයින් |
| | | මාර්ගගත සම්පත් සඳහා සුහුරු සෙවුම් ක්‍රම | 133 | අවසාන වසරේ (4 වන වසර) උපාධි අපේක්ෂකයින් |
| | | මාර්ගගත සම්පත් සඳහා ස්මාර්ට් සෙවුම් ක්‍රම | 52 | ආහාරවල ගුණාත්මකභාවය පිළිබඳ උපාධි අපේක්ෂකයින් |
| | | විද්‍යාත්මක ලිවීම සඳහා පරිශීලන කළමනාකරණ මෙවලම් | 52 | ආහාරවල ගුණාත්මකභාවය පිළිබඳ උපාධි අපේක්ෂක සිසුන් (බාහිර) |
| | | විද්‍යාත්මක ලිවීම සඳහා පරිශීලන කළමනාකරණ මෙවලම් | 82 | ජෛව පද්ධති අධ්‍යයනාංශයේ 3 වන වසර සිසුන් |
| | | පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා ක්ලවුඩ් මත පදනම් වූ සේවාව | 16 | වයඹ විශ්වවිද්‍යාල පුස්තකාල ජාලයේ සහකාර ලේඛකාධිකාරී/LS, පුස්තකාල තොරතුරු සහකාර |

| | | | | |
|---|---|---|---|---|
| | | | | සහ පුස්තකාල අභ්‍යාසලාභීන් (WULN) |
| | | පර්යේෂණ සඳහා සුහුරු සෙවුම් ක්‍රම | 52 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රඥයින් / පර්යේෂකයන් / තරුණ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ පශ්චාත් උපාධි සිසුන් |
| | | විද්‍යාත්මක සාහිත්‍ය සමාලෝචනය සහ ග්‍රන්ථ නාමාවලිය මෘදුකාංගයක් මගින් උපුටා දක්වන ලද හෝ යොමු කරන ලද සඟරා ලැයිස්තුවක ග්‍රන්ථ නාමාවලිය පවත්වාගෙන යන ආකාරය | 20 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වැවිළි කළමනාකරණ පීඨයේ උද්‍යාන විද්‍යා හා භූ දර්ශන උද්‍යාන අධ්‍යයනාංශයේ 3 වන වසරේ සිසුන් |
| | | විද්‍යාත්මක සාහිත්‍ය සමාලෝචනය සහ ග්‍රන්ථ නාමාවලිය මෘදුකාංගයක් මගින් උපුටා දක්වන ලද හෝ යොමු කරන ලද සඟරා ලැයිස්තුවක ග්‍රන්ථ නාමාවලිය පවත්වාගෙන යන ආකාරය | 32 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශයේ 3 වන වසර සිසුන් |
| | පුහුණු වැඩසටහන්/ක්ෂේත්‍ර ආදර්ශන වැඩසටහන් පැවැත්වීම | විද්‍යාත්මක සාහිත්‍ය සමාලෝචනය සහ ග්‍රන්ථ නාමාවලිය මෘදුකාංගයක් මගින් උපුටා දක්වන ලද හෝ යොමු කරන ලද සඟරා ලැයිස්තුවක ග්‍රන්ථ නාමාවලිය පවත්වාගෙන යන ආකාරය | 17 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වැවිළි කළමනාකරණ පීඨයේ උද්‍යාන විද්‍යා හා භූ දර්ශන උද්‍යාන අධ්‍යයනාංශයේ 3 වන වසරේ සිසුන් |
| | | විද්‍යාත්මක සාහිත්‍ය සමාලෝචනය සහ ග්‍රන්ථ නාමාවලිය මෘදුකාංගයක් මගින් උපුටා දක්වන ලද හෝ යොමු කරන ලද සඟරා ලැයිස්තුවක ග්‍රන්ථ නාමාවලිය පවත්වාගෙන යන ආකාරය | 32 | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශයේ 3 වන වසර සිසුන් |
| | | මෙන්ඩේලි: විද්‍යාත්මක ලිපි ලිවීම සඳහා විමර්ශන කළමනාකරණ මෙවලම් | 14 | ශාස්ත්‍රඥයින්, පර්යේෂකයන් සහ පශ්චාත් උපාධි සිසුන් |

# 23.වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන

*23.1* පුස්තකාලය

*23.2* ශාරීරික අධ්‍යාපන අංශය

*23.3* වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

*23.4* තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය පරිශ්‍රය

*23.5* තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය

*23.6* කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

*23.7* වෛද්‍ය මධ්‍යස්ථානය

# 23.1 පුස්තකාලය

## 23.1.1. පසුබිම් තොරතුරු

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය පුස්තකාල තුනකින් සමන්විත වේ. එක් පුස්තකාලයක් කුලියාපිටිය පරිශ්‍රයේ ව්‍යවහාරික විද්‍යා, ව්‍යාපාර අධ්‍යයන සහ මූල්‍ය, තාක්ෂණ පීඨ සඳහාත්, අනෙක් පුස්තකාල දෙක ලබුයාය පරිශ්‍රයේ වෛද්‍ය පීඨය සඳහාත්, මාකඳුර පරිශ්‍රයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨ සඳහාත් අනුපිළිවෙලින් වෙන් කර තිබේ.

## 23.1.2 ගොඩනැගිල්ල

<u>**කුලියාපිටිය පිහිටි පුස්තකාලය**</u>

කුලියාපිටිය පුස්තකාලය පැරණි පරිපාලන ගොඩනැගිල්ලේ පළමු මහලේ වම් පස පිහිටුවා ඇත. 2008 වසර අවසානයේ විශ්වවිද්‍යාල පරිපාලන කාර්යාලය මාරු කිරීමෙන් පසු ගොඩනැගිල්ලේ අනෙක් කොටසක් පුස්තකාලය වෙත ලබා දුන් අතර එය වත්මන් පුස්තකාලය දක්වා පුළුල් විය. මේවන විට පුස්තකාල ගොඩනැගිල්ලේ සම්පූර්ණ බිම් ප්‍රමාණය වර්ග අඩි 7326 කින් සමන්විත වන අතර ආසන ධාරිතාව ආසන 70 කි.

<u>**මාකඳුර පිහිටි පුස්තකාලය**</u>

මාකඳුර පුස්තකාලය පීඨ දෙකක් අතර සහ පරිශ්‍රයේ ප්‍රධාන මාර්ගයට ආසන්නව පිහිටා ඇත. පුස්තකාලය සඳහා අළුතින් වෙනම දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබෙන අතර, එහි භූමි ප්‍රමාණය දළ වශයෙන් වර්ග අඩි 7200 ක් වේ. මෙහි ආසන ධාරිතාව ආසන 70 කි. මෙම ගොඩනැගිල්ල 2006 ජූලි 27 වන දින විවෘත කරන ලදී.

<u>**ලබුයාය පිහිටි පුස්තකාලය**</u>

ලබුයායේ පුස්තකාලය පරිපාලන ගොඩනැගිල්ල සහ පරිගණක විද්‍යාගාරය අතර පිහිටා ඇත. පුස්තකාලය සතුව අළුතින් ඉදිකළ වෙනම දෙමහල් ගොඩනැගිල්ලක් තිබේ. එය දළ වශයෙන් වර්ග අඩි 5,000,000 ක බිම් ප්‍රමාණයෙන් යුක්ත වන අතර ආසන 134 ක ධාරිතාවයකින් සමන්විත වේ. මෙම ගොඩනැගිල්ල 2021 අප්‍රේල් 07 වන දින විවෘත කරන ලදී.

## 23.1.3 පුස්තකාල දිශානති වැඩසටහන්

කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍ර සඳහා බඳවාගත් නවක සිසුන් සඳහා පහත දක්වා ඇති පරිදි පුස්තකාල දිශානති වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී:

- තාක්ෂණ පීඨය : 2023 ජූනි 22 දින
- ව්‍යවහාරික විද්‍යා පීඨය : 2023 අගෝස්තු 25 වැනි දින
- ව්‍යාපාර අධ්‍යයන සහ මූල්‍ය පීඨය : 2023 සැප්තැම්බර් 13 වැනි දින
- පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය : 2023 අගෝස්තු 23 දින
- කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය: 2023 ඔක්තෝබර් 03 සහ 04 යන දිනයන්හිදී

### 23.1.4 සහභාගී වූ වැඩමුළු

ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර එස්.පී.ජේ. මුතුගලගේ මිය, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර ජේ.ඒ.එන්. ජයකොඩි මිය, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර එච්.ඒ.එන්. විජේකෝන් මිය, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර, ඩබ්ලිව්.ඒ.එම්.එස්. බණ්ඩාර මයා, පුස්තකාල තොරතුරු සහකාර ජේ.ඒ.එස්. ජයසිංහ මයා, පුස්තකාල තොරතුරු සහකාර ඩබ්ලිව්.එම්.ඩී.එස්. දයානන්ද මිය, පුස්තකාල තොරතුරු සහකාර පී.එම්.සී.ඊ.පතිරාජ මෙනවිය, පුස්තකාල තොරතුරු සහකාර ටී.ආර්.පී.ඩී. විජේසිංහ මිය, පුස්තකාල තොරතුරු සහකාර බී.එම්.එස්.ඩී. රාජපක්ෂ මිය, පුස්තකාල තොරතුරු සහකාර කේ.එම්.එස්. සමන්තිකා මිය, පුස්තකාල තොරතුරු සහකාර ආර්.ඒ.ආර්.ඩී. රණවීර යන අය 2023 අගෝස්තු 29 වැනි දින ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ පරිගණක විද්‍යාගාරයේදී වයඹ විශ්වවිද්‍යාල පුස්තකාල ජාලය මගින් පවත්වන ලද "ක්ලවුඩ් පාදක සේවා" පිළිබඳ පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා වූ වැඩමුළුව සඳහා සහභාගී වූහ.

### 23.1.5 ප්‍රකාශන

<u>විස්තාරිත සාරාංශය</u>

- ඩබ්ලිව්.එම්. තුසිතා කුමාරි සහ එම්.කේ. වීරසිංහ ශාස්ත්‍රීය පුස්තකාල ප්‍රවේශය: කුරුණෑගල දිස්ත්‍රික්කයේ ශාරීරික යෝග්‍යතා පුහුණුකරුවන් සඳහා විද්‍යුත් පරිසරයේ තොරතුරු සාක්ෂරතාවයේ අදාළත්වය. 2023 නොවැම්බර් 28-29 කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලද පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ ක්‍රියාකාරකම් (ICLIM) 2023 දී ඉදිරිපත් කරන ලදී. pp. 212-216

- ඩබ්ලිව්.එම්. තුසිතා කුමාරි, ශාස්ත්‍රීය පුස්තකාලවල පරිශීලක අධ්‍යාපන වැඩසටහන් පිළිබඳ උපාධි අපේක්ෂකයින්ගේ සංජානනය යන මැයෙන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ සිද්ධි අධ්‍යයනයක්. 2023 ඔක්තෝබර් 26 දින ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාල සංගමය විසින් සංවිධානය කළ විශ්වවිද්‍යාල පුස්තකාල සංගමයේ 13 වැනි ජාත්‍යන්තර සමුළු ක්‍රියාකාරාකම් 2023 හි දී ඉදිරිපත් කරන ලදී. pp.47-52

- සියඹලාපිටිය, එස්.සී.දේශානි සහ ඩබ්ලිව්.එම්. තුසිතා කුමාරි "ඉංජිනේරු" විද්‍යුත් සඟරාවේ ගවේෂණ: ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සඟරාව: 2005 සිට 2022 දක්වා කාර්ය සාධන විශ්ලේෂණයක්. 2023 ඔක්තෝබර් 08 දනෙ ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ඩිජිටල් යුගයේ පුස්තකාලවල පරිවර්තනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ (ICNATLIB 2023) පැවැති ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ ක්‍රියාකාරාකම් යටතේ ඉදිරිපත් කරන ලදී. . pp. 9-15

<u>සාරාංශ</u>

- ඩබ්ලිව්.එම්. තුසිතා කුමාරි1, කේ.ජී.අයි ජයවර්ධන2 සහ ඒ.පී.එම්.එම්.ඩී.බී. දයානන්ද3 (2023). ගුරු පුස්තකාලයාධිපතිවරුන්ගේ රැකියා තෘප්තිය: කුලියාපිටිය අධ්‍යාපන කලාපය, පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ICLIS 2023: "පරිවර්තනය සඳහා උත්ප්‍රේරක ලෙස පුස්තකාල: වඩා හොඳ ලෝකයක් සඳහා ඔරොත්තු දෙන ජාතීන්" යන මැයෙන් ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් 2023 ජූනි 27 සංවිධානය කරන ලද මාර්ගගත සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලදී. 28 පි.

- ඒ.පී.එම්.එම්.ඩී.බී. දයානන්ද1, ඩබ්ලිව්.එම්. තුසිතා කුමාරි2 සහ කේ.ජී.අයි. ජයවර්ධන3 (2023). ශාස්ත්‍රීය පුස්තකාලවල පර්යේෂණ සහාය සේවා පිළිබඳ පරිශීලකයන්ගේ දැනුවත්භාවය පිළිබඳ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ සිද්ධි අධ්‍යයනයක්. පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ ක්‍රියාකාරකම් ICLIS 2023: "පරිවර්තනය සඳහා උත්ප්‍රේරක ලෙස පුස්තකාල: වඩා හොඳ ලෝකයක් සඳහා ඔරොත්තු දෙන ජාතීන්" යන මැයෙන් 2023 ජූනි 27 වැනි දින ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් සංවිධානය කරන ලද මාර්ගගත සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලදී. 59 පි.

- ඒ.පී.එම්.එම්.ඩී.බී දයානන්ද සහ එම්.කේ වීරසිංහ (2023) විසින් "විශ්වවිද්‍යාල සිසුන් විසින් කැලණිය, පේරාදෙණිය සහ වයඹ විශ්වවිද්‍යාල පුස්තකාල පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් පුස්තකාල ද්‍රව්‍ය අවභාවිතය පිළිබඳ අධ්‍යයනයක්", යන මැයෙන්වූ සාරාංශයක් ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශය විසින් 2023 නොවැම්බර් 30 දින සංවිධානය කරන ලද පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICLIM - 2023) හිදී ඉදිරිපත් කරනලදී.

- ඒ.පී.එම්.එම්.ඩී.බී දයානන්ද, කේ.ජී.අයි ජයවර්ධන සහ පී.ඩබ්ලිව්.ඒ.එස්.ඩී. රන්සර (2023) "ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් විසින් පර්යේෂණ ආධාරක සේවා සහ මෙවලම් භාවිතය.", යන මැයෙන්වූ සාරාංශයක් ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශය විසින් 2023 නොවැම්බර් 29- 30 දින සංවිධානය කරන ලද පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICLIM - 2023) හිදී ඉදිරිපත් කරනලදී.

- පී.ඩබ්ලිව්.ඒ.ඩී රන්සර, ඒ.පී.එම්.එම්.ඩී.බී දයානන්ද සහ පූජ්‍ය සීවලී, පලුකන්දේවේ හිමි (2023) විසින් "වැඩිදියුණු කළ පුස්තකාල සේවා සඳහා සමාජ මාධ්‍ය විශ්ලේෂණ උත්තේජනය කිරීම: පරිශීලක නියැලීම සහ ප්‍රතිපෝෂණ පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්" (ICLIM) යන මැයෙන්වූ සාරාංශයක් ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශය විසින් 2023 නොවැම්බර් 29- 30 දින සංවිධානය කරන ලද පුස්තකාල සහ තොරතුරු කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICLIM - 2023) හිදී ඉදිරිපත් කරනලදී.

### 23.1.6 පවත්වන ලද වැඩමුළු/පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ/වෙබ්නාර් වැඩසටහන් වැඩමුළු

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වැඩබලන පුස්තකාලයාධිපති ඩබ්ලිව්.එම් තුසිතා කුමාරි මහත්මිය විසින් 2023 ජනවාරි 12, 17 සහ 20 යන දිනයන්හිදී කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 4 වන වසරේ සිසුන් සඳහා "අන්තර්ජාල සම්පත් සඳහා ස්මාර්ට් සෙවුම් ක්‍රම" යන මැයෙන් පවත්වන ලද වැඩමුළුව.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වැඩබලන පුස්තකාලයාධිපති ඩබ්ලිව්.එම් තුසිතා කුමාරි මහත්මිය විසින් 2023 ජූනි 20 වැනි දින පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ආහාර තත්ත්ව කළමනාකරණ උපාධි පාඨමාලාවේ උපාධි අපේක්ෂකයින් සඳහා "අන්තර්ජාල සම්පත් සඳහා ස්මාර්ට් සෙවුම් ක්‍රම" යන මැයෙන් පවත්වන ලද වැඩමුළුව.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති ඒ.පී.එම්.එම්.ඩී.බී දයානන්ද මහතා විසින් 2023 ජූනි 1 වැනි දින කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ජෛව පද්ධති ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ 3 වන වසරේ සිසුන් සඳහා "විද්‍යාත්මක ලිවීම සඳහා යොමු කළමනාකරණ මෙවලම්" යන මැයෙන් පවත්වන ලද වැඩමුළුව.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති ඒ.පී.එම්.එම්.ඩී.බී දයානන්ද මහතා විසින්2023 ජූනි 30 වැනි දින පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ආහාර තත්ත්ව කළමනාකරණ උපාධි වැඩසටහනේ (බාහිර) උපාධි අපේක්ෂකයින් සඳහා "විද්‍යාත්මක ලිවීම සඳහා යොමු කළමනාකරණ මෙවලම්" යන මැයෙන් පවත්වන ලද වැඩමුළුව.

- 2023 අගෝස්තු 29 වැනි දින ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ පරිගණක රසායනාගාරයේදී පුස්තකාල ජාලයේ පුස්තකාල තොරතුරු සහකාරවරුන් සඳහා වයඹ විශ්වවිද්‍යාල පුස්තකාල ජාලය විසින් පවත්වන ලද "පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා ක්ලවුඩ් පදනම් සේවා" පිළිබඳ වැඩමුළුව.

<u>වෙබ්නාර් වැඩසටහන්</u>

- 2023 ජූලි 14 වැනි දින ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්, පර්යේෂකයන් සහ පශ්චාත් උපාධි සිසුන් සඳහා "පර්යේෂකයන් සඳහා ස්මාර්ට් සෙවුම් ක්‍රම" පිළිබඳ වෙබ් වැඩසටහනක් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වැඩබලන පුස්තකාලයාධිපති ඩබ්.එම්. තුසිතා කුමාරි මහත්මිය විසින් පවත්වන ලදී.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ඩී.ජී.ඒ.එස්. මල්කාන්ති මහත්මිය සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති ඒ.පී.එම්.එම්.ඩී.බී. දයානන්ද මහතා විසින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ උද්‍යාන විද්‍යා හා භූ දර්ශන උද්‍යාන අධ්‍යයනාංශයේ අවසන් වසර පර්යේෂණ සිසුන් සහ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශයේ 3 වන වසරේ සිසුන් සඳහා 2023 ජූලි 10 සහ 24 සහ සැප්තැම්බර් 20, 2023 ඔක්තෝම්බර් 05 යන දිනවලදී විද්‍යාත්මක සාහිත්‍ය සමාලෝචනය පිළිබඳව සහ විමර්ශන කළමනාකරණ ග්‍රන්ථ නාමාවලිය මෘදුකාංගයක් (Mendeley) මගින් උපුටා දක්වන ලද හෝ යොමු කරන ලද සඟරාවල ග්‍රන්ථ නාමාවලිය පවත්වාගෙන යන ආකාරය පිළිබඳව වෙබ්නාර් වැඩසටහනක් පවත්වන ලදී.

- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිපති ඒ.පී.එම්.එම්.ඩී.බී. දයානන්ද මහතා විසින් "Mendele: Reference Management tools for Science Lighting" පිළිබඳ වෙබ්නාර් වැඩසටහනක් ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්, පර්යේෂකයන් සහ පශ්චාත් උපාධි සිසුන් සඳහා 2023 ඔක්තෝම්බර් 3 වන දින පවත්වන ලදී.

**23.1.7** ලියාපදිංචි පරිශීලකයින්

අ). කුලියාපිටිය පරිශ්‍රයේ පිහිටා ඇති පුස්තකාලය

| පරිශීලකයන් | 2023.12.31 දක්වා | 2023 වර්ෂයේ දී |
|---|---|---|
| ශිෂ්‍යයන් | 4823 | 893 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය<br>ස්ථිර<br>තාවකාලික | <br>118<br>62 | <br>07<br>22 |
| විධායක කාර්ය මණ්ඩලය | 28 | 02 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 211 | 05 |

ආ). මාකඳුර පරිශ්‍රයේ පිහිටි පුස්තකාලය

| පරිශීලකයන් | 2023.12.31 දක්වා | 2023 වර්ෂයේ දී |
|---|---|---|
| ශිෂ්‍යයන් | 3140 | 583 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය<br>➢ ස්ථිර<br>➢ තාවකාලික | <br>81<br>137 | <br>04<br>32 |
| විධායක කාර්ය මණ්ඩලය | 07 | 00 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 86 | 03 |

ඇ) ලබුයාය පරිශ්‍රයේ පිහිටි පුස්තකාලය

| පරිශීලකයන් | 2023.12.31 දක්වා | 2023 වර්ෂයේ දී |
|---|---|---|
| ශිෂ්‍යයන් | 405 | 158 |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය<br>➢ ස්ථිර<br>➢ තාවකාලික | <br>15<br>24 | <br>03<br>13 |
| විධායක කාර්ය මණ්ඩලය | 01 | 01 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 06 | 03 |

**23.1.8 කෘති හා සඟරා වැය ශීර්ෂය**

<u>පුස්තකාලය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන</u>

කෘති සහ සඟරා – රුපියල් 600,000.00

<u>පිරිවැය</u>

ප්‍රධාන ප්‍රස්තකාලය – කුලියාපිටිය

01 පොත් – රු. 4500.00

### 23.1.9 පොත් තොග

පරිග්‍රහණ ලැයිස්තුව අනුව 2023.12.31 දිනට තිබූ පොත් තොගයේ පැවති මුලු පොත් සංඛ්‍යාව.

**අ).** කුලියාපිටිය පරිශ්‍රෙය් පිහිටා ඇති පුස්තකාලය

| | |
|---|---|
| කුලියාපිටිය පිහිටි පුස්තකාලයේ මුලු පොත් සංඛ්‍යාව | 41,056 |
| 2023 වර්ෂයේ ලද ප්‍රදානයන් (පොත් සංඛ්‍යාව) | 29 |

ආ). මාකඳුර පරිශ්‍රෙය් පිහිටි පුස්තකාලය

| | |
|---|---|
| මාකඳුර පරිශ්‍රෙය් පිහිටි පුස්තකාලයේ මුලු පොත් සංඛ්‍යාව | 19,885 |
| 2023 වර්ෂයේ ලද ප්‍රදානයන් (පොත් සංඛ්‍යාව) | 45 |

ඇ). ලබුයාය පරිශ්‍රෙය් පිහිටි පුස්තකාලය

| | |
|---|---|
| ලබුයාය පරිශ්‍රෙය් පිහිටි පුස්තකාලයේ මුලු පොත් සංඛ්‍යාව | 1,432 |
| 2023 වර්ෂයේ ලද ප්‍රදානයන් (පොත් සංඛ්‍යාව) | 103 |

### 23.1.10 ආදායම – පුස්තකාල දඩමුදල්

(i) කුලියාපිටිය පරිශ්‍රෙය් පිහිටා ඇති පුස්තකාලය

| | |
|---|---|
| නැත්වූ පොත් සඳහා අයකිරීම් | රු.10333.00 |
| නැතිවූ අවසරපත් සඳහා ගාස්තු | රු.. 150.00 |
| පුස්තකාල දඩමුදල් (ප්‍රමාද ගාස්තු) | රු.. 49,795.00 |
| එකතුව | රු.. 60,278.00 |

(ii) මාකඳුර පරිශ්‍රෙය් පිහිටි පුස්තකාලය

| | |
|---|---|
| පුස්තකාල දඩමුදල් (ප්‍රමාද ගාස්තු) | රු. 5,405.00 |

(iii) ලබුයාය පරිශ්‍රෙය් පිහිටි පුස්තකාලය

| | |
|---|---|
| පුස්තකාල දඩමුදල් (ප්‍රමාද ගාස්තු) | රු. 625.00 |
| සමස්ත පුස්තකාල පරිශ්‍රයවලින් ලද මුළු ආදායම | රු. 66,308.00 |

**පොත් බැඳීම් අංශයේ සංඛ්‍යාලේඛන (සංරක්‍ෂණය සහ ආරක්ෂණය**

බඳිනලද පොත් ගණන: 182
(පුස්තකාල ඉල්ලීම් මත = 142 සහ අනෙකුත් අධ්‍යයනාංශවල ඉල්ලීම් මත = 40)

# 23.2 ශාරීරික අධ්‍යාපන ඒකකය

## 23.2.1 හැඳින්වීම

ශාරීරික අධ්‍යාපන ඒකකය යනු විශ්වවිද්‍යාල ප්‍රජාවේ ක්‍රීඩා සහ විනෝද කටයුතු සඳහා අවශ්‍ය පරිසරය සකස් කරමින් එය ප්‍රවර්ධනය කරනු ලබන විශිෂ්ඨ මධ්‍යස්ථානය වේ. සිසුන් සහ කාර්ය මණ්ඩලය යන දෙඅංශයේම සෞඛ්‍ය තත්ත්වය සහ ශාරීරික යෝග්‍යතාවය ඉහළ මට්ටමින් පවත්වා ගනිමින් වැඩ පරිසරය තුල ක්‍රියාකාරී සහයෝගීතාවය ආරක්ෂා කරමින් සෞඛ්‍ය සම්පන්න, ප්‍රීතිමත් සහ වඩාත් සුරක්ෂිත ප්‍රජාවක් නිර්මාණය කිරීමට මං සලසන බව අපි විශ්වාස කරමු.

ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් පවත්වනු ලබන ක්‍රීඩා ක්‍රියාකාරකම් පිළිබඳ මතකයන්, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා සහ දුර්වලතා ඇතුලත් කරමින් මෙම වාර්තාව සකස් කර ඇත. තවද 2023 ජනවාරි 1 සිට 2023 දෙසැම්බර් 31 දක්වා අතර කාලය ආවරණය වන මුල්‍ය ප්‍රකාශන පිළිබඳ දළ විශ්ලේෂණය ද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

## 23.2.2 දැක්ම

සමාජයට මනා සමබරතාවකින් යුතු නිරෝගී පුද්ගලයකු බිහි කිරීම සඳහා පුද්ගලයාගේ කායික, මානසික සහ සමාජ විද්‍යාත්මක අංශ වර්ධනය කිරීම.

## 23.2.3 මෙහෙවර

නිවැරදි මගපෙන්වීම සහ ගුණාත්මක පහසුකම් සම්පාදනය මගින් උපාධි අපේක්ෂකයින්ගේ ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම.

## 23.2.4 ශාරීරික අධ්‍යාපන අංශයේ කණ්ඩායම් ව්‍යුහය



### 23.2.5 බාහිර උපදේශකවරුන්

පහත සඳහන් ක්‍රීඩා කටයුතු වැඩි දියුණු කිරීම සඳහා බාහිර උපදේශකවරුන්ගේ සේවා ලබා ගැනීමට අපට සිදු විය. 2023 වර්ෂයේ අපගේ ඒකකය විසින් අපගේ බලකාය සඳහා සුදුසුකම්ලත් බාහිර උපදේශකවරුන් පහළොස් දෙනකු බඳවා ගැනීමට කටයුතු කළ අතර පහත සඳහන් තරඟ ඉසව් සඳහා ඔවුන් විසින් සක්‍රිය පුහුණුව ලබා දෙන ලදි.

| අංකය | ක්‍රීඩාව | නම | සුදුසුකම් |
|---|---|---|---|
| 1 | කැරම් | බී.ඩී.ආර් කුමාර මහතා | ජාතික ක්‍රීඩකයා - කැරම් |
| 2 | ටයිකොන්ඩෝ | එස්.ඒ.යූ.එස්. ප්‍රනාන්දු මහතා | ලියාපදිංචි පුහුණුකරු |
| 3 | චෙස් | ටී.එම්.ඩී.බී යටිගම්මන මහතා | 1 මට්ටමේ පුහුණුකරු, ජාතික විනිශ්චකරු |
| 4 | පාපන්දු | එස්.ඒ.ඩී.යූ කුමාර මහතා | FA කුසලාන ශූර කණ්ඩායමේ සාමාජික |
| 5 | මල්ලවපොර | කේ.පී.ඩී ප්‍රියන්ත මහතා | පුහුණුකරු, ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| 6 | කරාටේ | එල්.ආර්.ආර්.ජේ. හේරත් මහතා | ජාතික කරාටේ කණ්ඩායමේ සාමාජිකයෙකි |
| 7 | පිහිනීම | එන්.එම්.ජේ.කේ නවරත්න මහතා | පිහිනුම් පුහුණු කිරීමේ විද්‍යාත්මක ක්‍රමය පිළිබඳ හදාරා ඇත |
| 8 | එල්ලේ | ජේ.එම්.තුෂාර චින්තක මහතා | ශූරතා කණ්ඩායමේ සාමාජික - ජාතික ක්‍රීඩා උළෙල |
| 9 | බැඩ්මින්ටන් | එස්.කේ.ඒ.එල්.එම්. අප්පුහාමි මහතා | නවකයන්ගේ තරඟාවලියේ ජයග්‍රාහකයා |
| 10 | රග්බි | එච්.එන්.අබේවික්‍රම මහතා | ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු රග්බි ක්‍රීඩකයෙකි |
| 11 | බර ඉසිලීම | ආර්.පී.එම්.එස්. විජේරත්න මහතා | පුහුණුකරු - ත්‍රිත්ව විද්‍යාලය |
| 12 | වොලිබෝල් | ජයා මහතා | පුහුණුකරු බලපත්‍රය ලබා ඇත |
| 13 | පැසිපන්දු | කේ.සී කුමාර මහතා | පැසිපන්දු පුහුණු කිරීමේ උසස් ඩිප්ලෝමාව |
| 14 | හොකී | මිලාන් බොතේජු මහතා | ආසියානු හොකී සම්මේලනයේ 11 මට්ටමේ පුහුණුකරු |
| 15 | මේස පන්දු | අයි.යූ.බී.කුලතුංග මහතා | ජාත්‍යන්තර මේසපන්දු සම්මේලනයේ 1 මට්ටමේ පුහුණුකරු |

### 23.2.6 වාර්ෂික වැඩසටහන්

ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් වාර්ෂිකව පහත වැඩසටහන් සංවිධානය කරනු ලැබේ.

- අන්තර් පීඨ නවකයන්ගේ ශූරතා
    - මෙම ඉසව්ව නවක සිසුන් (නවකයන්) ඉලක්ක කර සංවිධානය කර ඇති අතර විශ්වවිද්‍යාලය තුළ විවිධ පීඨ අතර පවත්වනු ලබන ක්‍රීඩා තරඟ ඊට ඇතුළත් වේ.
    - එය විශ්වවිද්‍යාලය තුළ තරඟකාරී ක්‍රීඩා හඳුන්වාදීමේ වැඩසටහනක් ලෙස පවත්වනු ලබයි මෙමගින් අළුතෙන් පැමිණෙන සිසුන් අතර ප්‍රජාව පිළිබඳ හැඟීමක් සහ සෞඛ්‍ය සම්පන්න තරඟකාරිත්වයක් ඇති කරයි.

- අන්තර් පීඨ ශූරතා
    - නවකයින්ලේ ශූරතා තරඟ හා සමානව, මෙයට ක්‍රීඩා තරඟ ඇතුළත් වන නමුත් විශ්ව විද්‍යාලය තුළ විවිධ පීඨවල සිටින සියලුම සිසුන් සඳහා මෙය විවෘත වේ.

- නවකයන්ගේ ශූරතාවලට සාපේක්ෂව පුළුල් පරාසයක ක්‍රීඩා ඉසව් සහ ඉහළ මට්ටමේ තරඟ එයට ඇතුළත් විය හැකිය.

❖ අන්තර් විශ්වවිද්‍යාල ශූරතා

- මෙම ක්‍රීඩා උත්සවය විවිධ විශ්වවිද්‍යාල අතර පවත්වනු ලබන තරඟ ඇතුළත් කිරීමින් එහි විෂය පථය පුළුල් කරයි.
- සත්කාරකත්වය දරනු ලබන විශ්වවිද්‍යාලයේ සිසුන් වෙනත් විශ්වවිද්‍යාලවලින් සහභාගිවන තරඟකරුවන්ට එරෙහිව තරඟ කරනු ලබන අතර ආයතනයේ සීමාවෙන් ඔබ්බට ගිය ඉහළ මට්ටමේ තරඟකාරීත්වයක් සහ සහයෝගීතාවයක් ප්‍රවර්ධනය කරයි.

❖ වර්ණ ප්‍රදානෝත්සවය

- මෙම උත්සවය ක්‍රීඩා ක්ෂෛත්‍රෙය් විශිෂ්ටතා දැක්වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීම සහ ඔවුන්ට "වර්ණ" ප්‍රදානය කිරීම පිණිස පවත්වනු ලබන උත්සවයකි.
- "වර්ණ" බොහෝ විට ඉහළ මට්ටමේ ජයග්‍රහණ අත්පත්කරගනිමින් ක්‍රීඩාවේ දස්කම් දැක්වූ පුද්ගලයන්ට ලබා දෙන සංකේතාත්මක සම්මාන වේ. උත්සවයේදී මෙම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජයග්‍රහණ සැමරීම සහ පිළිගැනීම සිදු කරයි.

❖ විනෝදාත්මක වැඩසටහන්

- මෙම වැඩසටහන්වලට සමස්ත යහපැවැත්ම සහ යෝග්‍යතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් තරඟකාරී නොවන, විනෝදජනක ශාරීරික ක්‍රියාකාරකම් ඇතුළත් වේ.
- විනෝදාත්මක වැඩසටහන්වලට තරඟකාරීත්වයට වඩා විනෝදාස්වාදය සඳහා පවත්වනු ලබන සහභාගීත්වය දිරිගන්වන පුළුල් පරාසයක කුසලතා මට්ටම් සහ රුචිකත්වයන් සපුරාලන ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

❖ යෝග්‍යතා වැඩසටහන්

- මෙම වැඩසටහන් මගින් විශේෂයෙන් යෝග්‍යතාවය සහ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම යන කාරණා පිළිබඳ අවධානය යොමු කෙරේ.
- මෙයට යෝග්‍යතා පන්ති, වැඩමුළු හෝ සහභාගිවන්නන්ගේ ශාරීරික යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා නිර්මාණය කර ඇති අභියෝග ආදිය ඇතුළත් වනු ඇත.

❖ දිශානති වැඩසටහන්

- දිශානති වැඩසටහන් බොහෝ විට නව සිසුන්ට ශාරීරික අධ්‍යාපන ඒකකය පිළිබඳව සහ එමගින් පිරිනමනු ලබන වැඩසටහන් පිළිබඳව හඳුන්වා දීම අරමුණු කර ගෙන ඇත.
- මෙයට තොරතුරු සැසි, පහසුකම් චාරිකා සහ ශාරීරික අධ්‍යාපන ඒකකය හරහා ලබා ගත හැකි සම්පත් සහ අවස්ථාවන් පිළිබඳව සිසුන්ට හුරු වීමට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

## XIV වැනි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල (SLUG) - 2023

**14** වැනි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල (SLUG) ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය (SLUSA) විසින් 2023 ජූලි 08 සිට සැප්තැම්බර් 08 දක්වා සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලෙහි පරමාර්ථය වන්නේ මානව ගරුත්වය සුරැකීම සම්බන්ධයෙන් සංවේදී වන සාමකාමී සමාජයක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල සුසංයෝගී සංවර්ධනය සඳහා ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය ලබා දීමයි. මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 16ක නියෝජනයක් විය. මෙහිදී ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ඉසව් 40ක් ඇතුළත් ක්‍රීඩා තරග 24ක් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් 6,000කට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ. බීච් වොලිබෝල් (පිරිමි), කබඩි (පිරිමි) සහ බර ඉසිලීමේ කාන්තා ඉසව් මෙවර ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලට අලුතින් එකතුවූ අංගයන් විය.

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල යනු සෑම වසර තුනකට වරක් රට පුරා සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන් එක් කරමින් ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල අතර මාරුවෙමින් පවත්වනු ලබන අතිශය බලාපොරොත්තු සහගත වැඩසටහනකි. මෙම උත්සවය පැවැත්වීම විශ්වවිද්‍යාලයට සහ සමස්ත දිවයිනටම ක්‍රීඩා දියුණුව සහ සාමකාමී සමාජයක් ප්‍රවර්ධනය කිරීමට ලැබෙන සුවිශේෂී අවස්ථාවකි. ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්ව විද්‍යාලය විසින් කීර්තිමත් 14 වැනි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල (SLUG) පවත්වන ලදී.

වයඹ විශ්වවිද්‍යාලය ලෙස, 2023 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟාවලියේදී අපගේ පිරිමි සිසුන් ක්‍රීඩා ඉසව් 21ක් සඳහා සහ කාන්තා සිසුන් ක්‍රීඩා ඉසව් 16ක් සඳහා සහභාගී විය.

ඉහත කී තරඟාවලියේ වොලිබෝල් පිරිමි සහ කාන්තා ශූරතා තරඟ නැගෙනහිර විශ්වවිද්‍යාලය වෙනුවෙන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය විසින් 2023 අගෝස්තු 26,27,28 සහ 29යන දිනයන්හිදී වයඹ විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී සංවිධානය කරන ලදී.
මෙම අවස්ථාව සඳහා සියලුම විශ්වවිද්‍යාල නියොජනය කරමින් (කණ්ඩායම් 28ක්) ශිෂ්‍ය ශිෂ්‍යාවන් 224ක් සහ සිසුවියන් 224ක් සහ නිලධාරීන් 90ක් සහභාගි වූහ.

### 23.2.7 ජයග්‍රහණ

2023 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශූරතා තරඟාවලියේ ජයග්‍රහණ

සමස්ත ජයග්‍රහණය : විශ්ව විද්‍යාල 16 අතුරින් 10 වැනි ස්ථානය ලබා ගන්නා ලදි.

*ඒකල ඉසව්*

| ඉසව්ව | වර්ගීකරණය | ස්ත්‍රී පුරුෂ භාවය | නම | ස්ථානය |
|---|---|---|---|---|
| මල්ලවපොර | බර කි.ග්‍රෑ. 79 | පිරිමි | එම්.එම්.එන්.ජේ .කරුණාරත්න | තෙවැනි ස්ථානය |
| | බර කි.ග්‍රෑ. 92 | පිරිමි | කේ.එස්.එස්.ඩී .කුමාර | තෙවැනි ස්ථානය |
| | බර කි.ග්‍රෑ. 97 | පිරිමි | ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්.ජී.ඒ.එන් . සමරනායක | තෙවැනි ස්ථානය |
| | බර කි.ග්‍රෑ. 65 | පිරිමි | ඒ. ඔරින්ග්ස්ටන් | ප්‍රථම ස්ථානය |
| | බර කි.ග්‍රෑ. 125 | පිරිමි | ඒ.වී.එච්.එල් .කුමාර | ප්‍රථම ස්ථානය |
| ටයි කොන්ඩෝ | බර කි.ග්‍රෑ. 125 | පිරිමි | ඩබ්ලිව් .ආර් .එන් .සෝවිස් | තෙවැනි ස්ථානය |

| | | | | |
|---|---|---|---|---|
| | බර කි.ග්‍රෑ. 125 | පිරිමි | එස් .ඒ .පී .බී .සේනානායක | තෙවැනි ස්ථානය |
| මාර්ග ධාවන තරඟය | මාර්ග ධාවන තරඟය | පිරිමි | එල්.ඒ.එම්.ටී.එල්. අධිකාරී | 10 වැනි ස්ථානය |

*කණ්ඩායම් ඉසව්*

| ඉසව්ව | ස්ත්‍රී පුරුෂ භාවය | ස්ථානය |
|---|---|---|
| එල්ලේ | පිරිමි | අවසන් පූර්ව |
| එල්ලේ | කාන්තා | අර්ධ අවසන් පූර්ව |
| බැඩ්මින්ටන් | පිරිමි | අර්ධ අවසන් පූර්ව |
| වොලිබෝල් | පිරිමි | අර්ධ අවසන් පූර්ව |
| නෙට්බෝල් | කාන්තා | අර්ධ අවසන් පූර්ව |
| හොකී | පිරිමි | අර්ධ අවසන් පූර්ව |
| කබඩි | පිරිමි | අර්ධ අවසන් පූර්ව |
| කැරම් | කාන්තා | අර්ධ අවසන් පූර්ව |
| බීච් වොලිබෝල් | පිරිමි | 5 වැනි ස්ථානය |
| රග්බි | පිරිමි | අර්ධ අවසන් පූර්ව |
| ක්‍රිකට් | පිරිමි | අර්ධ අවසන් පූර්ව |

2023 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශූරතා තරඟ සඳහා සහභාගීත්වය

| පීඨය | ව්‍ය.වි.පී | කෘ.වැ.ක.පී | ව්‍යා.අ.මූ.පී | ප.ධී.පෝ.පී | වෛ.පී | තා.පී | මුළු ගණන |
|---|---|---|---|---|---|---|---|
| පීඨය | 35 | 25 | 101 | 7 | 7 | 83 | 258 |
| පිරිමි | 22 | 24 | 44 | 14 | 5 | 17 | 126 |
| ගැහැණු | 57 | 49 | 145 | 21 | 12 | 100 | 384 |
| මුළු එකතුව | 626 | 1136 | 2280 | 764 | 579 | 865 | 6250 |
| ලියාපදිංචි වූ මුළු සංඛ්‍යාව | 9% | 4% | 6% | 3% | 2% | 12% | 6% |






**වර්ණ ප්‍රදාන උළෙල**

2019 වසරේ මහත් අපේක්ෂාක්ව පැවති වර්ණ සම්මාන ප්‍රදානෝත්සවය 2023 ජූලි 20 වැනි දින අසිරිමත් සන්ධ්‍යාවේදී වයඹ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හදවත් තුළ ඉමහත් උද්යෝගයක් දනවමින් පණ්ඩිත් අමරදේව ශ්‍රවණාගාරයේදී පවැත්විණි. මෙම සුවිශේෂී අවස්ථාව සඳහා සම්භාවනීය ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ ජයසිංහ මහතා සහභාගී විය. ඔහු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා ඇගයීමට ලක්කරමින් ජයග්‍රාහකයන්ට සුබ පැතූ අතර ඔවුන්ගේ ක්‍රීඩා දිවියේ සාර්ථක අනාගතයක් වෙනුවෙන් සුබ පැතුම් ද එක් කළේය.

ඉමහත් අභිමානයකට ලක්වූ මෙම උත්සවය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා සභාව සමඟ එක්ව ශාරීරික අධ්‍යාපන ඒකකය විසින් මනාව සංවිධානය කරන ලදී.

### 23.2.8 දිශානති වැඩසටහන්

සුම් තාක්ෂණය ඔස්සේ අතථ්‍ය සැසි පවත්වමින් ඒවා පුද්ගල ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ කර නවකයන් සඳහා දිශානති වැඩසටහන් ඉතා සුපරීක්ෂාකාරීව සංවිධානය කරන ලදී. මෙහි ප්‍රධාන අරමුණ වූයේ ශාරීරික අධ්‍යාපන ඒකකයේ විවිධ අංශ පිළිබඳව සහභාගිවන්නන් මනාව හුරු කරවීම සහ ඒපිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීමයි.
මෙම සැසි හරහා, නවක සිසුන් සඳහා විශ්ව විද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකයේ විෂය පථය සහ ඒකකයේ දැක්ම සහ මෙහෙවර, එහි කාර්යභාරය, විභව වෘත්තීය අවස්ථා, විශ්ව විද්‍යාල පසුබිම තුළ ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ විය හැකි ආකාරය සහ අනාගත ප්‍රතිලාභ සහ ක්‍රීඩා කටයුතුවල නියැලීමේ ප්‍රවණතා පිළිබඳව විස්තර කළෙමු. අතථ්‍ය සහ භෞතික යන දෙආකාරයෙන් වූ මෙම දෙමුහුන් ප්‍රවේශය හරහා සියලුම සහභාගිවන්නන් සඳහා පුළුල් සහ සවිස්තරාත්මක තොරතුරු අත්දැකීමක් ලබාගැනීමට අවකාශ විවර විය.

### 23.2.9 ක්‍රීඩා විද්‍යා සහ අභ්‍යාස පිළිබඳ වැඩමුළුව

අපගේ ඒකකය විසින් 2023 අප්‍රේල් 26 වන දින පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ පෝෂණ අධ්‍යයනාංශයේ තෙවන වසරේ සිසුන් සඳහා ක්‍රීඩා විද්‍යා හා අභ්‍යාස පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. එය ඔවුන්ගේ අධ්‍යයන විෂයයන්ට අදාළව ශාරීරික යෝග්‍යතා සහ ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳ සිය දැනුම ඉහළ නැංවීමට අනගි අවස්ථාවක් විය.

### 23.2.10 ප්‍රාදේශීය ක්‍රීඩා සංවර්ධනය සඳහා දායකත්වය

ප්‍රධාන වශයෙන් ක්‍රීඩා ඉලක්ක කරගත් වැඩසටහන් පැවැත්වීම සහ ක්‍රීඩා ක්ෂේත්‍රවල උපකරණ සහ පහසුකම් ලබාදීම හරහා ප්‍රාදේශීය වශයෙන් ක්‍රීඩා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රීඩා සේවා සපයන්නෙමු.

**ගෘහස්ත ක්‍රීඩාගාර වෙන්කර ගැනීම**

| දිනය | ආයතනය හෝ සමාගම | ඉසව්ව | කාලසීමාව |
|---|---|---|---|
| 2023.03.23 | ස්ලිම්ටෙක්ස් | බැඩ්මින්ටන් | පැය 2 යි |
| 2023.03.27 | ස්ලිම්ටෙක්ස් | බැඩ්මින්ටන් | පැය 2 යි |
| 2023.03.27 | මාස් | බැඩ්මින්ටන් | පැය 2 යි |
| 2023.03.28 | ස්ලිම්ටෙක්ස් | බැඩ්මින්ටන් | පැය 2 යි |
| 2023.04.06 | ඩබ්ලිව්.ඒ.එස්.විජේවීර | බැඩ්මින්ටන් | දින බාගයයි |
| 2023.07.04 | එම්.ජී.එස්.අමල් | බැඩ්මින්ටන් | දින බාගයයි |
| 2023.07.05 | ඩබ්ලිව්.එම්.පී.විජේසූරිය | වොල්බෝල් | දින බාගයයි |
| 2023.07.26 | සිරියෝ ක්‍රීඩා | නෙට්බෝල් | දින බාගයයි |
| 2023.09.04 | සිරියෝ ස්පෝර්ට්ස් | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.11 | ධම්මිස්සර විද්‍යාලය | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.11 | ධම්මිස්සර විද්‍යාලය | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.12 | වික්‍රමශිලා ම.වි | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.13 | අයි.එන්.ජයා | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.14 | මාස් | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.15 | ධම්මිස්සර විද්‍යාලය | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.20 | මාස් | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.20 | මාස්- ස්ලිම්ලයින් | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.20 | උහුමිය විද්‍යාලය | වොල්බෝල් | දින බාගයයි |
| 2023.09.23 | යුනිවෙලා | වොල්බෝල් | දින බාගයයි |
| 2023.10.02 | මන්චි තරඟාවලිය | වොල්බෝල් | දින බාගයයි |
| 2023.11.13 | මාස්- ස්ලිම්ලයින් | වොල්බෝල් | දින බාගයයි |
| 2023.11.17 | ශෂේන් සිල්වා | වොල්බෝල් | දින බාගයයි |

### 23.2.11 මූල්‍ය ප්‍රකාශනය

| අංකය | විස්තරය | ගණන (රු.) |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමයේ ඇතුළත් වීමේ සහ දායක මුදල් | 205,000.00 |
| 2 | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ශූරතා 2023 | 388,679.25 |
| 3 | තරඟ සංවිධානය කිරීම- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා වොලිබෝල් ශූරතාවලිය 2023 | 972,390.00 |
| 4 | පුහුණුවීම් සහ පුහුණුවීම් තරඟය | 0 |
| 5 | ජාතික තරඟාවලිය | 59,514.00 |
| 6 | වෙනත් තරඟාවලිය | 3,500.00 |

| | | |
|---|---|---|
| 6 | ජාතික සම්මේලන ගාස්තු | 26,500.00 |
| 7 | බාහිර උපදේශකයින්ගේ ගෙවීම් | 808,500.00 |
| 8 | වෙන්කිරීම (පිහිනුම් තටාකය) | 108,000.00 |
| 9 | සහතික | 33,850.00 |
| 10 | සුළු මුදල් | 190,048.20 |
| 11 | ක්‍රීඩා ඇඳුම් දීමනාව | 1,306,000.00 |
| 12 | ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම | 7,149,525.00 |
| 13 | වර්ණ ප්‍රදාන උළෙල | 387,731.00 |
| මුලු වාර්ෂික වියදම් | | **11,639,237.45** |

**මුල් වාර්ෂික ආදායම්**

| අංකය | විස්තරය | ගණන (රු.) |
|---|---|---|
| 1 | ගෘහස්ථ ක්‍රීඩාංගනය වෙන්කිරීමේ ආදායම | 201,000.00 |
| | මුලු වාර්ෂික ආදායම | **201,000.00** |

### 23.2.12 යෝජනා

පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතුයි.

- අන්තර් පීඨ නවක ශූරතා සහ අන්තර් පීඨ ශූරතා සංවිධානය කිරීම සඳහා සෑම වසරකම සියලුම පීඨවල අධ්‍යයන දින දර්ශනවල එකම කාලසීමාවක් වෙන් කිරීම.
- විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම්වල දී විශිෂ්ට දක්ෂතා පෙන් වූ සිසුන්ගේ GPA අගය සඳහා අමතර ලකුණු කිහිපයක් වෙන් කිරීම . උදා: විශ්වවිද්‍යාල වර්ණ, ශ්‍රී.ලං.වි.ක්‍රී. සං. වර්ණ, ජාතික විශ්වවිද්‍යාල කණ්ඩායම් නියෝජනය, අන්තර් ජාතික සහභාගීත්වය ආදිය සඳහා.
- අවම වශයෙන් සවස 4.30 වන විට වත් සිසුන් අධ්‍යයන කටයුතුවලින් නිදහස් කිරීම.
- ක්‍රීඩා ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීම සඳහා සිසුන් දිරිමත් කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය ලබා දෙන සහයෝගය ඉහළ නැංවීම.
- විශ්ව විද්‍යාලය නියෝජනය කරමින් ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම්වලට සහභාගීවීමට සිදු වීමෙන් දේශන මගහැරෙන සිසුන්ට කිසියම් සහනයක් සැලසීම.

## 23.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

### 23.3.1 හැඳින්වීම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) මූලිකත්වයෙන් 2003 ජනවාරි මාසයේ දී පිහිටුවන ලදී. වෘත්තීය මාර්ගෝපදේශ ඒකක (CGU) වැඩ ලෝකයේ වත්මන් අවශ්‍යතා අවබෝධ කර ගැනීමේ වගකීම හඳුනාගෙන ඇති අතර ශ්‍රම වෙළඳපොලේ නැගී එන ප්‍රවණතා ක්‍රියාශීලීව අවබෝධ කර ගනිමින් රැකියා ලෝකයේ පවත්නා ඉල්ලුම සපුරාලීමට හැකියාවැති හැකි මානව සම්පත් බවට සිසුන් පත් කිරීම සඳහා කටයුතු කරයි. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා යටතේ ක්‍රියාත්මක වන අතර වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක මණ්ඩලයේ මුලසුන හොබවනු ලබන්නේ උපකුලපතිවරයා විසිනි. සියලුම පීඨවල කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ පීඨ වෘත්තීය මාර්ගෝපදේශ සම්බන්ධීකාරකවරුන් විසිනි.

### 23.3.2 දැක්ම

තාක්ෂණික සහ අනෙකුත් නවෝත්පාදන සහ දේශීය හා ගෝලීය මට්ටමින් භෞතික හා මාර්ගගත වැඩ වේදිකාවල ඒවායේ යෙදීම් හේතුවෙන් බුද්ධිමය නම්‍යශීතාවකින් යුත් සේවානියෝජිකයින් සඳහා අනාගතයේදී වෙනස් වන ඉල්ලුමට සක්‍රිය ප්‍රතිචාර දක්වන මධ්‍යස්ථානය බවට පත්වීම සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය විසින් අවශ්‍ය සියලු උත්සාහයන් දරනු ඇත.

### 23.3.3 මෙහෙවර

පුද්ගල වෘත්තීය සංවර්ධනය යනු පැහැදිලි වෘත්තීය ඉලක්ක වර්ධනය කර ගැනීම, පළපුරුද්ද සමගින් ඉගෙනුම් අවස්ථාව ප්‍රවර්ධනය කිරීම, රැකියා සපයාගැනීම සහ වෘත්තීය ජීවිතයට පිවිසීම සඳහා සහය ලබා දීම සහ බුද්ධිමය නම්‍යශීලීභාවය සහ රැකියා ජීවන සමතුලිතතාවය සහිත ආයතනික පුරවැසියෙකු බවට පත්වීම සඳහා අවසානයේ උපකාරී වන පුළුල් පරාසයක වැඩසටහන් සංවිධානය කිරීම මගින් සේවා යෝජකයන් සමඟ හවුල්කාරිත්වය ගොඩනැගීම සහ පවත්වාගෙන යාම ඇතුළු ජීවිත කාලය පුරාම සිදුවන ක්‍රියාවලියක් ලෙස ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ (WUSL) වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) හැඳින්විය හැක.

### 23.3.4 අරමුණු

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) විසින් පුළුල් පරාසයක අරමුණු සකස් ඇත;

- සිසුන්ට වෘත්තීය උපදේශන ලබා දීම
- වෘත්තීය තොරතුරු සේවාව පැවැත්වීම
- සිසුන් ජාලකරණය තුළින් සන්නද්ධ කිරීම
- රැකියා ස්ථානයේ අත්දැකීම් ලබා දීම
- කර්මාන්තායතනවල ස්ථානගත කිරීම සොයා ගැනීම සඳහා සිසුන්ට සහයවීම

- වෘත්තීය මාර්ගෝපදේශ පාඨමාලා ඒකක විෂයමාලාව සමග ඒකාබද්ධ කිරීමෙන් සිසුන්ට මග පෙන්වීම සහ ඔවුන්ගේ වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) විසින් කර්මාන්තායතන සමඟ මනා සබඳතා ගොඩනගා ගැනීම තුලින් පුළුල් පරාසයක වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම මගින් සිසුන්ට වැඩ ලෝකයට නිරාවරණය වීමට වැඩි අවස්ථා නිර්මාණය කරනු ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් පසු, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය (WUSL) මගින් සේවයෙහි යෙදවිය හැකි උපාධිධාරීන් නිර්මාණය කිරීමේ අත්‍යවශ්‍ය ඒකකයක් බවට වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය (CGU) පත් වනු ඇති අතර එසේ බිහිවන උපාධිධාරීන් පෞද්ගලික, රාජ්‍ය අංශවල මෙන්ම රාජ්‍ය නොවන සංවිධානවල ගෝලීය සහ දේශීය ආයතනවල විශිෂ්ටයන් බවට පත් වනු ඇත.

### 23.3.5 අපගේ සංවිධානාත්මක ව්‍යුහය




### 23.3.6 මාණ්ඩලික තනතුරු

| මාණ්ඩලික තනතුර | නම |
|---|---|
| වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යක්ෂවරයා | ආචාර්ය එච්.කේ.ජේ.පී වික්‍රමසිංහ |
| වෘත්තීය උපදේශක | ගාමිණී ජයසූරිය මහතා |
ඇ. <u>පාලන ගිණුම් සැසඳීම</u>

සියලුම පාලන ගිණුම් සංසන්ධනය කර ඇති අතර සවිස්තරාත්මක උපලේඛන සකස් කර මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර ඇත.

පොදු කරුණු

අවසාන වශයෙන්, 2023 වර්ෂය තුළ මිල ඉහළ යාම සහ වෙනත් පාලනය කළ නොහැකි සාධක රාශියක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලය දුෂ්කරතා රැසකට මුහුණ දුන් බව ප්‍රකාශ කළ යුතුය. කෙසේ වෙතත්, මෙම සියලු බාධා මධ්‍යයේ වුවද, 2023 වසර සඳහා සැලසුම් කර ඇති උසස් අධ්‍යාපන අධ්‍යයන හා අනධ්‍යයන වැඩසටහන් වලදී සිය ඉලක්ක සාර්ථක ලෙස සාක්ෂාත් කර ගැනීමේ වගකීමට උර දීමට විශ්ව විද්‍යාලය හැකි සෑම ප්‍රයත්නයක්ම දැරීය.

උපකුලපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ ජයසිංහ

2024 පෙබරවාරි 26.

⋆⋆⋆මෙහි අත්සන් කරන ලද ගිණුම් ඉංග්‍රීසි පිටපතෙහි ඇත.

## ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

## 2023 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | 2023.12.31 දිනට රු. | 2022.12.31 දිනට රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| | සටහන | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1 | 610 ,992,542 | 289,518,738 |
| ආයෝජන | 2 | 376,374,80 I | 280,182,348 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ | 3 | 34,262,542 | 149,818 |
| පෙරගෙවුම් | 4 | 12,854,731 | 4,041,603 |
| අත්තිකාරම් | 5 | 167,301,623 | 25,843,587 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 6 | 17,052,037 | 17,602,050 |
| ඉන්වෙන්ටරි/තොග | 7 | 45,499,714 | 43,305,974 |
| ජීවවිද්‍යාත්මක වත්කම් | 8 | 452,890 | - |
| බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු | 9 | 32,296,913 | - |
| **වෙනත් ජංගම වත්කම්** | 10 | 50,857,134 | 25,827,690 |
| | | **1,347,944,927** | **686,471,809** |
| ජංගම නොවන වත්කම් | | | |
| අත්තිකාරම් | 5 | 1,013,750 | 161,235,196 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය | 6 | 41,625,994 | 40,770,941 |
| දේපල, පිරියත සහ උපකරණ | 11 | 9,562,090,866 | 9,049,426,858 |
| ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු | 12 | 1,006,020,396 | 1,234,418,825 |
| | | **10,610,751,005** | **10,485,851,821** |
| **මුළු වත්කම්** | | **11,958,695,931** | **11,172,323,630** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| විවිධ ණයහිමියෝ | 13 | 184,530,330 | 244,190,139 |
| විවිධ තැන්පතු | 14 | 5,389,568 | 1,920,176 |
| වියදම් ණයහිමියෝ | 15 | 125,651,134 | 105,737,855 |
| විලම්භිත බැරකම් | 16 | 27,295,758 | - |
| වෙනත් | 17 | 507,767,553 | 431,818,748 |
| | | **850,634,343** | **783,666,918** |
| විලම්භිත බැරකම් | 16 | 32,296,913 | - |
| | | **32,296,913** | - |
| **ජංගම නොවන වගකීම්** | | | |
| වෛද්‍ය පීඨ ඉඩම සඳහා ගෙවිය යුතු | 18 | 10 I ,333,069 | - |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 19 | 472,646,076 | 390,252,414 |
| | | **573,979,145** | **390,252,414** |
| **මුළු වගකීම්** | | **1,456,910,401** | **1,173,919,332** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **10,501,785,530** | **9,998,404,299** |

ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා බැදේ

| | | 2023.12.31 දිනට රු. | 2022.12.31 දිනට රු. |
|---|---|---|---|
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | | | |
| සමුච්චිත අරමුදල් අතිරික්තය I (හිඟය) - ප්‍රාග්ධන | | 8,007,818,450 | 7,808,622 ,070 |
| සමුච්චිත අරමුදල් අතිරික්තය I (හිඟය) - ජංගම | | (412,048,80 I) | (354 ,615,989) |
| ප්‍රත්‍යාගණන සංචිත | | 2,291,443,768 | 2,273,316,994 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 20 | 20 204,901,534 | 18 ,885 ,720 |
| | | 10,092,114,951 | 9,746,208,796 |
| **සංචිත සහ සීමිත අරමුදල්** | | | |
| වැඩසටහන් සංවර්ධන අරමුදල | 21 | 132,912,728 | 87,940,371 |
| පරිත්‍යාග අරමුදල | 22 | 4,014,177 | 2,925,036 |
| විශේෂ අරමුදල | 23 | 272,743,674 | 161,330,096 |
| | | 409,670,579 | 252,195,503 |
| **මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්** | | **10,501,785,530** | **9,998,404,299** |

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය මගින් දක්වා ඇති රාජ්‍ය අංශයේ ආයතන සඳහා අදාළවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතාවලට සහ 1971 අංක 38 දරන මූල්‍ය පනත සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව මූල්‍යාධිකාරී සහතික කරයි.

ඩී.ඒ.යූ. ධර්මදාස

මූල්‍යාධිකාරී

2024 පෙබරවාරි 26

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාල පාලක සභාවේ වගකීමක් වේ. විශ්වවිද්‍යාල පාලක සභාව වෙනුවෙන් සභාපතිවරයා විසින් මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2024 පෙබරවාරි 26 දින අවසර ලබා දෙන ලදී.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ ජයසිංහ | ඩබ්.ඒ.ඩී. චිත්‍රානන්ද |
| උපකුලපති | ලේඛකාධිකාරී |
| සභාපති- විශ්වවිද්‍යාල පාලක සභාව | ලේකම්- විශ්වවිද්‍යාල පාලක සභාව |

පාලක සභාව වෙනුවෙන් අත්සන් කරන ලදි

| | |
|---|---|
| ............................... | ............................... |
| උපේන්ද්‍ර විජේසිංහ | එම්.එම්.ජේ.ආර්. බෝගමුව |
| පාලක සභා සාමාජික | පාලක සභා සාමාජික |

⋆⋆⋆මෙහි අත්සන් කරන ලද ගිණුම් ඉංග්‍රීසි පිටපතෙහි ඇත.

ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| | | 2023 වර්ෂය | 2022 යළි ප්‍රකාශිත |
|---|---|---|---|
| ආදායම | සටහන | රු. | රු. |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම- පුනරාවර්තන** | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 2,042,000,000 | 1,813,000,000 |
| සිසුන්ගේ ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රදාන | | 49,455,000 | 56,121,000 |
| පුනරාවර්තන ප්‍රදාන- පරිත්‍යාග | | 10,696,492 | 780,730 |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම- පුනරාවර්තන** | | **2,102,151,492** | **1,869,901,730** |
| | | | |
| **විනිමය ගනුදෙනුවලින් ලද ආදායම- පුනරාවර්තන** | | | |
| **අභ්‍යන්තර ආදායම** | 24 | 29,751,675 | 22,580,430 |
| ආයෝජන වලින් පොලී | 25 | 28,093,915 | 18,814,202 |
| දේපලවලින් ලද කුලිය | 26 | 6,684,333 | 1,987,468 |
| විවිධ ලැබීම් | 27 | 21,550,691 | 20,733,282 |
| **විනිමය ගනුදෙනුවලින් ලද මුළු ආදායම- පුනරාවර්තන** | | **86,080,614** | **64,115,382** |
| | | | |
| මුළු ආදායම- පුනරාවර්තන | | **2,188,232,106** | **1,934,017,112** |
| | | | |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම- ප්‍රාග්ධන** | 28 | 1,219,130,298 | 562,123,324 |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම- ප්‍රාග්ධන** | | **1,219,130,298** | **562,123,324** |
| **මුළු ආදායම** | | **3,407,362,404** | **2,496,140,435** |
| | | | |
| **වියදම්** | | | |
| පුනරාවර්තන **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 29 | 1,713,774,403 | 1,657,968,511 |
| ගමන් වියදම් | | 479,062 | 352,223 |
| සැපයුම් සහ පරිභෝජ්‍ය | | 80,736,128 | 48,451,459 |
| නඩත්තු | | 35,859,375 | 22,344,459 |
| කොන්ත්‍රාත් සේවා | | 307,184,124 | 186,453,088 |
| වෙනත් වියදම් | | 48,772,985 | 40,936,630 |
| ශිෂ්‍යාධාර ගෙවීම් | | 49,455,000 | 56,121,000 |
| පුනරාවර්තන වියදම්- පරිත්‍යාග | | 10,696,492 | 780,730 |
| **මුළු පුනරාවර්තන වියදම්** | | 2,246,957,570 | 2,013,408,484 |
| | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | |
| **ක්ෂයවීම්** | | 792,194,032 | 754,874,759 |
| **ප්‍රාග්ධන වියදම්**(පුනරාවර්තන ස්වරූපයේ) | | 14,297,907 | 6,915,600 |
| | | | |
| **පර්යේෂණ වියදම්**(පුනරාවර්තන ස්වරූපයේ) | | 4,123,692 | 4,118,555 |
| වත්කම් අපහරණ පාඩුව | | 944,435 | 184,128 |
| **ප්‍රාග්ධන වියදම්** | | **811,560,066** | **766,093,042** |
| | | | |
| **මුළු වියදම්** | | 3,058,517,636 | 2,779,501,526 |
| | | | |
| **වර්ෂයේ අතිරික්තය/ (හිගය)** | | **348,844,768** | **(283,361,091)** |
| | | | |
| **වර්ෂයේ පුණරාවර්තන අතිරික්තය/(හිගය)** | | (58,725,464) | (79,391,091) |
| **වර්ෂයේ ප්‍රාග්ධන අතිරික්තය/(හිගය)** | | 407,570,232 | (203,969,719) |

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා හිමිකම් වෙනවෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| | සමුච්චිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිත | වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | විශේෂ ප්‍රදාන සහ පරිත්‍යාග | සමුච්චිත අරමුදල ප්‍රාග්ධන | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | (275,959,365) | 1,289,796,873 | 4,939,006,605 | 161,609,658 | 2,930,861,247 | - | 9,045,315,018 |
| වර්ෂයේ අතිරික්තය/(හිගය) | (79,391,373) | | | | | (203,969,719) | (283,361,091) |
| ආදායමට අදාළව පෙර වර්ෂයේ ගැළපුම් | 2,987,528 | 791,506 | | | | | 3,779,034 |
| ගෙවීම්වලට අදාළව පෙර වර්ෂයේ ගැළපුම් | (2,252,779) | (201,552) | | | | | (2,454,331) |
| ප්‍රාග්ධනයන්ට අදාළ ගැළපුම් | | | | | | 142,723,937 | 142,723,937 |
| ආරම්භක ශේෂයට අදාළ ගැළපුම් | | | (4,939,006,605) | | (2,930,861,247) | 7,869,867,852 | - |
| වැය නොකළ ප්‍රාග්ධනය වැය කළ ප්‍රාග්ධනයට මාරුකිරීම් | | | | (602,706,281) | | | (602,706,281) |
| වර්ෂය තුළ ලද අරමුදල් | | | | | | | 459,892,343 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 987,779,826 | | | | | 987,779,826 |
| ප්‍රත්‍යාගණිත වත්කම් අපහරණ පාඩුව | | (4,849,660) | | | | | (4,849,660) |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | (354,615,989) | 2,273,316,993 | - | 18,885,720 | - | 7,808,622,070 | 9,746,208,795 |

2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා හිමිකම් වෙනවෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| | සමුච්චිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිත | වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | විශේෂ ප්‍රදාන සහ පරිත්‍යාග | සමුච්චිත අරමුදල ප්‍රාග්ධන | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2023 ජනවාරි 01 දිනට ශේෂය | (354,615,989) | 2,273,316,993 | | 18,885,720 | | 7,808,622,070 | 9,746,208,795 |
| වර්ෂයේ අතිරික්තය/(හිගය) | (58,725,464) | | | | | 407,570,231.72 | 348,844,768 |
| ආදායමට අදාළව පෙර වර්ෂයේ ගැළපුම් | 1,310,076 | | | | | 156,589.33 | 1,466,666 |
| ගෙවීම්වලට අදාළව පෙර වර්ෂයේ ගැළපුම් | (17,425.00) | | | | | (22,514,627.55) | (22,532,053) |
| ප්‍රාග්ධනයන්ට අදාළ ගැළපුම් | | | | 186,015,814 | | (185,015,814.05) | - |
| ප්‍රත්‍යාගණන සංචිත ගැළපුම් | | 17,916,152.00 | | | | | 17,916,152 |
| ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාළ ගැළපුම් | | 2,622,035 | | | | | 2,622,035 |
| ප්‍රත්‍යාගණිත වත්කම් අපහරණ පාඩුව | | (2,411,412) | | | | | (2,411,412) |
| 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය | (412,048,801) | 2,291,443,768 | | 204,901,534 | | 5,007,818,450 | 10,092,114,951 |

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2023 වර්ෂය<br>රු. | 2022 වර්ෂය<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහ | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්ත /(හිඟය) | 348,844,768 | (198 ,176,461) |
| **එකතු කළා: මූල්‍ය නොවන සංචලන** | | |
| ක්ෂය වීම | 792,1 94,032 | 754,874,759 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 108,394,652 | 32,884,908 |
| ගෙවන ලද පාරිතෝෂික | (26,000,990) | (7,783,091) |
| ප්‍රත්‍යාගණන සංචිතයට ගැලපීම | (2,411,412) | (4,073,566) |
| වත්කම් බැහැර කිරීම මත පාඩුව | 944,435 | 184,128 |
| රජයේ ප්‍රදාන සහ පරිත්‍යාග ක්‍රමක්ෂ කිරීම | - | (636,273,798) |
| ලැබූ පරිත්‍යාග- ප්‍රාග්ධන | (407,025,268) | - |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් (වැඩිවීම) / අඩු වීම | (34,112,724) | 2,617,467 |
| ගෙවීම් (වැඩිවීම) / අඩු වීම | (8,813,128) | (1 ,893,943 ) |
| අත්තිකාරම් (වැඩිවීම)/ අඩුවීම | 18,763,400 | 98,177,782 |
| කාර්ය මණ්ඩල ණය (වැඩිවීම)/ අඩුවීම | (305,039) | 3,417,868 |
| තොග (වැඩිවීම)/ අඩුවීම | (2,193,740) | (14,266,956) |
| ජීවවිද්‍යාත්මක වත්කම් | (452,890) | - |
| බැඳුම්කර කඩකරන්නන්ගෙන් ලැබියයුතු (වැඩිවීම) / අඩු වීම | (32,296,9 I 3) | - |
| වෙනත් ජංගම වත්කම් (වැඩිවීම)/ අඩුවීම | (25,029,444) | (4,937,589) |
| විවිධ ණය හිමියෝ වැඩිවීම/(අඩුවීම) | (59,659,808) | (13,316,793) |
| විවිධ තැන්පතු වැඩි වීම/(අඩු වීම). | 3,469,392 | (137,619) |
| වියදම් ණයහිමියෝ වැඩිවීම /(අඩුවීම) | 19,913,279 | 64,883,458 |
| විලම්භිත වත්කම් වැඩිවීම /(අඩුවීම) | 59,592,671 | - |
| අනෙකුත් වැඩිවීම /(අඩුවීම) | 75,948,815 | 38,027,446 |
| **(අ) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **829,764,087** | 114,207,999 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (797,931,247) | (96,744,887) |
| සීමිත අරමුදල් ආයෝජන | (96,192,453 ) | (45,847,219) |
| ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු | 228,398,429 | (535 ,310,871) |
| පරිත්‍යාග අරමුදල | 1,089,141 | 327,433 |
| (ආ) ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය | **(664,636,129)** | **(677,575,544)** |

| | 2023 වර්ෂය රු. | 2022 වර්ෂය රු. |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන: පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම් | - | 22,500,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන: වත්කම් අත්පත් කර ගැනීම් | - | 26,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන: ස්ථිර ව්‍යුහයන් | - | 20,000,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන: වෙනත් | - | 3,500,000 |
| ප්‍රාග්ධන ප්‍රදාන: වි.වි.ප්‍ර.කො | - | 212,500,000 |
| වෙනත් ප්‍රදාන: ව්‍යාප්ති වැඩසටහන් | - | 413,900 |
| ප්‍රාග්ධන ප්‍රදාන: වෙනත් | - | 175,068,444 |
| විශේෂ අරමුදල | 111,413,578 | 63,415,672 |
| වැඩසටහන් සංවර්ධන අරමුදල | 44,972,357 | (17,267,760) |
| ප්‍රාග්ධන ප්‍රදාන (පුනරාවර්තන ස්වභාවයේ) | - | (11,814,885) |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය | **156,385,934** | **494,315,371** |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම (අඩුවීම) (අ)+(ආ)+(ඇ) | 321,513,983 | (69,052,175) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 289,478,649 | 358,530,824 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 610,992,542 | 289,478,649 |

වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති

1. ආයතනික තොරතුරු

1.1 **වාර්තාකරණ අස්ථිත්වය**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ස්ථාපිත කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ කුලියාපිටිය කනදුල්ලෙහි පිහිටා තිබේ.

1.2 **නිකුත් කිරීම සඳහා අවසරය ලබාදුන් දිනය**

2024 පෙබරවාරි 26 දින පැවති 247 වැනි පාලක සභා රැස්වීමේදී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත්කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

1.3 **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

විශ්වවිද්‍යාලයේ වාර්තාකරන **කාලපරිච්ඡේදය** 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

2.1 **අනුකූලතා ප්‍රකාශය**

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණ්ම්කරණයේ උපචිත පදනම අනුගමනය කරමින් පිළියෙල කර ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, අයවැයගත සහ තත්‍ය ප්‍රමාණයන් සංසන්දනය කිරීමේ ප්‍රකාශය සහ සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් හෙළිදරව් කිරීමේ ඇතුළත් සටහන් වලින් සමන්විත වේ.

2.2 **මිණුම්කිරීමේ පදනම**

පිරිවැය සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස බැහැරවීම් පවතින අවස්ථාවන්හිදී හැර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

2.3 **ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය**

සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයේ ඇති අයිතම ප්‍රමාණාත්මක නොවන්නේනම් හැර වෙනම ඉදිරිපත් කර ඇත.

2.4 **හිලව් කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් නියමකර හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කර නොමැත.

**2.5** **සංසන්ධනාත්මක අගයන්**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව නියම කර ඇති අවස්ථාවන්හිදී මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී සිදුවී ඇති වෙනස්කම් සනාත කිරීම සඳහා සංසන්ධනාත්මක අගයන් ගැළපුම් කර ඇත.

**2.6** ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකක

විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

**2.7** අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කර ඇත. විශ්වවිද්‍යාලයේ පාලක සභාව විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරු කර ඇති අතර විශ්වවිද්‍යාලය ඇවර කිරීමට හෝ එහි මෙහෙයුම් නැවැත්වීමට කිසිදු අදහසක් නොමැත.

**2.8** වාර්තාකරණ කාලයට පසු සිදුවීම්

වාර්තාකරණ කාලයට පසුව සිදුවූ සියළුම වැදගත් සිදුවීම් සලකා බලන ලද අතර සුදුසු හා අවශ්‍ය අවස්ථාවන්හිදී මූල්‍ය ප්‍රකාශයන්හි ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

**2.9** විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

අදාළ ගනුදෙනුව සිදුවන දිනවල පවතින විනිමය අනුපාත භාවිතා කරමින් විදේශ මුදල් ගනුදෙනු ක්‍රියාකාරී මුදලට පරිවර්තනය කරනු ලැබේ. එවැනි ගණුදෙනු පියවීමෙන් සහ විදේශ මුදල්වලින් වලින් නාමනය කර ඇති මූල්‍ය වත්කම් හා බැරකම් වසර අවසානයේදී සිදුකරන ලද පරිවර්තනයෙන් සිදු වූ විදේශ විනිමය ලාභ හා පාඩු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

2.10 වැටයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති මඟින් අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකින් දක්වා නොමැතිනම් මිස මූල්‍ය ප්‍රකාශනවල ඇති මුදල් ආසන්නතම රුපියලට වැටයීම් කර ඇත.

2.11 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය (SLPSAS 11) ප්‍රකාරව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමයක් - විනිමය නොවන ගනුදෙනුවලින් (බදු සහ මාරුකිරීම්) ආදායම 2022 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුගමනය කර ඇත, 2022 වර්ෂය සඳහා සංසන්දනාත්මක අගයන් ද ඒ අනුව නැවත දක්වා ඇත.

**2.12** දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත සහ උපකරණ යනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය ක්‍රියාකාරකම්වල භාවිතය සඳහා සහ පරිපාලන කටයුතු සඳහා රඳවා තබා ඇති අයිතමයන් වන අතර ඒවා වාර්තා කරණ කාල සීමාව ඉක්මවා භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

2.12.1 හඳුනා ගැනීම සහ මිණුම්කිරීම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවාවන් විශ්වවිද්‍යාලයට ගලා ඒමට ඉඩ තිබේ නම් හා වත්කම්වල පිරිවැය හෝ සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැනිය

හැකිනම් දේපළල, පිරියත සහ උපකරණ හඳුනාගනු ලැබේ.

### 2.12.2 මූලික පිරිවැය

වත්කම් සඳහා සුදුසුකම් ලබන දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් මූලිකව එහි පිරිවැට මනිනු ලබේ. පිරිවැය යන්නට වත්කමෙහි මිලදී ගැනීමේ වටිනාකම, වෙළඳ වට්ටම් සහ වට්ටම් අඩු කිරීමෙන් පසු ආනයන තීරුබදු සහ ආපසු නොගෙවන බදු, සහ කළමනාකරණය විසින් අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය ස්ථානයට සහ ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේ දී ඒ සඳහා ඍජුවම දායකවූ ඕනෑම පිරිවැයක් ඇතුළත් වේ. විනිමය නොවන ගනුදෙනුවක් හරහා දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් අත්පත් කරගනු ලබන විට එහි පිරිවැය එම වත්කම අත්පත් කරගත් දිනට එහි සාධාරණ වටිනාකමින් මනිනු ලැබේ.

### 2.12.3 පසුව දරනු ලබන පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක අංගයක් ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන විට එහි පිරිවැය, එකී කොටසේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාව පවතී නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් අයිතමයේ ධාරණ අගයට හඳුනාගනු ලැබේ.

### 2.12.4 ක්ෂයවීම්

වත්කමක ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා එහි පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත දැක්වෙන අනුපාත යටතේ සරල මාර්ග පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ක්ෂයවීම් සිදුකෙරේ.

| | |
|---|---|
| ඉඩම් | - |
| ගොඩනැගිලි | 5% |
| ගෘහභාණ්ඩ සහ සවිකෘත | 10% |
| විදුලිය බෙදාහැරීම් | 10% |
| ජල සම්පාදන යෝජනාක්‍රම | 10% |
| පිරියත, උපකරණ සහ මෙවලම් | 10% |
| කාර්යාලීය සහ වෙනත් උපකරණ | 20% |
| පුස්තකාල පොත් සහ වාර සගරා | 20% |
| මෝටර් රථ | 20% |
| පරීක්ෂණාගාර සහ ඉගැන්වීම් උපකරන | 20% |
| උපාධි කබා | 20% |
| මෘදුකාංග | 20% |

| | |
|---|---|
| පරිගණක උපාංග | 20% |
| අනෙකුත් සථාවර වත්කම් | 20% |
| ක්‍රීඩා උපකරණ | 25% |

වත්කමක් භාවිතය සඳහා පවතින විට එහි ක්ෂය වීම ආරම්භ වන අතර වත්කම හඳුනා නොගැනීම ආරම්භ කරන ලද දින හෝ එය සම්පූර්ණයෙන් ක්ෂය වූ දිනයේ දී ක්ෂයවීම නතර වේ.

වත්කමක් මිලදීගත්/ඉදිකළ/බැහැර කළ වර්ෂයේ දී සමානුපාතික පදනම මත ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

2.12.5 <u>හඳුනාගැනීමෙන් පසු මිනුම්කිරීම</u>

**දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම**

මූලික හඳුනාගැනීමෙන් පසු පුස්තකාල පොත් හැර සියලු දේපල පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රත්‍යාගණන වටිනාකමට ගනනය කර ඇති අතර පසුව ඇතිවූ සමුච්චිත ක්ෂයවීම් හා සමුච්චිත හානිවීම් අඩුකරන ලදුව ප්‍රත්‍යාගණන දිනට පවතින වටිනාකම මෙම සාධාරණ අගය වේ.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව විශ්වවිද්‍යාලය විසින් සමස්ත වත්කම් පන්තිය සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළකර ගනී. ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියක ධාරණ අගය වැඩි වුවහොත්, එම වැඩිවීම සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියේ ධාරණ අගය අඩු වුවහොත්, එම අඩුවීම අතිරික්ත හෝ හිඟය ලෙස හඳුනාගෙන හඳුනා ගනී.

විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි 2016 දෙසැම්බරයේ ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉඩම්, ගොඩනැගිලි සහ පුස්තකාල පොත් හැර අනෙකුත් සියලුම දේපළ, පිරියත සහ උපකරණ කාණ්ඩ 2021දෙසැම්බර් 31 දිනට අභ්‍යන්තරව පත් කරන ලද කමිටු මගින් ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉහත දක්වන ලද ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස අදාළ ගැලපීම් ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 07 ට අනුකූලව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇත.

2.13 <u>කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ</u>

වාර්තා කරන දිනට සම්පූර්ණ නොකළ ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වා ඇති අතර ඒවා භාවිතා කිරීමට සූදානම්ව පවතින විට දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කරනු ලැබේ.

වසර තුළ ඇතැම් ඉදිකිරීම් අවසන් කළද, සම්පූර්ණ බැඳීම් පියවා නොමැතිවීම නිසා සහ ඒවා විශ්වවිද්‍යාලයට පවරාගෙන නොමැතිවීම නිසා ඒවා කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස පෙන්නුම් කරන ලදී.

2.14 <u>ආයෝජන</u>

විශ්වවිද්‍යාලය විසින් තාවකාලික අතිරික්ත අරමුදල් සහ ශිෂ්‍යත්ව සඳහා ලැබෙන අරමුදල් රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල පමණක් ආයෝජනය කර ඇත. මෙම ආයෝජන මූලිකව සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර පසුව ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 09- මූල්‍ය උපකරණ මගින් නියම කර ඇති පරිදි ඵලදායී පොලී අනුපාතයක් භාවිතා කරමින් ක්‍රමක්ෂ කළ පිරිවැය යටතේ මනිනු ලැබේ.

2.15 <u>වත්කම්</u>

වත්කම් යනු අතීත සිද්ධිවල ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලය පාලනය කරන සම්පත් වන අතර, ඒවායේ අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා සබ්‍යතාවයන් හා බැඳුන සම්පත් විශ්වවිද්‍යාලය තුළට ගලාඒම අපේක්ෂා කෙරේ.

2.16 <u>ජංගම වත්කම්</u>

පහත දැක්වෙන නිර්ණායකවලින් ඕනෑම එකක් සපුරාලනවිට වත්කමක් ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ .

(අ) විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අදහස් කරන විට හෝ උපලබ්ධිවෙතැයි අපේක්ෂා කරනවිට

(ආ) මූලික වශයෙන් විකිණීමේ කාර්යය සඳහා තබාගෙන සිටින විට

(ඇ) වාර්තාකරණ දිනයෙන් පසුව මාස 12ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන විට

(ඈ) වාර්තාකරණ දිනයෙන් පසුව අවම වශයෙන් මාස 12ක් පසුවන තුරු වගකීමක් නිරවුල් කිරීම හෝ හුවමාරු කිරීම සීමාකාර නැත්නම් (ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර.2හි නිර්වචනය කර ඇති පරිදි) මුදල් හෝ මුදල් සමාන දෑ වන විට අනෙකුත් සියළුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතුය.

2.17 <u>ගබඩා භාණ්ඩ</u>

ගබඩා භාණ්ඩ යන්නට විශ්වවිද්‍යාලයට සේවා සැපයීමේදී පරිභෝජනය කිරීමට හෝ බෙදා හැරීමට අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සහ සැපයුම් ඇතුළත් වේ. ගබඩා භාණ්ඩ පිරිවැය අනුව දක්වනු ලබන අතර එය පළමු ලැබීම් පළමු නිකුතු පදනම මත තීරණය වේ. සත්‍යාපනය කරන ලද තොග වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

2.18 <u>වෙළඳ හා අනෙකුත් ලැබියයුතු</u>

ලැබියයුතු මුදල් ඒවා උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරනු ලබන ප්‍රමාණයට දක්වනු ලැබේ.

2.19 <u>කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම්</u>

කාර්ය මණ්ඩලය සඳහා ලබාදෙන අත්තිකාරම්, උත්සව අත්තිකාරම්, වැටුප් අත්තිකාරම් සහ විශේෂ අත්තිකාරම්වලින් සමන්විත වේ.

2.20 <u>මුදල් සහ මුදල් සමාන දෑ</u>

මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල්, බැංකුවල ඇති තැන්පතු සහ මූල්‍ය වෙළඳපල තුළ සිදුකරන ලද ආයෝජන ඇතුළත් වේ.

2.21 <u>ජීව විද්‍යාත්මක වත්කම්</u>

ජීව විද්‍යාත්මක වත්කම් යනු සජීවී ශාක හෝ සතුන් වේ. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලය විසින් වත්කම් පාලනය කරන විට සහ වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ වත්කම් හා සම්බන්ධ සේවා විභවය විශ්ව විද්‍යාලයට ගලා ඒමට ඉඩ ඇතිවාක් මෙන්ම වත්කම්වල සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට ජීව විද්‍යාත්මක වත්කම් හඳුනා ගනී.

පර්යේෂණ සහ අධ්‍යාපන අරමුණු සඳහා භාවිතා කරන ජීව විද්‍යාත්මක වත්කම්, ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර 9- ඉන්වෙන්ටරිවලට අනුකූලව මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ගබඩාභාණ්ඩ ලෙස වර්ග කර ඇත.

2.22 **<u>අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්</u>**

2.22.1 **<u>අසම්භාව්‍ය වත්කම්</u>**

අසම්භාව්‍ය වත්කමක් යනු විශ්ව විද්‍යාල පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ සිදුනොවීම මගින් තහවුරු වන අතීත සිදුවීම්වලින් ඇතිවිය හැකි වත්කමකි. විශ්ව විද්‍යාලය අසම්භාව්‍ය වත්කම් හඳුනා නොගන්නා අතර නිශ්චිත නොවන නමුත් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට ඉඩ ඇති විට එහි පැවැත්ම අනාවරණය කරයි.

2.22.2 <u>අසම්භාව්‍ය වගකීම්</u>

අසම්භාව්‍ය වගකීමක් යනු අතීත සිදුවීම් හේතුවෙන් පැන නැඟිය හැකි වගකීමක් වන අතර එහි පැවැත්ම විශ්වවිද්‍යාලයේ පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ සිදුනොවීම මත තීරණය වේ. වගකීම් පියවීම සඳහා සම්පත් ගලා යාමක් අවශ්‍ය නොවියහැකි නිසා වර්තමාන වගකීම හඳුනා නොගනී.

විශ්වසනීයව මැනිය නොහැකි වගකීමක් පවතින අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී ද අසම්භාව්‍ය වගකීමක් පැන නගී. අවිනිශ්චිතතාවය අසම්භාව්‍ය වගකීමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනවල එහි පැවැත්ම හෙළි කරයි.

2.23 <u>වගකීම් සහ ප්‍රතිපාදන</u>

වාර්තාකරණ දිනයට අදාළ සියළුම දන්නා වගකීම් මූල්‍ය වාර්තාවල ඇතුළත් කර ඇත. තවද, අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්ව විද්‍යාලයට වර්තමාන වගකීම් ඇති විට ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසනු ලබන අතර, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා ඒම අවශ්‍ය වන අතර එම වගකීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකිය.

ඉල්ලුම මත හෝ මූල්‍ය තත්ත්වය දිනෙන් වසරක් ඇතුළත ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ සිට වසරකට පසුව ගෙවිය යුතු වන වගකීම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

2.24 ජංගම වගකීම්

වත්මන් වගකීම් යනු, ඉල්ලුම මත හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ. භාණ්ඩාගාර චක්‍රලේඛ අංක III ප්‍රකාරව 2023 වර්ෂයේ දී සිදු කරන ලද මිලදී ගැනීමේ ඇණවුම් සම්බන්ධයෙන් 2024 දී භාර දුන් භාණ්ඩ සහ සිදු කරන ලද ගෙවීම් 2023 වර්ෂය සඳහා උපචිත වියදම් ලෙස නොසැලකේ.

2.25 පරිත්‍යාග අරමුදල්

පරිත්‍යාග අරමුදල්වලට විශ්වවිද්‍යාලයට ලැබෙන සීමිත පරිත්‍යාග ඇතුළත් වන අතර පරිත්‍යාග අරමුදල් ආයෝජනය කිරීමෙන් ජනනය කරන ප්‍රතිලාභ පරිත්‍යාග ශීලීන් විසින් ස්ථාපිත කරන ලද විවිධ අරමුණුවලට අනුකූලව භාවිතා කරනු ලැබේ.

2.26 සේවක ප්‍රතිලාභ

සේවක ප්‍රතිලාභ යනු සේවකයින් විසින් සපයනු ලබන සේවය වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් ලබා දෙන සියලු ආකාරයේ මුදල් ගෙවීම් වේ.

2.26.1 නිශ්චිත දායක සැලසුම්

අදාළ දායක සැලසුම්වලට අදාළ ප්‍රඥප්ති හා රෙගුලාසිවලට අනුකූලව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා විශ්වවිද්‍යාල සේවකයෝ හිමිකම් ලබති. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සහ සේවක භාර අරමුදලට පිළිවෙලින් සේවකයින්ගේ මූලික වැටුපෙන් 7% ක් හා 3%ක ප්‍රමාණයක් විශ්වවිද්‍යාලය විසින් ගෙවනු ලබයි. තවද විශ්‍රාම ප්‍රතිලාභයක් ලෙස විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට සේවකයින්ගේ මූලික වැටුපෙන් 8% කට සමාන මුදලකින් විශ්වවිද්‍යාලය දායක වේ. මේවා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දරන ලද වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

2.26.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 19 "සේවක ප්‍රතිලාභ"හි නිර්දේශ කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතයෙන් ස්වාධීන ආයුගණක තක්සේරුකරුවෙකු විසින් නිශ්චිත ප්‍රතිලාභ ගණනය කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නාමනයකර ඇති පොලී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා යෑම් වට්ටම් කිරීමෙන් වන අතර අදාළ වගකීමේ කාලසීමාවට ආසන්න පරිනතවීමේ කාලසීමාවක් එයට ඇත. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක සහ මරණ අනුපාතය ආදී උපකල්පන රාශියක් භාවිතා කරමින් ආයුගණක පදනමක් මත තීරණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් තීරණය කිරීමේදී භාවිතා කරන අනුපාත සටහන 19හි දක්වා ඇත. මෙම උපකල්පනයන්හි සිදුවන කිසියම් වෙනස්කමක් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල ධාරණ අගයට බලපානු ඇත.

ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 19 හි සේවක ප්‍රතිලාභවලට අනුකූලව සියලුම සේවකයින් සඳහා සේවයේ ආරම්භයේ සිටම විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. 1983 අංක 12 දරන පාරිතෝෂික පනත යටතේ සුදුසුකම් ලබන සියලුම සේවකයින්ට ප්‍රතිපාදන සලසනු ලබන අතර, සේවකයකු සම්බන්ධයෙන් එම වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. මෙම ප්‍රතිපාදන සඳහා සම්පූර්ණයෙන්ම බාහිරව අරමුදල් සපයනු නොලැබේ. කෙසේ වෙතත් වි.වි.ප්‍ර.කො.සභාවේ විගණන කමිටු තීරණය අනුව රුපියල් මිලියන 5ක බාහිර අරමුදලක් ස්ථාපිත කරන ලදී. (ගිණුම්කරණ කමිටුවේ 4 වන රැස්වීමේ වාවස්ථාවේ - අංක 09 ඡේදය) එම මුදල 2023.12.31 දින වන විට රුපියල් මිලියන 9.6ක් වී ඇත.

2.27 ආදායම් සහ වියදම් හඳුනා ගැනීම

2.27.1 ආදායම් හඳුනා ගැනීම

පුනරාවර්තන වියදම් සහ පර්යේෂණ ප්‍රදාන, විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන, අධ්‍යයන පැවරුම් ඇතුළු ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් සහ අනෙකුත් සියලුම ආදායම් සඳහා රජයේ ප්‍රදානය ඒවා ලැබෙන විට හඳුනාගෙන ඇති අතර සුදුසු සහ ප්‍රායෝගික ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත. 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 11 අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මය වන විනිමය නොවන ගනුදෙනු (බදු සහ මාරුකිරීම්) වෙතින් ලබන ආදායම අනුව සියලුම ප්‍රාග්ධන ප්‍රදාන සහ තෑගි, පරිත්‍යාග, භාණ්ඩ (දේශීය සහ විදේශීය) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනාගෙන ඇත.

2.27.2 ශිෂ්‍ය ශිෂ්‍යාධාර ගෙවීම්

විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 1112018 අනුව, ප්‍රතිපූරණ පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ ශිෂ්‍යාධාර හඳුනාගනු ලැබේ. වාර්තා කරන දිනයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූරණය කළ යුතු මුදල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වෙතින් ලැබිය යුතු ශිෂ්‍යාධාර ලෙස සටහන් කර ඇත.

2.27.3 වියදම්

අ. විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමතාවයෙන් පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා අතිරික්ත/හිඟය ගණනය කිරීමේදී ආදායමට ගනු ලැබේ.

ආ. විශ්ව විද්‍යාලයේ සේවා ධාරිතාවය පවත්වාගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන සියලුම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

2.28 බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ විශ්වවිද්‍යාලය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

2.29 <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර සකස් කර ඇත.

2.30 <u>ආංශික වාර්තාකරණය</u>

කිසිදු ඒකකයක හෝ මධ්‍යස්ථානයක ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් විශ්වවිද්‍යාල මෙහෙයුම් අංශයක් ලෙස සලකා නොමැත.

2.31 <u>පර්යේෂණ ආධාර</u>

පර්යේෂණ ප්‍රදානවල ආදායම් සහ වියදම් ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලය වෙනම ලෙජර ගිණුම් පවත්වාගෙන යයි. 2023 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ ප්‍රදාන ගිණුම්වල පවතින ශේෂයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ පෙන්වා ඇත.

2022 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 11 - ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මය වන විනිමය නොවන ගනුදෙනු (බදු සහ මාරුකිරීම්) වෙතින් ලබන ආදායම යන ප්‍රතිකර්මය අනුගමනය කිරීමත් සමග පර්යේෂණ ප්‍රදාන වලින් මිලදී ගත් දේපල, පිරියත සහ උපකරණ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන (විනිමය නොවන) ආදායම යටතේ දක්වා ඇත.

2.32 <u>ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදිත ආදායම</u>

පශ්චාත් උපාධි පාඨමාලා, කෙටි පාඨමාලා, අර්ධ කාලීන පාඨමාලා, බාහිර උපාධි වැඩසටහන් ආදී වශයෙන් ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් හරහා ජනනය වන ආදායම් සහ වියදම් ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලය වෙනම ලෙජර ගිණුම් පවත්වාගෙන යයි. තනි පුද්ගල ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කරන ලද වියදම් ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම්වල ඍජු වියදම් සහ ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම්වල වක්‍ර වියදම් ලෙස වර්ගීකරණය කර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇත.

2023.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 11 - ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මය වන විනිමය නොවන ගනුදෙනු (බදු සහ මාරුකිරීම්) වෙතින් ලබන ආදායම යන ප්‍රතිකර්මය අනුගමනය කිරීමත් සමග ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මිලදී ගත් දේපල, පිරියත සහ උපකරණ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධන ප්‍රදාන (විනිමය නොවන) ආදායම යටතේ දක්වා ඇත. ස්වයං-මූල්‍යකරණ ක්‍රියාකාරකම් ගිණුම්වල බැර ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශවල සංචිත සහ සීමිත අරමුදල් යටතේ පෙන්වා ඇත.

2.33 <u>වෙනත් හෙළිදරව් කිරීම්</u>

2.33.1 <u>මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 11 - ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ප්‍රතිකර්මය වන විනිමය නොවන ගනුදෙනු (බදු සහ මාරුකිරීම්) වෙතින් ලබන ආදායම යන ප්‍රතිකර්මය අනුව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන යළි ප්‍රකාශකරන ලදී. ප්‍රතිඵලයේ සාරාංශය පහත පරිදි වේ.

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 න් අවසන්වන වසර සඳහා

| | පෙර වාර්තා කළ පරිදි | ගැළපුම් | යළි ප්‍රකාශිත පරිදි |
|---|---|---|---|
| මුළු ආදායම | 2,581,325,065 | (647,307,954) | 1,934,017,111 |
| මුළු වියදම් | (2,779,501,526) | 766,093,042 | 2,013,408,484 |
| කාල පරිච්ඡේදය තුළ ජංගම අතිරික්තය/(හිඟය) | (198,176,461) | 118,785,088 | (79,391,373) |
| **විනිමය නොවන ගනුදෙනු වලින් ලද ආදායම - ප්‍රාග්ධන** | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | - | 285,633,679 | 285,633,679 |
| තෑගි, පරිත්‍යාග, දේශීය හා විදේශීය ප්‍රාග්ධන ප්‍රදානය වශයෙන් ලද භාණ්ඩ වර්ග | - | 276,489,643 | 276,489,643 |
| | | 562,123,324 | 562,123,324 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | - | (766,093,042) | (766,093,042) |
| ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්කරණයෙන් පසු කාලය තුළ අතිරික්තය / (හිඟය). | - | (203,969,718) | (203,969,718) |
| පරිච්ඡේදය තුළ මුළු අතිරික්තය / (හිඟය) | (198,176,460) | (85,184,631) | (283,361,091) |

| | පෙර වාර්තා කළ පරිදි | ගැළපුම් | යළි ප්‍රකාශිත පරිදි |
|---|---|---|---|
| වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන | 4,933,248,574 | (4,933,248,574) | - |
| විශේෂ ප්‍රදාන සහ පරිත්‍යාග | 2,994,158,585 | (2,994,158,585) | - |
| ප්‍රත්‍යාගණන සංචිතය | 2,154,716,033 | 118,600,960 | 2,273,316,993 |
| | 10,082,123,192 | (7,808,806,199) | 2,273,316,993 |
| **සමුච්චිත අරමුදල** | | | |
| සමුච්චිත අරමුදල් අතිරික්තය/(හිඟය) | (354,800,116) | 184,128 | (354,615,998) |
| සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය) | - | 7,808,806,199 | 7,808,806,199 |
| | (354,800,116) | 7,808,990,327 | 7,454,190,211 |

2.33.2 වෛද්‍ය පීඨය සඳහා ඉඩම සහ ගෙවිය යුතු මුදල

2023.10.02 දින පැවැත් වූ විශ්වවිද්‍යාලයේ 82 වැනි විගණන කමිටුව විසින් නිර්දේශ කර 2024.0.22 දින පැවැත් වූ 246 වැනි පාලක සභාව විසින් අනුමත කරන ලද පරිදි වෛද්‍ය පීඨය සඳහා ඉඩමේ වටිනාකම සහ ගෙවිය යුතු මුළු මුදල 2023 දෙසැම්බර් 31 වැනිදා අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පහත පරිදි ගිණුම්ගත කර ඇත.

| **ඉඩමේ වටිනාකම** | රු. |
|---|---|
| 2017.11.09 දිනැති තක්සේරු වාර්තාවට අනුව වටිනාකම | 77,872,750.00 |
| 2016.06.23 සිට 2019.08.31 දක්වා ගෙවිය යුතු 7% පොලිය | 13,698,592.88 |
| පරිපාලන ගාස්තු | 467,762.51 |
| එකතුව | 92,039,105.39 |

| **2023.12.31 දිනට ගෙවිය යුතු මුළු මුදල** | රු. |
|---|---|
| ඉඩමේ වටිනාකම | 92,039,105.39 |
| 2019.09.01 සිට 2023.12.31 දක්වා ගෙවිය යුතු 7% පොලිය | 25,793,964.06 |
| | 117,833,069.45 |

| | |
|---|---|
| අඩුකළා: 2016.02.02 දින ගෙවා ඇති අත්තිකාරම් | (16,500,000.00) |
| 2023.12.31 දිනට ගෙවිය යුතු මුදල | 101,333,069.45 |

ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තියට අනුව 2016.06.23 දින රුපියල් 60,000,000.00 කට ඉඩමේ අයිතිය විශ්වවිද්‍යාලයට පවරා ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 35 වන වගන්තියට අනුව, ඉඩම මිලදී ගැනීමේ ප්‍රතිෂ්ඨාව පියවීම සඳහා 7% පොලියක් ගෙවිය යුතුය. 2019.09.01 දින වෛද්‍ය පීඨය විවෘත කරන ලදී. අංක 2.13.2 ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව ඉඩමේ වටිනාකම ගණනය කර ඇත විශ්ව විද්‍යාලයේ පවතින තොරතුරු භාවිතා කරමින් ඉහත ගණනය කිරීම් සිදු කර ඇත.

කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දන්වා ඇති පරිදි "මහානුගලන්ද වත්ත" (වෛද්‍ය පීඨයේ ඉඩම) හි අයිතිය තීරණය කිරීම සඳහා කුලියාපිටිය දිසා අධිකරණයේ නඩු විභාගයක් පවතී. තවද, විශ්වවිද්‍යාලය විසින් ගෙවිය යුතු අවසාන මුදල තීරණය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉඩම් අමාත්‍යාංශයෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටින බව දන්වා ඇත.

2.33.3 <u>වෛද්‍ය පීඨයට ලැබුණු පරිත්‍යාග</u>

කුලියාපිටිය, බෝහිංගමුව ප්‍රදේශයේ පිහිටි රුපියල් 1,735,000.00 ක වටිනාකමකින් යුත් ඉඩමක් සහ ගොඩනැගිල්ලක් ටී.එස්. ස්වර්ණතිලකා මහත්මිය විසින් වෛද්‍ය පීඨය වෙත පරිත්‍යාග කරන ලදී. මෙම දේපලෙහි සාධාරණ වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇත. තක්සේරු වාර්තාව ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් අභ්‍යන්තරව පත්කළ කමිටුව විසින් ඉඩම, ගොඩනැගිල්ල සහ ගෘහ භාණ්ඩවල වටිනාකම පිළිවෙළින් රු. 1,054,950.00, රු. 600,000.00 සහ රු. 80,050.00 ලෙස තක්සේරු කරන ලදී. මෙම අගයන් 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ.

2.33.4 <u>විශ්වවිද්‍යාලයේ ඉඩම් සහ මාර්ගවල වටිනාකම වෙන වෙනම ගිණුම්ගත කිරීම</u>

අභ්‍යන්තර මාර්ග සඳහා වෙනම ගිණුම්කරණ ප්‍රතිකාරයක් නොමැති බැවින් විශ්වවිද්‍යාලයේ ඉඩම් සහ මාර්ගවල වටිනාකම වෙන වෙනම ගිණුම්ගත කිරීම සහ මාර්ග සඳහා අනුගමනය කළ යුතු ක්ෂයවීම් අනුපාතය සම්බන්ධයෙන් 2023.10.02 දින පැවති 82 වැනි විගණන කමිටුවේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පැහැදිලි කිරීම් ඉල්ලා ඇත. තවද විශ්වවිද්‍යාලයට අයත් ඉඩම් සහ මාර්ගවල වටිනාකම් වෙන් වෙන්ව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රයේ සියලුම මාර්ග 2013.12.10 දින තක්සේරු වාර්තාවට ඇතුළත් කර ඇති අතර මාර්ග වෙන වෙනම අගය නොකරන බව තක්සේරු දෙපාර්තමේන්තුව 2024.02.01 දින ලිපිය මගින් දන්වා ඇත.

2.33.5 <u>කුලී ආදායම</u>

විශ්වවිද්‍යාලය එහි දේපල කුලියට දීම මගින් කුලී ආදායම උපයා ගෙන ඇත. මෙම දේපල කුලී උපයා ගැනීමට හෝ ප්‍රාග්ධන අගය කිරීම සඳහා තබා නොගන්නා බැවින් ආයෝජන දේපල ලෙස වර්ගීකරණය කර නොමැත. මෙම දේපල මූල්‍ය

තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ, පිරියත සහ උපකරණ ලෙසද වර්ග කර ඇත.

2.33.6 අසම්භාව්‍ය බැරකම්

අසම්භාව්‍ය බැරකම්වලට 2023 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයට එරෙහිව ගොනු කර ඇති නීතිකෘත්‍ය පහක් (05) ඇතුළත් වේ. වන්දි මුදල විශ්වසනීය ලෙස තක්සේරු කළ නොහැකි බැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත. නෛතික ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 01 | ශ්‍රේෂ්ඨාධිකරණය SC/FR 216/2020 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිදුවූ නවක වදයක් සම්බන්ධයෙන් ජේ.ඒ ශර්මිලා ප්‍රියදර්ශනී සිල්වා සහ ජේ.ඒ පසිඳු හිරුෂාන් සිල්වා යන අය ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත. විශ්වවිද්‍යාල වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව පෙනී නොසිටින මෙම නඩුවේ වගඋත්තරකරුවන් ලෙස සියලුම විශ්වවිද්‍යාල ඇතුළත් කිරීමට අධිකරණය තීරණය කර ඇත. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය වෙනුවෙන් පෙනී සිටීම සඳහා නීතිඥ චතුර ගල්හේන මහතාගේ සේවය ලබා ගැනීමට ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය තීරණය කර ඇත. මෙම නඩුව විභාග වෙමින් පවතී. |
| 02 | කුලියාපිටිය දිසා අධිකරණය | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩී.එන්. ලියනගේ මහතා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ඇතුළු 24 දෙනෙකු වගඋත්තරකරුවන් කරමින් 2019.02.01 දින කුලියාපිටිය දිසා අධිකරණයේ මෙම නඩුව ගොනු කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුව විශ්වවිද්‍යාලය වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටින අතර මෙම නඩුව විභාග වෙමින් පවතී. |
| 03 | අභියාචනාධිකරණය-CA රිට් 380/2023 | හිටපු සහකාර අභ්‍යන්තර විගණක එස්.යූ. අමරසිංහ මහත්මිය විසින් විශ්වවිද්‍යාලය ඇතුළු 25 දෙනෙකු වගඋත්තරකරුවන් කරමින් අභියාචනාධිකරණයේ මෙම නඩුව පවරා ඇත. විශ්වවිද්‍යාලයේ සහකාර අභ්‍යන්තර විගණක තනතුරෙන් ඉවත් කර ඇය තනතුර අතහැර ගියාසේ සලකා කටයුතු කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් ගෙන ඇති තීරණය අත්හිටුවීමට ඇය විසින් ඉල්ලා ඇති අතර මෙම නඩුව විභාග වෙමින් පවතී. |
| 04 | විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ අභියාචනය අංක 1082 | සහාය මහාචාර්ය වී.ජී.ටී.එන් විධංගම විසින් මහාචාර්ය තනතුර සඳහා වන මෙම අයදුම්පත්‍රය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලෙස ඉල්ලමින් වයඹ විශ්වවිද්‍යාලය වගඋත්තරකරුවෙකු කරමින් විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ මෙම අභියාචනය ගොනු කර ඇත. නඩුව විභාග වෙමින් පවතී. |
| 05 | විනිශ්චය -ගරු විනිශ්චයකාර තිලක් කොලොන්නේ මහතා | මාකඳුර පරිශ්‍රයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා යෝජිත ගොඩනැගිල්ල සැලසුම් කිරීම සහ ඉදිකිරීම සම්බන්ධ ආරවුලක් සම්බන්ධයෙන් සී.සී.ඩී. කන්ස්ට්‍රක්ෂන්ස් ආයතනය විසින් මෙම නඩුව ගොනු කර ඇත. විශ්වවිද්‍යාලය වෙනුවෙන් විනිශ්චය මණ්ඩලය නියෝජනය කරමින් නීතිපති දෙපාර්තමේන්තුව පෙනී සිටී. මෙම නඩුව විභාග වෙමින් පවතී. |

2.33.7 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

පාලක සභාවේ සාමාජිකයින් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කළමනාකාරිත්වය වේ. විශ්වවිද්‍යාලයේ පාලක සභාව උපකුලපතිවරයා, සෑම පීඨයකම පීඨාධිපතිවරයා, සෙනෙට් සභාව විසින් එහි සාමාජිකයන් අතරින් තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයන්ගෙන් සමන්විත වේ. උපකුලපතිවරයා පාලක සභාවේ සභාපති වන අතර උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන් සහ සනාතන සභාවට නම් කරන ලද අය රජයෙන් වැටුප් ලබන විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන සේවකයින් වේ. පාලක සභාවේ සාමාජිකයින්ට විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලද කිසිදු කොන්ත්‍රාත්තුවක් සඳහා ඍජු හෝ වක්‍ර සම්බන්ධතාවයක් නොමැති අතර, සභා රැස්වීම් සහ විවිධ කමිටු රැස්වීම්වලට පැමිණීම සඳහා බාහිර කවුන්සිල සාමාජිකයින්ට කරන ලද ගෙවීම් හැර වෙනත් කිසිදු ගනුදෙනුවක් විශ්වවිද්‍යාලය විසින් පාලක සභා සාමාජිකයින් සමඟ සිදු කර නොමැත.

2023 වසර තුළදී උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන් සහ සනාතන සභාවේ නම් කරන ලද සාමාජිකයින් දෙදෙනකු සඳහා රුපියල් 51,193,602.30 ක පාරිශ්‍රමයක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා ඇත.

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කළමනාකාර පුද්ගලයන් වන ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී සහ පුස්තකාලයාධිපතිවරයාට 2023 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයෙන් පාරිශ්‍රමය වශයෙන් රුපියල් 14,263,686.20ක් ගෙවා ඇත.

අනෙකුත් සභා සාමාජිකයින්ට 2023 වර්ෂය තුළ රැස්වීම් සඳහා රැස්වීම් දීමනා ලෙස රු.654,000.00 ගෙවා ඇත.

2.33.8 විලම්භීත බැරකම්

බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු මුදල් සහ ස්වයං මූල්‍ය පාඨමාලා හදාරන සිසුන්ගෙන් කල්තියා ලද පාඨමාලා ගාස්තු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විලම්භීත බැරකම් ලෙස හඳුනාගෙන ඇත. බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් ලැබිය යුතු විලම්බිත ආදායම වාර්තාකරණ කාලසීමාව තුළ අයකර ගැනීමේ ප්‍රමාණයට බැඳුම්කර උල්ලංඝන අරමුදල් ගිණුමේ හඳුනාගනු ලබන අතර ස්වයං මූල්‍ය පාඨමාලා වලින් ලැබෙන විලම්බිත ආදායම කාල වකවානු පදනමට පාඨමාලාවෙන් ලැබෙන ආදායම ලෙස හඳුනාගැනේ. 2024.01.01 සිට 2024.02.20 දක්වා කාලය තුළ බැඳුම්කර උල්ලංඝනය කරන්නන්ගෙන් රුපියල් 3,528,554.67ක් අයකරගෙන ඇත.

2.33.9 දේපල, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම

(අ) තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013.12.31 දිනට ඉඩම් ප්‍රත්‍යාගණනය කර ඇත. කුලියාපිටිය පරිශ්‍රයේ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම රු. 285,750,000 ක් වන අතර මාකඳුර පරිශ්‍රයේ එම වටිනාකම රුපියල් 40,000,000 කි.

(ආ) 2013.12.31 දක්වා ඉදිකරන ලද ගොඩනැගිලි 2016.12.31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලදී.

(ඇ) ලංකා ඔටෝමොබයිල් සංගමය විසින් 2021.12.31 දිනට මෝටර් රථ ප්‍රත්‍යාගණනය කරන ලදී.

(ඈ) ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන සහ පුස්තකාල පොත් සහ වාර සඟරා හැර අනෙකුත් කාණ්ඩ අභ්‍යන්තරව පත් කරන ලද කමිටු මගින් 2021.12.31 දිනට ප්‍රත්‍යාගණනය කරන ලදී.

අවසන් කරන ලද තක්සේරු වාර්තාව මත පදනම්ව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට අදාළ ගැලපීම් සිදු කරන ලදී.

### 2.33.10 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය විසින් ලබාගෙන ඇති උප ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය

#### 2.33.10.1 උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් කඩිනම් කිරීම (AHEAD)

ශ්‍රී ලංකාවට පහළ මධ්‍යම ආදායම් ලබන රටක සිට ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වීමට ඇති සබ්‍යතාවය සඳහා උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධනය ඉතා වැදගත් කරුණකි. මෙම අවශ්‍යතාවය හඳුනාගනිමින්, ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව ලෝක බැංකු ආධාර යටතේ "උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) මෙහෙයුම" නමින් ව්‍යාපෘතියක් හරහා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට සහාය ලබා දීමට එකඟ වී ඇත. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය සංරචක දෙකකින් සංවිධානය කර ඇත. පළමුවැන්න ජාතික උසස් අධ්‍යාපන සංවර්ධන වැඩසටහනට සහාය වන වැඩසටහන් සංරචකයකි. දෙවැන්න නම් පද්ධති ශක්තිමත් කිරීම, ධාරිතා ගොඩනැගීම සහ තාක්ෂණික ආධාරක සංරචකයකි. මෙමගින් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට සහ අධීක්ෂණය සහ ඇගයීම, ප්‍රතිපත්ති විශ්ලේෂණය, වැඩසටහන් සම්බන්ධීකරණය සහ සන්නිවේදනය මගින් AHEAD වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රජයට සහාය වෙයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය අධ්‍යාපන අමාත්‍යාංශය වේ. අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාල අතර සියලුම ඉදිරි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ සහාය දක්වන "මෙහෙයුම් අධීක්ෂණ සහ සහාය කණ්ඩායම"ක් ඇත.

AHEAD ව්‍යාපෘතියේ ප්‍රතිඵල ක්ෂෙත්‍ර තුනක් ඇත.

ප්‍රතිඵල ක්ෂෙත්‍රය 1: ආර්ථික සංවර්ධනය සඳහා ප්‍රමුඛතා විෂයයන් සඳහා බඳවා ගැනීම් වැඩි කිරීම

ප්‍රතිඵල ක්ෂෙත්‍රය 2: උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම

ප්‍රතිඵල ක්ෂෙත්‍රය 3: පර්යේෂණ, සංවර්ධනය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම

ප්‍රතිඵල ක්ෂෙත්‍ර 2 සහ ප්‍රතිඵල ක්ෂෙත්‍ර 3 යටතේ ප්‍රදානයන් තරඟකාරී පදනම යටතේ ප්‍රදානය කෙරේ. විශ්වවිද්‍යාලවල ඒකකවලට (පීඨ සහ අධ්‍යයනාංශ සහ පර්යේෂණ කණ්ඩායම්) යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබිණි. පසුගිය වසර කිහිපය තුළ, මෙහෙයුම් අධීක්ෂණ සහ සහාය කණ්ඩායම විසින් එවැනි ප්‍රදාන පිරිනැමීම සඳහා යෝජනා කැඳවූ අතර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය වෙත ලැබුණු යාවත්කාලීන කළ ප්‍රදාන ලැයිස්තුව පහත වගුවේ දක්වා ඇත.

| ප්‍රදාන වර්ගය | ප්‍රදානලාභී | අනුමත ප්‍රදානය (රු.) | 2023.12.31 දිනට වියදම් (රු.) | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය ව්‍යාප්ති වටය 1,2 සහ 3 | වෛද්‍ය පීඨය | මිලියන 238.38 | මිලියන 238.34 | නිමකරන ලදී |
| | තාක්ෂණ පීඨය | මිලියන 140 | මිලියන 139.85 | නිමකරන ලදී |
| | පශු සම්පත්,ධීවර සහ පෝෂණ පීඨය | මිලියන 21.94 | මිලියන 21 .94 | නිමකරන ලදී |
| සිවිල් ඉදිකිරීම් | වෛද්‍ය පීඨය | මිලියන 252 | මිලියන 252 | නිමකරන ලදී |
| | තාක්ෂණ පීඨය | මිලියන 508 | මිලියන 493.40 | ක්‍රියාත්මකවෙමින් පවතී |
| ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම - පීඨ සංවර්ධන වැඩසටහන | පශු සම්පත්,ධීවර සහ පෝෂණ පීඨය - 1වැනි වටය | මිලියන 120 බැගින් | මිලියන 111.66 | 2019 මැයි 27 දින ගිවිසුම අත්සන් කරනලදී-- ව්‍යාපෘතිය නිමකර ඇත |
| | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය - 1වැනි වටය | | මිලියන 119.99 | 2019 මැයි 17 දින ගිවිසුම අත්සන් කරනලදී-- ව්‍යාපෘතිය නිමකර ඇත |
| | කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය 2වන වටය | | මිලියන 119.83 | 2019 ඔක්තෝම්බර් 08 දින ගිවිසුම අත්සන් කරනලදී-- ව්‍යාපෘතිය නිමකර ඇත |
| ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම - අධ්‍යයනාංශ සංවර්ධන වැඩසටහන | ව්‍යවහාරික පෝෂණ අධ්‍යයනාංශය | මිලියන 18 බැගින් | මිලියන 17.46 | 2019 අගෝස්තු 28 දින ගිවිසුම අත්සන් කරනලදී- ව්‍යාපෘතිය නිමකර ඇත |
| | ජලජීවී වගා හා ධීවර අධ්‍යයනාංශය | | මිලියන 14.86 | 2019 අගෝස්තු 29 දින ගිවිසුම අත්සන් කරනලදී- ව්‍යාපෘතිය නිමකර ඇත |
| ආචාර්ය උපාධි සඳහා ශිෂ්‍යත්ව | ශිෂ්‍යත්ව ලාභීන් 5යි (පූර්ණ) ශිෂ්‍යත්ව ලාභීන් 1යි | මිලියන 45.24 | මිලියන 45.24 | ව්‍යාපෘතිය නිමකර ඇත |
| විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා ඒකකය | බිස්නස් ඉන්කියුබේෂන් සෙන්ටර් | මිලියන 20 | මිලියන 18.74 | 2018 ජූලි 17 දින ගිවිසුම අත්සන් කරනලදී ක්‍රියාත්මකවෙමින් පවතී |
| නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම | ආහාර විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයනාංශය පශු සම්පත්,ධීවර සහ පෝෂණ පීඨය | මිලියන 40 | මිලියන 40 | 2018 ඔක්තෝම්බර් 13 දින ගිවිසුම අත්සන් කරනලදී- ව්‍යාපෘතිය නිමකර ඇත |
| සංවර්ධනාභිමුඛ පර්යේෂණ | ආහාර විද්‍යා තාක්ෂණ අධ්‍යනාංශය | මිලියන 40 | මිලියන 39.04 | 2019 මාර්තු 29 දින ගිවිසුම අත්සන් කරනලදී- ව්‍යාපෘතිය නිමකර ඇත |
| | ජලජීවී වගා හා ධීවර අධ්‍යයනාංශය | මිලියන 40 | මිලියන 39.60 | 2019 මැයි 21 දින ගිවිසුම අත්සන් කරනලදී - ව්‍යාපෘතිය නිමකර ඇත |
| | පශු සම්පත් සහ කුරුළු විද්‍යා අධ්‍යයනාංශය | මිලියන 40 | මිලියන 39.99 | 2019 මැයි 29 දින ගිවිසුම අත්සන් කරනලදී - ව්‍යාපෘතිය නිමකර ඇත |
| | කෘෂිකර්ම සහ වැවිලි කළමනාකරණ පීඨය | මිලියන 40 | මිලියන 39.99 | 2019 අප්‍රේල් 2 දින ගිවිසුම අත්සන් කරනලදී - ව්‍යාපෘතිය නිමකර ඇත |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යවහාරික විද්‍යා පීඨය | මිලියන 10 | මිලියන 7.40 | 2019 නොවැම්බර් 1 දින ගිවිසුම අත්සන් කරනලදී - ව්‍යාපෘතිය නිමකර ඇත |
| අමතර සිසුන් බඳවා ගැනීම- සිවිල් වැඩ සහ උපකරණ | | 123.11 මිලියන | මිලියන 118.15 | ක්‍රියාත්මකවෙමින් පවතී |
| මෙ.තා.ලේ. වියදම් සහ කාර්යමණ්ඩල වැටුප් | | | මිලියන 21.17 | |
| **එකතුව** | | **මිලියන 1,954.67** | **මිලියන 1,938.65** | |

පීඨ, අධ්‍යයනාංශ සහ අනෙකුත් ඒකකවලට ඔවුන්ගේ උප ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, විශේෂයෙන් මූල්‍ය හා ප්‍රසම්පාදන කටයුතු හැසිරවීමට සහ ඔවුන්ගේ ව්‍යාපෘති කාලානුරූපීව ක්‍රියාත්මක කිරීමේදී ප්‍රචාරණය කිරීමට සහාය වීම පිණිස විශ්වවිද්‍යාලය විසින් මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය පිහිටුවන ලදී. මෙ.තා.ලේ. කාර්යාලය (OTS) පූර්ණ කාලීන සහ අර්ධ කාලීන කාර්ය මණ්ඩලය යන දෙඅංශයෙන්ම සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් ක්‍රියාත්මක වේ.

2023.12.31 දිනට මෙහෙයුම් සහ අධීක්ෂණ සහාය කණ්ඩායම ලබාදෙන ලද

මුළු අරමුදල් ප්‍රමාණය - රු.මිලි.1,939.97

2023.12.31 දිනට මුළු වියදම - රු.මිලි.1,938.65

2023.12.31 දිනට ශේෂය - රු.මිලි. 1.32

- STEM - විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ ගණිතය
- ElTA ElSE - ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම
- UBL-විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා ඒකකය.
- ICE - නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම.
- DOR - සංවර්ධනාභිමුඛ පර්යේෂණ.

(*) එක් ශාස්ත්‍රඥයෙකු විසින් වැඩසටහන නිම නොකළ බැවින් වියදම් සඳහා ඇතුළත් වන්නේ ශාස්ත්‍රඥයින් 06 දෙනෙකු පමණි. එක් ශාස්ත්‍රඥයෙකුගේ ජීවන වියදම් දීමනාව (මිලියන 0.75) OMST විසින් ගෙවන ලද නමුත් එය වියදමට ඇතුළත් වේ.

### 2.33.10.2 <u>වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය</u>

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පහසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට මෙන්ම විශ්ව විද්‍යාලයට ආසන්නතම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ ජීවනෝපාය සවිබලගැන්වීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. කුලියාපිටිය පරිශ්‍රය සහ මාකඳුර පරිශ්‍රය ආවරණය වන පරිදි ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය සඳහා දැනුම පදනම් කරගත් ස්වයංසාධිත සහ තිරසාර ප්‍රජා අන්තර් ක්‍රියාකාරී පද්ධතියක් ස්ථාපිත කිරීම ඉහත ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි. මෙම ව්‍යාපෘතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරයි.

සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල (SFD) ඉහත ව්‍යාපෘතිය සඳහා සෞදි අරාබි රියාල් මිලියන 105 (ඇ.ඩො. මිලියන 28) ක සහනදායී ණයක් ලබා දීමට එකඟ වී ඇති අතර, මෙයට වසරකට 2% ක් ලෙස සහ වසර 5 ක සහන කාලයක් ඇතුළුව වසර 25 ක ණය වාරිකයක් ඇතුළත් වේ. 2017 ඔක්තෝම්බර් 24 වන දින සෞදි සංවර්ධන සඳහා සෞදි අරමුදල හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර ගිවිසුම අත්සන් කරන ලදී. ගිවිසුමට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට

මූලික ව්‍යාපෘති කාලය වසර 3 කි. ව්‍යාපෘතියේ කාලසීමාව 2025.05.31 දක්වා දීර්ඝ කර ඇත. (වගකීම් කාලයක් සහිතව)

ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය

| | මූ.ඇ.පිරි-රු. මිලියන | | | වියදම - රු. මිලියන | | | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | කුලියාපිටිය | මාකඳුර | එකතුව | කුලියාපිටිය | මාකඳුර | එකතුව | | කුලියාපිටිය | මාකඳුර |
| උපදේශන | 62.41 | 50.78 | 113.19 | 37.60 | 40.06 | 77.66 | 68.62% | 85.00% | 85.00% |
| මිල ඉහල යාම් සහිත ඉදිකිරීම් | 1883.52 | 1924.50 | 3808.02 | 1725.22 | 1756.41 | 3481.63 | 91.43% | 82.66% | 82.38% |
| මිල ඉහල යාම් රහිත ඉදිකිරීම් | | | | 1001.90 | 1116.46 | 2118.36 | 55.63% | | |
| උපකරණ (පවතින ගොඩනැගිලි) | 310.26 | | 340.26 | 157.17 | 44.28 | 201.45 | 59.20% | 90.00% | |
| වෙනත් (වාහන) | 30.00 | | | - | - | - | - | - | |
| එකතුව (මිල ඉහල යාම් සහිත) | - | - | 4261.46 | 1919.99 | 1840.75 | 3760.75 | 88.25% | 83.05% | |

# විගණකාධිපති වාර්තාව

# 2023

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } NWCG/KR/D/WUSL/2023/FA/1    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024 මැයි 22 දින

උපකුලපති,

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත්, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ නව ගොඩනැගිල්ල ජාලගත කිරීම හා අන්තර්ජාල පහසුකම් සැපයීම වෙනුවෙන් 2023 වර්ෂය තුළදී AHEAD ව්‍යාපෘතියෙන් දරා තිබුණු රු.3,061.415 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා දේපල පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද ජාල පද්ධතිය ස්ථාපිත කිරීමේ ගාස්තු හා කාර්යාල උපකරණ සඳහා බෙදාහැරීමේ පිරිවැය ලෙස AHEAD ව්‍යාපෘතිය මඟින් වැය කරන ලද රු.2,552,370 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. තවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 19 වගන්තිය අනුව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ඉදි කර ඇති මාර්ග පද්ධති, මළ ප්‍රවාහන පද්ධති හා සන්නිවේදන පද්ධති අගය කර දේපල පිරියත යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම්වල වෙනස්වීම් සෑම වසර තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ හැකි වුවද විශ්වවිද්‍යාලය සතු ඉඩම් 2013 වර්ෂයේදී රු.325,750,000 කට ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු වර්ෂ 10 ක්ද, ගොඩනැගිලි 2016 වර්ෂයේදී රු.3,523,975,000 කට ප්‍රත්‍යාගණනයෙන් පසු වර්ෂ 07 ක්ද ගතවී තිබුණද ඒවා නැවත ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී බාහිර පාඨමාලාවන්ගෙන් ලැබී තිබූ රු.11,571,562 ක ආදායම තුළ පෙර වර්ෂයන්ට අදාළව ලැබී තිබූ රු.1,040,275 ක් හා ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ රු.3,977,284 ක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු. 5,017,559ක් වැඩියෙන්ද සමුච්චිත අරමුදල රු.1,040,275 කින් හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරි වර්ෂ වෙනුවෙන් ලැබීම් රු.3,977,284 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.199,345,754 ක් මූල්‍ය ප්‍රකාශන තුළ හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායම ලෙස හඳුනා ගැනීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2023 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර ගිවිසුම් කඩ කළ නිලධාරින්ගෙන් අය විය යුතු රු.21,475,657 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයතුළදී සැපයුම්කරුවෙකුගෙන් අයකළ රු.1.898,397ක ප්‍රමාද ගාස්තුව විශ්වවිද්‍යාලයේ ආදායමක් ලෙස හඳුනා නොගෙන ජංගම වගකීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(උ) විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගේ තනතුර උසස් කිරීම හේතුවෙන් හිඟ වැටුප් ගෙවීමේදී සිදු වී තිබූ දෝෂ නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට ගැලපිය යුතු රු.818,886ක් වර්ෂයේ වියදමෙන් අඩු කිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්වල බැර ශේෂ පැවතිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ගිණුම් 05 කට අදාළව එකතුව රු.15,229,232 ක් වූ අසාමාන්‍ය හර ශේෂ දීර්ඝ කාලයක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාලව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ ඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලයේ පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති, රීති / විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛයේ 4.5 ඡේදය | ස්වයං මූල්‍ය පාඨමාලා සඳහා වන අයවැය ලාභ නොලබන පදනම මත පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද විශ්වවිද්‍යාලය විසින් නිම වී තිබූ ස්වයං මූල්‍ය පාඨමාලාවලින් දළ වශයෙන් රු 184,522,135 ක අතිරික්තයක් ලබා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2012 සිට 2019 කාල පරිච්ඡේදය තුළ වැඩ අවසන් කර ඇති කොන්ත්‍රාත් 12 කට අදාළ රැඳවුම් මුදල් රු.49,374,509 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 1.2.1, 2.14.1 නියමයන්ට හා 2020 මාර්තු 25 දිනැති අතිරේක 35ට (Supplement 35) පටහැනිව මුද්‍රා තැබීමකින් තොරව අතින් රැගෙන එන මිල ගණන් ප්‍රසම්පාදන කමිටුවට යොමු කර 2023 වර්ෂයේ ජනවාරි සිට 2023 ජුනි 13 දක්වා සපයන ලද භාණ්ඩ සඳහා රු. 2,448,326 ක් ගෙවීම් කර තිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) වෛද්‍ය පීඨයේ ඉගැන්වීම් කටයුතු හා ප්‍රායෝගික පුහුණුවීම් කටයුතුවලදී අත්‍යාවශ්‍ය තනතුරු වන අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සහ තාක්ෂණික නිලධාරි හා රසායනාගාර සහයක තනතුරුවල අනුමත සංඛ්‍යාවෙන් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් 2023 දෙසැම්බර් 06 දිනට පුරප්පාඩු වී පැවතුණි.

(ආ) ලබුයාය වෛද්‍ය පීඨ භූමියේ ඉදි කර 2020 වර්ෂයේ ගිණුම්ගත කර තිබුණු Conference Hall Building සහ Community Center ගොඩනැගිලි විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 06 දින වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කර ගිවිසුම් කඩ කර වසර 01ත් 20ත් අතර කාලයක් ගත වී තිබුණු ආචාර්යවරු 08 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට අය විය යුතු බැඳුම්කර වටිනාකම රු.53,772,566 ක් විය.

(ඈ) 1999 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ මාකදුර පරිශ්‍රය පවත්වා ගෙන යනු ලබන අක්කර 22 ක ඉඩම් නීත්‍යානුකූලව විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන නොතිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණු එම ඉඩම්වල තක්සේරු වටිනාකම රු.40,000,000 ක් විය. 2023 දෙසැම්බර් 31 දිනවන විට ඉඩම් සඳහා භුක්තිය භාරදීමේ සහතිකයක් හෝ (Vesting Certificate) ලබා නොගෙන මාකදුර පරිශ්‍රයේ වටිනාකම රු.2,973,247,723 ක් වූ ගොඩනැගිලි ඉදිකර තිබුණි.

(ඉ) පර්චස් 711 ක් පමණ වූ කුඹුරු ඉඩම් 08 ක් පවරා ගැනීම සඳහා රු.1,013,750 ක අත්තිකාරම් මුදලක් හා පොල් පර්යේෂණ මණ්ඩලයට අයත් අක්කර 05 ක ඉඩම පවරා ගැනීම සඳහා රු.මිලියන 10 ක මුදලක් පිළිවෙලින් 2013 වර්ෂයේ පන්නල ප්‍රාදේශීය ලේකම් වෙත හා 2013 හා 2014 වර්ෂවල පොල් පර්යේෂණ මණ්ඩලය වෙත ගෙවා වසර 10ක් පමණ ගතවී තිබුණද එම ඉඩම් විගණිත දිනය වූ 2024 අප්‍රේල් 16 දින වන විටත් විශ්වවිද්‍යාලය වෙත පවරා ගෙන නොතිබුණි. එහෙත් කුඹුරු ඉඩම් 08න් ඉඩම් කැබලි 03 ක් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය නොවන බව විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් 2022 දෙසැම්බර් 22 දිනැති ලිපිය මඟින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ නව ගොඩනැගිල්ල ජාලගත කිරීම හා අන්තර්ජාල පහසුකම් සැපයීම ජාල පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් දරා තිබුණු වියදම් පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. (රු. 3,061,415/-)**

කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය මඟින් ලබා දුන් ඉන්වෙන්ට්‍රි සහතික අනුව මෙම වියදම් පුනරාවර්තන ස්වරූපයේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි තවදුරටත් සොයා බලා ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

**ජාල පද්ධතිය ස්ථාපිත කිරීමේ ගාස්තු හා කාර්යාල උපකරණ සඳහා බෙදා හැරීමේ පිරිවැය ලෙස AHEAD ව්‍යාපෘතිය මඟින් වැය කරන ලද රු. 2,552,370/- ක් ගිණුම්වලින් අත් හැරී තිබුණි.**

AHEAD ව්‍යාපෘතිය මඟින් ලබා දුන් ඉන්වෙන්ට්‍රි සහතික අනුව ගිණුම්ගත කර ඇත. තවදුරටත් සොයා බලා ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

**මාර්ග පද්ධති, මළ ප්‍රවාහන පද්ධති හා සන්නිවේදන පද්ධති අගය කර දේපල පිරියත යටතේ ගිණුම් ගත කර නොතිබුණි.**

විශ්වවිද්‍යාලය තුළ ඉදිකර තිබෙන මාර්ග පද්ධති විශ්වවිද්‍යාලයේ ඉඩම් වටිනාකමට එකතු කර ඇත. මළ ප්‍රවාහන පද්ධති ගොඩනැගිලි යටතේ ද සන්නිවේදන පද්ධති කාර්යාල උපකරණ යටතේ ද ගිණුම්ගත කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 19 වන වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් වත්කම් සියල්ල හඳුනාගෙන ගිණුම්ගත කර ඇත.

(ආ) ගොඩනැගිලි සඳහා ක්ෂය ප්‍රතිශතය 05% වන අතර 2016 ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලි වසර 2035 දක්වා ක්ෂය කරනු ලබයි. එසේම, මෙයට පෙර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන ලද්දේ රජයේ තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් මුදල් අයකිරීමකින් තොරව වන අතර මේ වන විට වත්කම් තක්සේරු කිරීම් සඳහා මුදල් අයකරනු ලබයි. රජය විසින් පුනරාවර්තන වියදම් වැඩි ප්‍රමාණයක් කප්පාදු කර ඇති අතර විශ්වවිද්‍යාලයේ නඩත්තු කටයුතු සඳහා ගෙවීමේදී ද ගෙවිය යුතු බිල්පත් දීර්ඝ කාලයක හිඟව පවතී. එවැනි තත්වයක් යටතේ ප්‍රත්‍යාගණන කටයුතු සඳහා වසර 03 කට හෝ 05 කට වරක් විශාල පිරිවැයක් වෙන් කිරීමේ හැකියාවක් විශ්වවිද්‍යාලය සතුව නොමැත.

(ඇ) මෙය 2024 වර්ෂයේ දී නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11, විකල්ප ගිණුම්කරණ ක්‍රමයට අනුව, 2023 වර්ෂයේ ඇස්තමේන්තු සඳහා විශ්වවිද්‍යාලය වෙත ලබා දුන් ප්‍රතිපාදන 2023 වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත. එසේ ප්‍රතිපාදන ලැබී 2023 වර්ෂයේ උපයෝජනය නොකළ ප්‍රාග්ධන ප්‍රධානයන්ගෙන් පියවිය යුතු වගකීම් ද ගිණුම්ගත කර ඇති බැවින් මුළු ප්‍රාග්ධන ප්‍රදානයම ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇත. එලෙස ගිණුම්ගත කර තිබූ වගකීම් සඳහා මේ වන විට ගෙවීම් කර ඇත.

(ඉ) **අයවිය යුතු බැඳුම්කර ගිවිසුම් මුදල්**
**එම්. පී. දසනායක මිය**
(ජෛවතාක්ෂණ අධ්‍යනාංශය, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය)

මෙම කථිකාචාර්යවරිය සිය අධ්‍යයන නිවාඩු අවසන්කර සේවයට වාර්තා කරන ලද්දේ 2023.09.25 දිනය. එනමුත් ඇය 2023.10.13 දින සිට සේවයෙන් ඉල්ලා අස්විය. ඒ අනුව ගිවිසුම කඩ කිරීම වෙනුවෙන් වූ බැඳුම්කර වටිනාකම ගණනය කර පූර්ව විගණනය කිරීමෙන් පසු නිර්දේශය අධ්‍යයන අංශය වෙත 2024.01.19 දින ලද පසු 2024.01.22 දින පැවති පාලකසභා රැස්වීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. අයවිය යුතු ගිවිසුම්ගත මුදල නීත්‍යානුකූල වනුයේ පාලක සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුව පමණි. ඒ අනුව පාලක සභා අනුමැතිය 2024.01.22 දින ලබන විට 2023 වර්ෂය සඳහා අවසන් ගිණුම් සකස්කර අවසාන බැවින් 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවිය යුතු බැඳුම්කර වටිනාකමට ඇතුළත්කළ නොහැකි වූ අතර එය 2024 වර්ෂයේ ගිණුම්වලට ඇතුළත් කරනු ලැබේ.

**ජේ.අයි.කේ. හෙට්ටිආරච්චි මිය.**
(ව්‍යවහාරික පෝෂණ විද්‍යා අධ්‍යනාංශය, පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය)

මෙම කථිකාචාර්යවරිය සිය අධ්‍යයන නිවාඩු අවසන්කර සේවයට වාර්තා කරන ලද්දේ 2023.01.17 දිනය. ඇය 2023.01.25 දින සිට බලපැවැත්වෙන පරිදි සේවයෙන් ඉල්ලා අස්විය. ඒ අනුව ඇයගේ බැඳුම්කර වටිනාකම ගණනය කර විගණනය කිරීමෙන් පසු රු.17,618,815.84 හා මාස තුනක වැටුප ලෙස රු. 228,300.00 ද වැඩියෙන් ගෙවන ලද පර්යේෂණ දීමනාව ලෙස රු. 84,130.20 ක මුදලක් වශයෙන් මුළු මුදල රු. 17,931,246.04 අයකරගත යුතු බවට 2023.01.23 දින පැවති පාලකසභා රැස්වීමේ දී අනුමත විය.

නමුත් රජයේ විගණන අංශය විසින් විගණනය කරන ලදුව ඇයගේ බැඳුම්කර වටිනාකම ගණනය කරන විට ශිෂ්‍යත්ව වටිනාකමෙහි කොටසක් අත්හැර ගණනය කර ඇති බැවින් එම වටිනාකම ද ඇතුළත්කර ගණනය කරන මෙන් උපදෙස් 2023.11.21 දින ලබාදෙන ලදී. ඒ අනුව නැවත ඇයගේ ශිෂ්‍යත්ව වටිනාකම ඇතුළත්කර ගණනය කරන ලද අතර ඒ අනුව නව බැඳුම්කර වටිනාකම ලෙස රු. 22,597,960.13 ක මුදලක් අයකරගත යුතු බවට 2024.01.22 දින පැවති පාලකසභා රැස්වීමේ දී තීරණය කරන ලදී.

2023.12.31 දින වන විට සංශෝධිත බැඳුම්කර වටිනාකම් පූර්ව විගණනයට ලක් කර නොතිබූ බැවින් ද 2024.01.22 දිනවන විට අවසන් ගිණුම් සකස්කර අවසන්ව පැවති හෙයින් ද පාලකසභාවේ අනුමැතියකින් තොරව අයවියයුතු බැඳුම්කර වටිනාකමට ඇතුළත් කිරීමට හැකියාවක් නොමැති හෙයින් ද 2023 වර්ෂයේ අයවිය යුතු බැඳුම්කර වටිනාකමට ඉහත ගණනය කිරීමේ දී ඇතිවූ වෙනස වන රු. 4,666,718.00 ක මුදල ඇතුළත් කර නොමැත. එම වටිනාකම 2024 වර්ෂයේ ගිණුම්වලට ඇතුළත් කරනු ලැබේ.

(ඊ) **සැපයුම්කරුවන්ගෙන් අය කළ ප්‍රමාද ගාස්තු**
මෙම මුදල C-037 වවුචරය මගින් 2024.02.16 දින විශ්වවිද්‍යාල ආදායමට ගෙන ඇත.

(උ) **වැටුප් ණයගැතියෝ**
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (13) අනුව, මෙම ගනුදෙනුව 2023 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ වැටුප් වියදමෙන් 0.06%ක් පමණ වන සාපේක්ෂව ප්‍රමාණාත්මක නොවන අයිතමයකි.

(ඌ) ගෙවීම් සඳහා බිල්පත් ඉදිරිපත් කළ බැවින් සහ ප්‍රාග්ධන මුදල් ශේෂයන් පැවති බැවින් මෙම ගෙවීම් සිදුකර ඇත.

**2.2.2**

**(අ)** 2023.12.31 දිනට අවසාන නොකළ ස්වයං මූල්‍ය පාඨමාලා සඳහා එදිනට ලැබූ ආදයම් සහ වියදම් අතර වෙනස මෙලෙස අතිරික්තයක් ලෙස දක්වා ඇත. මෙය සත්‍ය වශයෙන් අතිරික්තයක් නොවන අතර අවසන් නොකළ පාඨමාලා සඳහා ඉදිරියේ දි දැරීමට සිදුවන වියදම් වෙනුවෙන් අදාළ ලෙජර් ගිණුම්වල පවතින ශේෂයන් වේ.

**(ආ)** **රජයේ මුදල් රෙගුලාසි**

අවසන් බිල්පත් නිදහස් කර රැඳවුම් මුදල් නිදහස් කළ හැකි ව්‍යාපාතිවලින් මේ වන විට කොන්ත්‍රාත්කරුවන් විසින් ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇති ව්‍යාපෘතිවල බිල්පත් ඉංජිනේරු අංශය විසින් පරීක්ෂා කරමින් පවතින අතර මේ වන තෙක් රැඳවුම් මුදල් සඳහා ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර නොමැති කොන්ත්‍රාත්කරුවන් වෙත ඉල්ලීම් ලිපි ඉදිරිපත් කරන ලෙස ලිඛිතව දන්වා ඇත.

**2.2.4** දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත රු. මිලියන 05 ක් දක්වා අවම වශයෙන් මිළ ගණන් 03 ක් කැඳවා ප්‍රසම්පාදනයන් කිරීම සඳහා 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 හා ජාතික ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ 2020.03.25 දිනැති අතිරේක 35 මගින් බලය දී ඇත. ඒ අනුව, මෙම ප්‍රසම්පාදනයන් සිදු කර ඇත.

**2.3**

**(අ)** **කාර්ය මණ්ඩල පුරප්පාඩු**

සියළු බඳවා ගැනීම් නවතා දමා තිබීම හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් නතර කිරීමට සිදුව තිබුණි. නමුත් වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා පමණක් කාර්ය මණ්ඩල බඳවා ගැනීමට මෑතක දී ලබාදෙන ලද අවසරය අනුව මේ වන විට අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසුකම් ලත් අය බඳවාගෙන ඇති අතර සුදුසුකම් නොලත් අය සිටි දෙපාර්තමේන්තු සඳහා නැවත අයදුම්පත් කැඳවා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

තවද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව ඇති තාක්ෂණික නිලධාරී සහ රසායනාගාර සහායක තනතුරු සඳහා විශ්වවිද්‍යාල පද්ධතියෙන් අයදුම්පත් කැඳවා ඇති අතර ඒ සම්බන්ධව සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සඳහා වන යෝග්‍යතා පරීක්ෂණ පවත්වා ඔවුන් බඳවා ගැනීම සඳහා පාලක සභාවේ අනුමැතිය ද ලබාගෙන ඇත. ජනාධිපතිවරණය හේතුවෙන් පත්වීම් ලිපි නිකුත් කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්ගේ අනුමැතිය සඳහා යොමු කර ඇත. අනුමැතිය ලද පසු බඳවා ගැනීම් සිදු කෙරේ.

**(ආ)** **Conference Hall Building (Auditorium)**

වෛද්‍ය පීඨ ගොඩනැගිලි සංකීර්ණය නිර්මාණය කොට ඉදිකිරීමේ ප්‍රතිපත්තිය මත (Design & Build) වැඩ අවසන් කොට ඇති අතර ශ්‍රවණාගාරය මෙම ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ කර ඇත්තේ ඊට අවශ්‍ය පුටු නොමැතිව ය. ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව මේ දක්වා ශ්‍රවණාගාරයට අවශ්‍ය පුටු ලබා ගැනීමට විවිධ උත්සාහයන් දැරුව ද ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැති වීම නිසා එය අසාර්ථක විය. කෙසේවෙතත්, මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වන විදේශ ව්‍යාපෘතියක මුදලින් ශ්‍රවණාගාරයට අවශ්‍ය පුටු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.

එසේවුව ද, වෛද්‍යපීඨ සිසුන්ගේ විවිධ උත්සව කටයුතු සඳහා අපහසුතාවයන් මධ්‍යයේ වුව ද, අවශ්‍ය අවස්ථාවල දී මෙම ශ්‍රවණාගාරය භාවිතා කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**Community Center**

බාහිර ප්‍රජාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සැපයීම සඳහා පිහිටුවා ඇති ඒකකයකි. වෛද්‍ය පීඨයේ අවසන් වසර සිසුන්ගේ සායනික පුහුණුව ද මෙම ඒකකය හරහා ලබා දීමට නියමිත ය. වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඒකකය දැනට තාවකාලිකව කුරුණෑගල රෝහලෙහි ස්ථාපිත කර ඇති අතර තෙවන හා සිව්වන වසර සිසුන්ගේ සායනික පුහුණුවීම් එහිදී සිදු කරනු ලැබේ. ඉදිරියේ දී මාහචාර්ය ඒකකය කුලියාපිටිය ශික්ෂණ රෝහලේ ස්ථාපිත වීමට නියමිත බැවින් ඒ හරහා මෙම ඒකකයෙහි වැඩ කටයුතු ආරම්භ කිරීමට නියමිත ය.

තවද, පීඨයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය හිඟ වීම ද මෙම ප්‍රජා මධ්‍යස්ථානය ප්‍රයෝජනයට නොගැනීමට හේතු වී ඇති අතර අමාත්‍යාංශ අනුමැතිය ලබාගෙන ඉදිරියේ දී මෙම ඒකකය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** **<u>බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම</u>**

**(i) ඒ. එන්. කේ. පෙරේරා මිය**

මේ වනවිට ඇය විසින් ගෙවිය යුතු සම්පූර්ණ බැඳුම්කර වටිනාකම ගෙවා අවසන් කර ඇත.

**(ii) එම්. ඩී. කේ. විතාන මිය**

මේ වනවිට ඇය විසින් ගෙවිය යුතු සම්පූර්ණ බැඳුම්කර වටිනාකම ගෙවා අවසන් කර ඇත.

**(iii) ඩබ්ලිව්. එම්. පී. එම්. වික්‍රමසිංහ මිය**

2022.04.30 දින සිට සේවය හැරගියා සේ සලකන (VOP) ලද අතර ඇයගේ අනුමැතිය මත විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (රු.4,205,048.43) හා විශ්‍රාම වැටුප් අරමුදල (රු.2,476,003.08) ඇය විසින් ගෙවිය යුතු බැඳුම්කර වටිනාකමින් අයකර ඇත. තවද, ඇයගේ විශ්‍රාම පාරිතෝෂිත මුදල වන රු. 1,797,930.00 ක මුදල ද බැඳුම්කර වටිනාකමින් අය කර ඇත. එම අඩුකිරීම්වලින් පසුව ඇය විසින් ගෙවීමට ඇති මුදල රු. 3,581,244.53 කී. ඒ අනුව, ඇයගේ වාරික මුදල වනුයේ රු. 74,609.26 කී. මීට අමතරව රු. 100,000.00 බැගින් වූ මාසික වාරික 11 ක් ද මේ වන විට ගෙවා ඇත. මේ වන විට ඇය විසින් ගෙවිය යුතු රු. 12,060,226.04 ක් වූ බැඳුම්කර වටිනාකමින් රු. 9,578,981.51 ක මුදලක් ගෙවා ඇත. ඇයගේ ඉතිරි බැඳුම්කර වටිනාකම වනුයේ රු.2,481,244.53 කී. ඉහත සඳහන් රු. 213,797.00 ක වාරික වශයෙන් දක්වා ඇත්තේ මුලු ගිවිසුම් මුදල වාරික 48 කින් ගෙවා අවසන් කිරීම වෙනුවෙනි. අර්ථසාධක, විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත මුදල් අඩු කිරීමෙන් පසුව ඇයගේ සංශෝධිත වාරික මුදල වනුයේ රු. 74,609.26 කී. නමුත් ඇය විසින් මේ වනවිටත් රු. 100,000.00 ක මුදලක් මාසික වාරික ලෙස විශ්වවිද්‍යාලය වෙත ගෙවනු ලබයි.

**(iv) ආර්. පී. අයි. ආර්. සේනාරත්න මහතා**

ආර්. පී. අයි. ආර්. සේනාරත්න මහතාගේ ගිවිසුම් මුදල නැවත ගණනය කිරීමේ දී අඩුපාඩු නිවැරදි කර ඇත. එසේම ඔහුට සහ ඇපකරුවන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන ඇත. මේ වන විට ඔහුගේ විශ්‍රාම වැටුප් අරමුදලින් බැඳුම්කර වටිනාකමේ කොටසක් අය කර ගැනීමට සහ ඉතිරිය මුදලින් ගෙවා අවසන් කිරීමට ඔහු විසින් කැමැත්ත පළ කර ඇත. විශ්‍රාම වැටුප් අයදුම්පත වි.වි.ප්‍ර.කො. සභාව වෙත යොමු කර ඇත. මුදල් ලත් වහාම ගෙවිය යුතු අවසන් වටිනාකම ඔහුගෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**(v) පී. ජේ .එම්. නානායක්කාර මිය**

මේ වනවිට ඇය විසින් ගෙවිය යුතු සම්පූර්ණ බැඳුම්කර වටිනාකම ගෙවා අවසන් කර ඇත.

### (vi) ජේ. අයි. කේ. හෙට්ටිආරච්චි මිය

ජේ.අයි.කේ. හෙට්ටිආරච්චි මිය ඇයගේ බැඳුම්කර වටිනාකම ගණනය කිරීම සඳහා ඉදිරිපත් කළ ශිෂ්‍යත්ව තොරතුරු ඇතුළත් ලේඛනයේ ජීවන වියදම් දීමනාව සඳහන්ව නොතිබුණි. ඒ අනුව, එහි සඳහන්ව තිබූ ශිෂ්‍යත්ව වටිනාකම පමණක් ඇතුළත් කර බැඳුම්කර වටිනාකම ගණනය කරන ලදී. හෙට්ටිආරච්චි මිය පසුව ගුවන් ටිකට්පත් ප්‍රමාද කර ගැනීමට කරන ලද ඉල්ලීම් ලිපිය සමඟ ජීවන වියදම් දීමනාව ඇතුළත් ලිපියක් ඉදිරිපත් කර තිබූ නමුත් ඒ වන විටත් බැඳුම්කර වටිනාකම ගණනය කර අවසන්ව තිබුණි.

බැඳුම්කරය කඩ කිරීමෙන් අනතුරුව නැවත බැඳුම්කර වටිනාකම ගණනය කිරීමේ දී, ඇයට ගෙවා ඇති ශිෂ්‍යත්ව වටිනාකම පිළිබඳව මෙල්බන් විශ්වවිද්‍යාලයෙන් තහවුරුවක් ලබා ගැනීමට කටයුතු කළ නමුත් ඔවුන් කිසිදු පිළිතුරක් ලබා නොදුන් හෙයින් ශිෂ්‍යත්ව වටිනාකම පමණක් ඇතුළත් කර බැඳුම්කර වටිනාකම ගණනය කර ඇත.
ඒ අනුව ඇයගේ ශිෂ්‍යත්ව වටිනාකමට ජීවන වියදම් දීමනාව වන රු.4,441,437/- ක් ඇතුළත් කර නොතිබුණි.

මේ වන විට ඇයගේ ශිෂ්‍යත්ව වටිනාකමට එම ජීවන වියදම් දීමනාව ඇතුළත් කර වැටුප් සහිත අධ්‍යයන නිවාඩුව සඳහා වූ බැඳුම්කර වටිනාකම නැවත ගණනය කර, ඒ සඳහා 2024/01/22 දින පැවති 246 වන පාලක සභා අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එම සංශෝධිත බැඳුම්කර වටිනාකම ගෙවන ලෙස ඇය වෙත දන්වා ඇත.

### (vii) වී. පී. එන්. ප්‍රසාදි මිය

ඇයගේ බැඳුම්කර වටිනාකම වාරික වශයෙන් ගෙවාගෙන යනු ලැබේ.

### (viii) ඩබ්. පී. ඊ. ප්‍රියදර්ශනී මිය

මේ වනවිට ඇය විසින් ගෙවිය යුතු සම්පූර්ණ බැඳුම්කර වටිනාකම ගෙවා අවසන් කර ඇත.

ඒ අනුව, අයකර ගත යුතු හිඟ බැඳුම්කර වාරික වශයෙන් අයකර ගන්නා අතර, බැඳුම්කර මුදල් නොගෙවන කතිකාචාර්යවරුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.

### (ඈ) <u>අක්කර 22 ඉඩම</u>

"මහයායවත්ත" ඉඩමේ වී අලෙවි මණ්ඩලය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත පන්නල තාක්ෂණික මධ්‍යස්ථානය පිහිටි අක්කර 22 ක් පමණ වූ ඉඩම් කොටස වයඹ විශ්වවිද්‍යාලයීය මාකඳුර පරිශ්‍රය ස්ථාපිත කිරීම සඳහා බාර දී ඇත. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයට අනුබද්ධව පැවති කාලයේ දී, වයඹ පළාත් සභාවේ යෝජනාවක් පරිදි වයඹ විශ්වවිද්‍යාලයීය මාකඳුර පරිශ්‍රය පිහිටුවීම සඳහා මෙම ඉඩම ලබාගෙන ඇත. මෙම කරුණ වී අලෙවි මණ්ඩලය විසින් තහවුරු කර ඇත. අක්කර 22 ක් පමණ වූ මෙම ඉඩම් කොටස පැවරීම් සම්බන්ධ තොරතුරු පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නොමැති බව වාර්තා කර ඇත. එමෙන්ම වී අලෙවි මණ්ඩලය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ද නිසි ආකාරයේ ඉඩම් පවරා ගැනීමක් සිදු කර නොමැති බව පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත.

මෙම ඉඩම විශ්වවිද්‍යාලයට බාර දීමට පෙර 1973/1974 කාලය තුළ මහයායවත්ත ගම් පුළුල් කිරීම යටතේ රජය විසින් අත්පත් කරගෙන ඇති ඉඩමකි. ඒ අනුව මැනුම් කටයුතු සිදුකර වයඹ විශ්වවිද්‍යාලයේ රේඛීය අමාත්‍යාංශය වෙත පවරාදීමට ඉඩම අත්පත්කර ගැනීමේ අරමුණ සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අපට ද පිටපතක් සහිතව 2021.10.08 දිනැති ලිපිය මගින් ඉඩම් අමාත්‍යාංශය විසින් පන්නල ප්‍රාදේශීය ලේකම්ට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව "ගම් පුළුල් කිරීම සඳහා

ඉඩම් අත්කර ගැනීම" යන අරමුණ වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රය පුළුල් කිරීමේ දී අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම" ලෙස සංශෝධනය කිරීමට ගරු ඉඩම් අමාත්‍යතුමාගේ අනුමැතිය 2021.10.07 දිනැතිව ලබා දී ඇත.

ඒ අනුව පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ඉඩම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට පවරාදීමේ පැවරුම් පත්‍ර, පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ඉඩම් අමාත්‍යාංශය වෙත යවා ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරන ලෙස 2024-01-22 දිනැති ලිපිය මගින් ප්‍රාදේශීය ලේකම් පන්නල දැනුවත් කර ඇත.

එම ලිපියට පිළිතුරු ලෙස, ප්‍රාදේශීය ලේකම් පන්නල විසින් එවන ලද 2024-02-19 දිනැති ලිපියට අනුව අඩුපාඩු නිවැරදි කර සැකසූ සංශෝධිත වාර්තාව 2023-09-26 දිනැති ලිපිය මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවා ඇති බව දන්වා ඇත.

ඒ අනුව ඉදිරි කටයුතු, පන්නල ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරනු ඇත.

(ඉ) <u>මාකඳුර කුඹුරු ඉඩම්</u>

මෙම කුඹුරු ඉඩම් 08 වයඹ විශ්වවිද්‍යාලයට අත්කර ගැනීම සඳහා ගොවීන්ගේ එකඟත්වය මත රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වටිනාකමක් ලබාගෙන කුඹුරු ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අයදුම්පතක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ඉඩම් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

එමෙන් ම, කුඹුරු ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ මේ සඳහා 2013.04.18 දින අත්තිකාරම් මුදලක් ලෙස රු. 1,013,750.00 ක මුදලක් වයඹ විශ්වවිද්‍යාලය විසින් පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර ඇත. අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරන අවස්ථාවල දී, ඉඩම් හිමිකරුවන්ගේ විරුද්ධත්වය හේතුවෙන් ගැටළු සහගත තත්ත්වයක් පවතින බැවින් පන්නල ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් පරිදි දැනට ක්‍රියාත්මක ඉඩම් අත්පත් කාර්යය කඩිනම් කර ගැනීම සඳහා 38 (අ) අතුරු විධානය යටතේ ආඥාවක් ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මගින් ලබා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව ප්‍රගමන අනුරේඛනයේ සඳහන් A,B,C,D,E,F,G,H,J යන ඉඩම් කැබලි වයඹ විශ්වවිද්‍යාලයට පවරා ගැනීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අංක: 2287/38 හා 2022.07.08 දරණ අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

මේ සඳහා අවශ්‍ය කරන නඩත්තු, ආරක්ෂක කටයුතු සහ මානව සම්පත් අවශ්‍යතාවයන් වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් සැලකිල්ලට ගෙන මෙම ඉඩම් කොටස්වලට අදාළ ප්‍රගමන අනුරේඛනයෙහි සඳහන් A,B,C,D,E,F,G,H,J යන ඉඩම් අතරින් G,H,J යන ඉඩම් කොටස් 03 අත්කර ගැනීමේ පනතේ 39 (1) වගන්ති ප්‍රකාරව ප්‍රත්‍යාදිෂ්ය කිරීමේ නියමයට අදාළ පුවත්පත් දැන්වීම 2023-12-29 දින දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් පුවත්පත්වල පළ කර ඇත. මේ කරුණ සම්බන්ධයෙන් පන්නල ප්‍රාදේශීය ලේකම්ගෙන් වාචික විමසීමක් කරන ලද අතර, භුක්තියට බාර දීමේ කටයුතු මසක් තුළ අවසන් කළ හැකි බව ඔහු විසින් දැනුම් දෙන ලදී.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ
උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය
කුලියාපිටිය

# තිරසාර සංවර්ධන යෝජනා

## ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# තිරසාර සංවර්ධන යෝජනා - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පීඨ 06ට වසරකට සිසුන් 1500ක් පමණ ඇතුලත් කරගනු ලබයි. එසේ ම එම පීඨ මඟින් වාර්ෂිකව උපාධිධාරීන් 900ක් පමණ පිටවන අතර රටේ ආර්ථික වර්ධනයට අවශ්‍ය ශ්‍රම දායක්වය ලබා දෙන උපාධිධාරීන් පිරිසක් වයඹ විශ්වවිද්‍යාලය මඟින් බිහි කරනු ලබයි. එමඟින් ලංකාවේ දිළිඳුකම තුරන් කිරීමට අවශ්‍ය ශ්‍රම දායකත්වය ලබා දීමට විශ්වවිද්‍යාලයට හැකි වේ.

2 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ පිහිටි කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය මඟින් විවිධ පර්යේෂණ සිදු කරන අතර ඒ මඟින් විවිධ බෝග වර්ග හා ආහාර වර්ග හඳුන්වා දීම මඟින් රටේ දරිද්‍රතාව  තුරන් කිරීම සඳහා පිටුවහලක් ලබා දේ.

3 ලංකාවේ 10 වන වෛද්‍ය පීඨය ලෙස ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කරනු ලැබූ අතර වෛද්‍ය පීඨයේ දෙපාර්තමේන්තු 15ක් ඇති අතර රටේ සෞඛ්‍ය තත්වය දියුණු කිරීමට අවශ්‍ය වෛද්‍යවරුන් බිහි කිරීමට අවශ්‍ය පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සැපයීම මෙහි අරමුණයි.

4 සංවර්ධනය වන රටක් වන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දියුණු කිරීමට උසස් අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීමට තත්ව ආරක්ෂණ වැඩ සටහන් මඟින් (Quality Assurance) ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීමට  විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. එසේ ම විශ්වවිද්‍යාලයේ තත්ව ආරක්ෂණ ඒකකයක් ද (Quality Assurance Unit) පිහිටුවා ඇත. එසේ ම සිසුන්ට අවශ්‍ය
තාක්ෂණය හා රැකියා අභිමුඛ පුහුණුවට යොමු කර ඒ තුළින් හොඳ අධ්‍යාපන තත්වයක් ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ.

5 විශ්වවිද්‍යාලය මඟින් සංවිධානය කරනු ලබන සෑම කටයුත්තකදී ම ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සැමට සමාන අයිතිවාසිකම් ලැබෙන ලෙස කටයුතු කරනු ලැබේ.

6 සනීපාරක්ෂාව හා ජල පහසුකම් ලබා දීමේ දී විශ්වවිද්‍යාලය පරිභොජනය සඳහා අවශ්‍ය සියලුම ජලය නළ ළිං මාර්ගයෙන් ලබා ගන්නා අතර සිසුන්ට හා කාර්යය මණ්ඩලයේ පාවිච්චියට ගත හැකි අයුරින් ජලය පිරිපහදු කර ලබා දෙනු ලැබේ. එසේ ම මෙම ජලයේ තත්වය පිළිබඳව නිතරම පරීක්ෂා කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පවිත්‍රතා අංශය, උද්‍යාන පාලන අංශය යන සෑම අංශයක් ම සම්බන්ධ කර ගනිමින් වඩාත් හොඳ සනීපාරක්ෂ පහසුකම් සිසුන්ට හා කාර්යය මණ්ඩලයට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

7 විදුලිය හා බලශක්තිය ඉතිරිකර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- ආලෝකය අවශ්‍ය ස්ථානය සඳහා සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි බුබුළු (CFL Bulb) පමණක් භාවිත කිරීමට කටයුතු කිරීම
- සූර්ය ශක්තිය මඟින් විදුලිය ලබා ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇත
- ගොඩනැගිලි ඉදි කිරීමේදී ඇතුළට හිරුඑළිය ලැබෙන පරිදි වීදුරු ආවරණ සහිතව නිර්මාණය කිරීමට කටයුතු කර ඇත.

8 විශ්වවිද්‍යාලයේ සියලුම පාඨමාලා රැකියා අභිමුඛ පාඨමාලාවන් වන අතර සැමවිටම විරැකියාවට විසඳුමක් ලැබෙන ආකාරයේ පාඨමාලා අලුතින් ඇති කරමින් සමාලෝචනය කරමින් තිබෙන පාඨමාලා වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. එසේ ම අලුතින් ඉංජිනේරු පීඨයක් ඇති කිරීමට බලාපොරොත්තු වන අතර එමඟින් රටේ ඉංජිනේරු ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම දායකත්වය සැපයීමට බලාපොරොත්තු වේ.

9 තාක්ෂණ පීඨය විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ කළ පීඨයක් වන අතර මෙමඟින් නවෝත්පාදන කටයුතු සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ. එසේ ම ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් විශ්වවිද්‍යාලය මඟින් සංවර්ධනය කරනු ලැබේ.

10 වයඹ විශ්වවිද්‍යාලයේ BREAD Center සහ BIC යන මධ්‍යස්ථාන මඟින් නවෝත්පාදන හා නව නිෂ්පාදන වෙනුවෙන් වන දිරිමත් කිරීම් කරන අතර නව නිෂ්පදන සඳහා අවශ්‍ය වන වෙළඳපළ හඳුන්වා දීමත් සිදුකරනු ලබයි.

එමඟින් ප්‍රදේශයේ අවට ප්‍රජාවට අවශ්‍ය තාක්ෂණික හා ව්‍යාපාරික දැනුම ලබා දීමට ද කටයුතු කරනු ලබයි.

11 විශ්වවිද්‍යාලය සතු සම්පත් උපරිම ඵලදායීතාවයකින් යුතුව භාවිතා කිරීමට කටයුතු කරනු ලබන අතර ඒ සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- වෛද්‍ය පීඨයේ වරක් භාවිතා කළ ජලය පිරිසිදු කර නැවත භාවිතයට ගැනීම
- ඉවතලන ද්‍රව්‍ය දිරාපත්වන, වීදුරු, පොලිතීන් / ප්ලාස්ටික් සහ කඩදාසි වශයෙන් වෙන වෙන ම එකතුකර සුදුසු පරිදි අපහරණය කිරීම

12 විශ්වවිද්‍යාලය තම පරිශ්‍ර තුළ සැමවිටම හරිතකරණයට ලක් වූ පරිසරයක් පවත්වා ගැනීමට කටයුතු කරන අතර විශ්වවිද්‍යාලයේ උද්‍යාන පාලන අංශ මඟින් රුක් රෝපණය කිරීම්, ඒවායේ ආරක්ෂාව සහ නඩත්තු සම්බන්ධයෙන් නිතරම සැලකිල්ලක් දක්වනු ලැබේ.

13 විශ්වවිද්‍යාලය තුළ විවිධ ජතීන්ට විවිධ ආගම්වලට අයත් ශිෂ්‍යයින් හා කාර්යය මණ්ඩලය සිටින අතර සැම කටයුත්තකදී ම ජාතීන් අතර අන්නෝන්‍ය සුදහතාවය වර්ධනය වන අයුරින්

විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ. ජනවාරි 01 දින සර්ව ආගමික වැඩසටහන් පැවැත්වීම, අනෙකුත් ආගමික උත්සවවල දී සියලුදෙනා එකතුව ඒවාට අදාළ සැරසිළි, වැඩසටහන් සිදුකිරීම මඟින් අන්‍යෝන්‍ය සුහදතාවය වර්ධනය වේ.

14 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව තුළ හා විදේශීයව ඇති අධ්‍යාපන ආයතන, මූල්‍ය ආයතන සහ අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් මඟින් සම්බන්ධතාවයන් පවත්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. එය සිසුන්ට හා කාර්යය මණ්ඩලයට දෙස් විදෙස් සබඳතා ගොඩනගා ගැනීමට පිටුවහලක් වේ.